# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1757/19 - 2012 මැයි 11 වැනි සිකුරාදා - 2012.05.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 10 වන වගන්තිය යටතේ ප්‍රදානය කෙරෙන
නිදහස් කිරීමේ නියෝගය

**1. නිදහස් කිරීම් ප්‍රදානය කිරීම**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 10 (01) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව (මෙහි මින් මතුවට "කොමිෂන් සභාව" ලෙස හැඳින්වෙන) අංක 125, ග්ලෙනී වීදිය, කොළඹ 02 ලිපිනයේ පිහිටා ඇති ජේ. කේ. මාර්කටින් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (මෙහි මින් මතුවට නිදහස් කළ තැනැත්තා ලෙස හැඳින්වෙන) වෙත බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යයතාවයෙන් නිදහස් කිරීමක් මෙයින් ලබා දේ:

මීට යා කොට 1 වන ඇමුණුමේ වැඩිදුරටත් විස්තර කර ඇති මොරටුව, ලක්ෂපතිය ගාලු පාරේ අංක 340 දරන පරිශ්‍රයන් තුළ පිහිටා ඇති කේ - සෝන් වෙළඳ සංකීර්ණය මෙම නියෝගයෙහි දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, විදුලිය බෙදාහැරීම සහ සැපයීම හෝ බෙදාහැරීම හෝ සැපයීමේ සීමිත කාර්යය සඳහා.

**2. අනුමැතිය**

නිදහස් කළ තැනැත්තා 2009 අංක 20 දරන ලංකා විදුලිබල පනතේ විධිවිධානයන් ඇතුළත් ඊට පමණක් සීමා නොවූ විධිවිධානයන්ට යටත්ව විදුලිබලය සැපයීම සහ බෙදාහැරීම සිදු කිරීම පිණිස අවශ්‍යය අදාළ නීති, රෙගුලාසි සහ රීති යටතේ අවශ්‍යය සියලු අනුමැතීන් ලබා ගත යුතු ය.

**3. නිදහස් කිරීමේ කාල සීමාව**

මෙයින් ලබා දෙන නිදහස් කිරීම 2012.01.26 දින බලාත්මක වන අතර අවලංගු හෝ ඉවත් කර ගැනීම නොකළහොත්, පහතින් දක්වා ඇති නිදහස් කිරීමේ නියෝගයේ අවලංගු කිරීමේ සහ ඉවත් කර ගැනීමේ විධිවිධානයන්ට යටත්ව, 2012.01.26 දින සිට වසර පහක (05) කාලයක් බලාත්මකව පවතිනු ඇත.

**4. නිදහස් කිරීම අවලංගු කිරීම හෝ ඉවත් කර ගැනීම**

මෙම නිදහස් කිරීම පනතේ 22 වන වගන්තිය යටතේ අවලංගු කිරීම හෝ ඉවත් කර ගැනීම සිදු කළ හැකිය.

ආචාර්ය ජයතිස්ස ද කොස්තා,
සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව.


1A - G 016013 — 340 (2012/05)

*නිදහස් කිරීමේ කොන්දේසි*

1 වන කොන්දේසිය : අර්ථකථනය සහ ගොඩනැඟීම

1. ප්‍රතිවිරුද්ධ අභිමථාර්ථයක් දිස් නොවේ නම්:

(අ) කොන්දේසිවල හෝ උපලේඛනවල භාවිතා කෙරෙන පාඨ සහ ප්‍රකාශන ඒවා නීති පැනවීමක සහ ඒවා හා අදාළ වන අර්ථකථන පනත්වල තිබෙන ආකාරයට අර්ථ දැක්වේ.

(ආ) නීති පැනවීමක් සඳහා වන පරිශීලනයන් සඳහා ප්‍රාථමික සහ ආනුෂාංගික නීති සම්පාදන ඇතුළත් වන අතර, මෙම අවස්ථා දෙකෙහිදීම, මෙම නීති සම්පාදනය බලාත්මක කෙරෙන දිනට පසුව සිදු කෙරෙන කිසියම් නවීකරණයක් හෝ ඒ සම්බන්ධයෙන් වන නැවත නීති පැනවීමක් ඇතුළත් වනු ඇත.

2. පනතේ කිසියම් විධිවිධානයක කාර්යයක් සඳහා පනතේ අර්ථ දක්වා ඇති කිසියම් පාඨයක් හෝ අර්ථ දැක්වීමක්, ප්‍රතිවිරුද්ධ අභිමථාර්ථයක් උද්ගත වුවහොත් හැර, කොන්දේසිවල හෝ උපලේඛනවල භාවිතා වන අර්ථයට සමාන අර්ථ දැක්වේ.

3. කොන්දේසි සහ උපලේඛනවල, විශේෂ කර දක්වා නොමැති නම් හෝ සංදර්භය මඟින් නියම කරනු ලබන්නේ නැතිනම්:

**"අනුබද්ධ"** නිදහස් කළ පුද්ගලයෙකු සම්බන්ධයෙන්, මෙහි අදහස වනුයේ නිදහස් කළ පුද්ගලයා අයත් සමාගම හෝ නිදහස් කළ පුද්ගලයාගේ කිසියම් අනුබද්ධ ආයතනයක් හෝ කිසියම් අයිති සමාගමක අනුබද්ධ ආයතනයක් මෙයින් අදහස් වන අතර, එම එක් එක් අවස්ථාවල එය 2007 අංක 7 දරන පනතේ අර්ථය තුළට ගැනේ;

**"අනුමත"** 4, 9, 13, 16, 19, සහ 20 වන කොන්දේසිවල කාර්යභාරය සඳහා මෙහි අර්ථය වනුයේ කොමිෂන් සභාව මඟින් අනුමත ඒවා වන අතර "අනුමත" යන්නෙහි අනුරූප අර්ථයක් පවතිනු ඇත.

**"බලපත්‍රලාභියා"** 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13 වන වගන්තිය යටතේ වලංගු බලපත්‍රයක් සහිත තැනැත්තෙකු.

**"බෙදාහැරීමේ ව්‍යාපාරය"** යනු ප්‍රධාන වශයෙන් උඩිස් රැහැන්, භූගත රැහැන්, සේවා රැහැන්, ට්‍රාන්ස්ෆෝමර්, මනු සහ අනෙකුත් උපකාරක බලාගාර පිරියත සහ උපකරණ භාවිතා කරමින්, කැප කළ 33 kv ක් හෝ ඊට වඩා අඩු වෝල්ටීයතාවයක් (කලා සන්නායක අතර) සහිත බලපත්‍රකරුට අයත් සහ ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලබන සම්ප්‍රේෂණ පද්ධතියකින් හෝ නිෂ්පාදන බලාගාර හෝ වෙනත් මිලදී ගැනීමේ ස්ථානවල සිට, අවසාන පාරිභෝගිකයාගේ හෝ ලබා දීමේ ස්ථානය වෙත 33 kVක් හෝ ඊට වඩා අඩු වෝල්ටීයතාවයක් සහිත විදුලියක් මිලදී ගැනීම සඳහා කැමැත්ත දක්වන තැනැත්තන් වෙත විදුලි බලශක්තිය ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍රලාභියාගේ බලපත්‍ර සහිත ව්‍යාපාරයකි. ;

**"නිදහස් කළ තැනැත්තා"** යනු පනතේ 10 වන වගන්තිය යටතේ විදුලිබලය බෙදාහැරීම සහ සැපයීම, හෝ බෙදාහැරීම හෝ සැපයීම සඳහා බලපත්‍ර ලබා ගැනීමෙන් නිදහස් කළ තැනැත්තෙකි;

**"විදුලිබල ව්‍යාපාරය"** යනු විදුලිබලය බෙදාහැරීමෙහි හෝ සැපයීමෙහි නිරතව සිටින කිසියම් තැනැත්තෙකි;

**"පරිපාලන සමාගම"** යනු 2007 අංක 7 දරන සමාගම් පනත තුළට අයත් පරිපාලන සමාගමකි;

**"නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතිය"** යනු මෙහි 01 වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිශ්‍රය තුළ පිහිටා ඇති සම්ප්‍රේෂණ පද්ධතියේ කොටසක් සාදන විදුලි රැහැන් සහ කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව නිදහස් කළ පුද්ගලයා විසින් නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ කොටසක් ලෙස නිදහස් කළ තැනැත්තා විසින් නිශ්චිත කර දක්වන අනෙකුත් විදුලි රැහැන් හැර නිදහස් කළ තැනැත්තාගේ සියලු විදුලි රැහැන් මාර්ග වන අතර පරිශ්‍ර වෙත විදුලිය රැගෙන යාම සඳහා භාවිතා වන නිදහස් කළ පුද්ගලයාගේ කිසියම් විදුලි බලාගාරයක්, මනු, සම්ප්‍රේෂණ සහ ස්විච්චපන්න ඊට අයත් වේ;

**"නවීකරණය"** යන්නට එකතු කිරීම්, මගහැරීම්, සංශෝධන සහ ආදේශ කිරීම් ඇතුළත් වන අතර ඊට සමාන ප්‍රකාශන ඒ අනුව අර්ථ දැක්වෙනු ඇත;

**"PUCSL පනත"** යනු 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත වේ;

**"ආශ්‍රිත සමාගම"** යනු 2007 අංක 7 දරන සමාගම් පනත තුළට ගැනෙන ආශ්‍රිත සමාගමකි;

**"කරුණු දැක්වීම"** යන්නට ලිඛිතව සිදු කරන කිසියම් විරෝධතාවයක් හෝ වෙනත් කිසියම් යෝජනාවක් ඇතුළත් වේ;

**"අනුබද්ධ ආයතනය"** යන්නෙහි 2007 අංක 7 දරන සමාගම් පනත තුළ දක්වා ඇති අර්ථය ඇත, **"අනුබද්ධ ආයතන"** ඒ අනුව අර්ථ දැක්වෙනු ඇත;

**"සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා"** යනු පනතේ 13(1)(ඇ)(i)(ආ) වගන්තිය යටතේ විදුලිබලය සම්ප්‍රේෂණය කිරීම සඳහා බලපත්‍රලාභියෙකි, එසේම

**"සම්ප්‍රේෂණ පද්ධතිය"** යනු සම්ප්‍රේෂණ බලපත්‍රලාභියෙකුට අයත් සහ ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලබන සහ (සම්පූර්ණ වශයෙන් හෝ ප්‍රධාන වශයෙන්) ඉහළ අධිසැර විදුලි රැහැන් සහ විදුලි බලාගාරවලින් සමන්විත සහ උත්පාදන බලාගාරයක සිට උපපොලක් වෙත, එක් උත්පාදන බලාගාරයක සිට තවත් උත්පාදක බලාගාරයක් වෙත හෝ එක් උපපොලක සිට තවත් උපපොලක් දක්වා තොග සැපයුම් පාරිභෝගිකයින්ගේ (කිසියම් බෙදාහැරීමේ පද්ධතියක කොටසක් සකස් නොකරන එවැනි මාර්ග ඇතුළත් නොවේ) පරිශ්‍ර වෙත විදුලිය රැගෙන යාම සඳහා භාවිතා කෙරෙන සියලු ඉහළ අධි සැර විදුලි රැහැන් සහිත පද්ධතියක් වේ.

4. විශේෂ වශයෙන් විස්තර කර නොමැති නම්:

(අ) අනුපිළිවෙලින් අංකිත කොන්දේසියකට හෝ අංකිත උපලේඛනයකට වන කිසියම් මෙම නිදහස් කිරීමේ නියෝගයේ එම අංකය දරන කොන්දේසියට හෝ උපලේඛනයට අදාළ පරිශීලනයක් වේ;

(ආ) අංකිත උප වගන්තියකට වන කිසියම් පරිශීලනයක් එම පරිශීලනය පැන නඟින උපලේඛනයේ එම අංකය සහිත උප වගන්තියට අදාළ පරිශීලනයක් වේ;

(ඇ) අංකිත ඡේදයක් සඳහා වන කිසියම් පරිශීලනයක් එම පරිශීලනය උද්ගත වන කොන්දේසියේ හෝ උප වගන්තියේ එම අංකය දරන ඡේදය සඳහා වන පරිශීලනයක් වේ; සහ

එවැනි විචලතාවයක්, අතිරේකයක් හෝ ප්‍රතිස්ථාපනයක් සහ කිසියම් ගිවිසුමක් සඳහා වන කිසියම් පරිශීලනයක් සීමා කරන කිසියම් විධිවිධානයකට අගතියක් නොමැතිව, නිදහස් කිරීමේ නියෝගය (මෙම නිදහස් කිරීමේ නියෝගය හැර), සාර සංග්‍රහය හෝ වෙනත් උපකරණයක් යන්නට එවැනි ගිවිසුමක්, නිදහස් කිරීමේ නියෝගයක්, සාර සංග්‍රහයක් හෝ වරින්වර වෙනස් කරන ලද, අතිරේකව සපයන ලද හෝ ප්‍රතිස්ථාපනය කරන ලද උපකරණයක් ඇතුළත් වේ

5. කිසියම් කොටසක, කොන්දේසියක, උපලේඛනයක හෝ ඡේදයක ශීර්ෂ පාඨය හෝ මාතෘකාව එහි සම්ප්‍රයුක්තියට බලපෑමක් කරනු නොලබයි.

6. කිසියම් කාල සීමාවක් තුළ සිදු කළ යුතු බවට නිදහස් කිරීමේ නියෝගයක කිසියම් බැඳීමක් ප්‍රකාශ කෙරෙන අවස්ථාවකදී, එම නිදහස් කළ තැනැත්තා නියම කළ කාල සීමාව තුළ එම පොරොන්දුව ඉටු කිරීමට අපොහොසත් වුවහොත් එම කාල සීමාවෙන් පසුව එම පොරොන්දුව අඛණ්ඩව බන්ධනීය සහ බලාත්මක වේ (නියමිත කාල සීමාව තුළ නිදහස් කළ පුද්ගලයාට එම කටයුතු ඉටු කිරීමට නොහැකි වීමේ හේතුව මත නිදහස් කළ පුද්ගලයා සම්බන්ධයෙන් ඇති සියලු හිමිකම් සහ ප්‍රතිකර්මවලට අගතියක් නොවී.)

7. මෙම නිදහස් කිරීමේ නියෝගය සහ පනත අතර කිසියම් අනනුකූලතාවයක් ඇත්නම්, එම අනනුකූලතාවයේ ප්‍රමාණයට පනත බලාත්මක වේ. පනතේ දක්වා ඇති කොන්දේසි මඟින් එහි දක්වා ඇති කොන්දේසිවලට අමතරව නිදහස් කිරීමේ නියෝගයේ සංඝටනීය කොටස් සකස් වේ.

2 වන කොන්දේසිය : කොමිෂන් සභාව වෙත තොරතුරු ලබා දීම

1. නිදහස් කළ පුද්ගලයා විසින්, එම තොරතුරු කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කාල සීමාව තුළ නියම කරනු ලබන ආකාරයෙන් ලබා දිය යුතු අතර, කොන්දේසි අනුව හෝ පනත හෝ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත යටතේ කොමිෂන් සභාව වෙත නියම කර හෝ පවරා ඇති කාර්යයන් සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවන්හිදී එම වාර්තා ප්‍රසම්පාදනය කර ඉදිරිපත් කළ යුතුය.
2. 1 වන ඡේදයේ සාකල්‍යතාවයට අගතියක් නොවන ආකාරයෙන්, කොමිෂන් සභාව වෙත පිළියෙල කර සැපයිය යුතු ප්‍රමාණයට වඩා වැඩි, සහ වෙනස් ගිණුම් තොරතුරු ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව නියම කරනු ලැබිය හැක.
3. 1 වන ඡේදය යටතේ තොරතුරු ලබා දෙන ඉල්ලා සිටීම සඳහා වන කොමිෂන් සභාවේ බලය, මෙම නිදහස් කිරීමේ නියෝගයේ වෙනත් කිසියම් කොන්දේසියක් යටතේ හෝ අනුව හෝ, පනත, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත හෝ වෙනත් කිසියම් නීති සම්පාදනයක් යටතේ හෝ අනුව තොරතුරු ඉල්ලා සිටීමට ඇති බලයට අගතියක් සිදු නොවේ.
4. නිදහස් කිරීම ලබා ගෙන මාස එකක කාලයක් තුළ නිදහස් කළ තැනැත්තා බෙදාහැරීමේ ව්‍යාපාරය සඳහා වගකිව යුතු පුද්ගලයෙකු එම සංවිධානය තුළ පත් කළ යුතුය.
5. මෙම කොන්දේසිය තුළ:
"තොරතුරු" යන්නට කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන කිසියම් විස්තරාත්මක සහ ආකෘතියක පොත්, ලිපි ලේඛන, සටහන් ගිණුම්, ඇස්තමේන්තු, ප්‍රතිලබ්ධි හෝ වාර්තා (කොමිෂන් සභාවේ ඉල්ලීම අනුව විශේෂයෙන්ම පිළියෙල කරන ලද හෝ එසේ නොවන) ඇතුළත් වේ.

3 වන කොන්දේසිය : කොමිෂන් සභාවේ තීරණ, නියෝග සහ පරිසමාප්තීන්

1. නිදහස් කිරීමේ නියෝගය අනුව කොමිෂන් සභාව විසින් සාදන ලද ඕනෑම තීන්දු, නියෝග, විධාන සහ පරිසමාප්තීන්වලට නිදහස් කළ පුද්ගලයා අවනත විය යුතුය.

2. එම තීන්දු, නියෝග, විධාන සහ පරිසමාප්තීන් හා අදාළ ගාස්තු සඳහා නිදහස් කළ තැනැත්තා වගකිව යුතුය.

3. කොමිෂන් සභාව විසින් සාදන ලද කිසියම් නියෝගයක් හෝ විධානයක් හා අනුකූල වීම සඳහා නිදහස් කළ තැනැත්තා විසින් කොමිෂන් සභාවට, වෙනත් කිසියම් බලධාරියෙකුට හෝ කොමිෂන් සභාවේ නියෝගය තුළ නිශ්චිතව දක්වනු ලබන තැනැත්තෙකු විසින් කොමිෂන් සභාවට අවශ්‍ය අවස්ථාවන්හිදී එහි දේපළ වෙත පිවිසීමට සහ පාලනය කිරීමට ඉඩ ලබා දිය යුතුය.

4 වන කොන්දේසිය : තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවලට අනුකූල වීම

1. කොමිෂන් සභාවේ ඉල්ලීම අනුව, නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව විසින් සුදුසු බවට සලකනු ලබන කිසියම් විදුලිබල සමාගමක් විමසා කොමිෂන් සභාව විසින් වරින් වර නියම කරනු ලබන එවැනි තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ සංවර්ධනය කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය.

2. 1 වන ඡේදය අනුව සංවර්ධනය කරන ලද කිසියම් තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ ඒවා ක්‍රියාත්මක කිරීමට පෙර අනුමත කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

3. අදාළ සාර සංග්‍රහයේ දක්වා ඇති නවීකරණ ක්‍රියාවලිය අනුව කොමිෂන් සභාව වෙත සිය යෝජනා අදාළ අවස්ථාවේදී දැනුම් දීම මඟින් බලාත්මකව ඇති සාර සංග්‍රහයකට නවීකරණ යෝජනා ඉදිරිපත් කිරීමට නිදහස් කළ තැනැත්තාට පුළුවන.

4. මෙම කොන්දේසිය අනුව නිදහස් කළ තැනැත්තා විසින් සංවර්ධනය කර ක්‍රියාත්මක කරන ලද සියලු අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවල පිටපතක් නිදහස් කළ තැනැත්තා පහත අයවළුන් වෙත ලබා දීම හෝ යැවීම සිදු කළ යුතුයඃ

(අ) කොමිෂන් සභාව; සහ

(ආ) එය ඉල්ලා සිටින කිසියම් තැනැත්තෙකු වෙත.

5. නිදහස් කළ තැනැත්තා 4 (ආ) ඡේදය අනුව ලබා දුන් හෝ යවන ලද පිටපතක් සඳහා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝගවල මෙම කොන්දේසිය සඳහා එම අවස්ථාව අනුව නිශ්චිතව කර දක්වා ඇති මුදල නොඉක්මවන ගාස්තුවක් අය කළ හැකිය. නිදහස් කළ තැනැත්තා විසින් ඊට සුදුසු ලෙසට එහි නිශ්චිතව දක්වා ඇති ඕනෑම අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවල විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය.

6. අදාළ අවස්ථාවන්හි කොමිෂන් සභාව විසින් සුදුසු බවට සලකනු ලබන විදුලිබල සමාගම් වෙතින් විමසා, නිදහස් කළ තැනැත්තා 6 වන ඡේදය යටතේ එම නියෝගවල නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවලින් කොටසක් හෝ කොටස් සම්බන්ධයෙන් දක්වා ඇති එහි බැඳීම්වලින් නිදහස් කරමින් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන එම නියමයන් හා කොන්දේසිවලට යටත්ව කොමිෂන් සභාව විසින් නියෝග නිකුත් කරනු ඇත.

7. කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ ලැබෙන තෙක්, නිදහස් කළ තැනැත්තා සියලු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දැනට තිබෙන තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවලට අනුකූල විය යුතුය.

5 වන කොන්දේසිය : අනෙකුත් ගිවිසුම්

1. නිදහස් කළ තැනැත්තා, අදාළ බලපත්‍රලාභීන් සමඟ අයක්‍රම සහ සම්බන්ධතා ගිවිසුම් ඇතුළුව කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන අනෙක් තැනැත්තන් සමඟ ගිවිසුම්වලට එළඹිය යුතුය.

2. කොමිෂන් සභාව විසින් නිදහස් කළ තැනැත්තා එළඹිය යුතු බවට නියෝග කර ඇති කිසියම් ගිවිසුමක් පිළියෙළ කිරීමට සහභාගී විය යුතුය.

3. මෙම කාර්යය සඳහා කොමිෂන් සභාවට සාධාරණ යයි පෙනී යන කාල පරිච්ඡේදයකට පසුව, නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව මඟින් නියම කර ඇති ගිවිසුම්වලට එළඹීමට අපොහොසත් වුවහොත්, එම තැනැත්තාගේ හෝ නිදහස් කළ තැනැත්තාගේ ඉල්ලීම අනුව, නිදහස් කළ තැනැන්තා සහ ප්‍රශ්නගත පුද්ගලයා අතර වන කිසියම් අර්බුදයක ගිවිසුමේ නියමයන් කොමිෂන් සභාවට සුදුසු යැයි පෙනී යන ආකාරයට නියම කරනු ලැබේ.

6 වන කොන්දේසිය : නිදහස් කිරීමේ නියෝගය නියම කිරීම සහ බෙදාහැරීමේ ව්‍යාපාරයේ පැවරීම

1. කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත එකඟතාව නොමැතිව, නිදහස් කළ තැනැත්තා මෙම නිදහස් කිරීමේ නියෝගය සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් පැවරීම නොකළ යුතුය.

2. කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත එකගතාවයක් නොමැතිව මෙම නිදහස් කිරීමේ නියෝගය යටතේ සිදු කර ගෙන යන බෙදාහැරීමේ ව්‍යාපාරය සම්පූර්ණ වශයෙන්ම හෝ එහි කොටසක් වෙනත් පුද්ගලයෙකුට ("පැවරුම්ලාභියා") පැවරීමට, නිදහස් කළ පුද්ගලයා කටයුතු නොකළ යුතුය.

3. මෙම නිදහස් කිරීමේ නියෝගයේ කිසියම් නියම කිරීමක් සඳහා හෝ බෙදාහැරීමේ ව්‍යාපාරයේ පැවරීම සඳහා වන කොමිෂන් සභාවේ කිසියම් එකඟතාව අදාළ වන පරිදි, පැවරුම්කරු හෝ පැවරුම්ලාභියා සතුව මෙම නිදහස් කිරීමේ නියෝගයේ කොන්දේසිවලට අනුකූල වීම සඳහා වන තාක්ෂණික හා මූල්‍ය ශක්‍යතාවය තිබෙන බවට කොමිෂන් සභාවේ සෑහීමට පත් වීමට යටත් වන අතර, පැවරීමක් සම්බන්ධයෙන් පමණක් වන විට, පැවරුම්ලාභියා වෙත නිදහස් කිරීමේ නියෝගයක් ලබා දීමේදී, අදාළ ආකාරය අනුව පැවරුම්කරු හෝ පැවරුම්ලාභියා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන විට පනත අනුව මෙම නිදහස් කිරීමේ නියෝගය වෙනස් කිරීමද ඇතුළුව, කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලබන වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අනුකූල වීමට යටත් වේ.

4. මෙම කොන්දේසියේ කිසිවක් මඟින් නිදහස් කළ තැනැන්තා බෙදාහැරීමේ ව්‍යාපාරය පැවරීම සඳහා කොමිෂන් සභාව එකඟතාවය ලබා දී ඇති පැවරුම්ලාභියෙකුට පැවරීමෙන් වළක්වාලන විධිවිධානයක් නොමැත, එසේ වුවද කිසියම් පැවරීමක් සඳහා එකඟතාව ලබා දුන් පසුව ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මන් අවස්ථාවක එම පැවරීම ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

7 වන කොන්දේසිය : නිදහස් කිරීමේ නියෝගය අවලංගු කිරීම හෝ ඉවත් කර ගැනීම

1. පහත දැක්වෙන අවස්ථාවන්හිදී 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 22 වන වගන්තිය යටතේ කොමිෂන් සභාවට නිදහස් කිරීමේ නියෝගය අවලංගු කළ හැකිය :

(*a*) නිදහස් කළ තැනැත්තා මෙම නිදහස් කිරීමේ නියෝගය අවලංගු කළ යුතු බවට ලිඛිතව එකඟ වේ නම් ;

(*b*) මෙම නියෝගයේ හෝ විධානයේ 2 වන කොන්දේසිය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන නියෝගයක් හෝ විධානයක් හා අනුකූල වීමට එය නිකුත් කළ දින සිට දින 60ක් තුළ හෝ එම නියෝගයේ හෝ විධානයේ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන කාල සීමාවක් තුළ නිදහස් කළ තැනැත්තා අසමත් වේ නම් ;

(*c*) පහත අවස්ථාවන්හිදී:

(i) නිදහස් කළ තැනැත්තාගේ පාලනය සම්බන්ධයෙන් වෙනස්වීමක් සිදු වුවහොත් ; සහ

(ii) නිදහස් කළ තැනැත්තා තුළ බෙදාහැරීමේ ව්‍යාපාරය සිදු කර ගෙන යාම සඳහා ඇති එහි පාර්ශ්වකරණයේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන නව පාර්ශ්වකරුවා හෝ නව පාර්ශ්වකරුවා (සිටී නම්) විසින් පත් කරනු ලබන අස්ථිත්වය සතුව බෙදාහැරීමේ ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් තාක්ෂණික, මූල්‍ය හෝ කළමනාකරණ ශක්තියක් නොමැති බවට කොමිෂන් සභාව සෑහීමට පත් වුවහොත් ; සහ

(iii) නිදහස් කළ තැනැත්තාගේ පාලනයේ වැඩිදුර වෙනස්වීමක් නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට නිවේදනය ලබා දුන් දින සිට ආරම්භ වී මාස තුනක කාලයක් තුළ සිදු වුවහොත් කොමිෂන් සභාව මෙම ඡේදය අනුව මෙම නියෝගය අවලංගු කිරීමට අදහස් කරන බව ප්‍රකාශ කරමින් කොමිෂන් සභාව නිදහස් කළ තැනැත්තා වෙත දැනුම් දීමක් කරන්නේ නම් ; සහ

(iv) එම කාලය තුළ වැඩිදුර වෙනස් වීම් සිදු නොවුවහොත් ;

(*d*) නිදහස් කළ තැනැත්තාගේ පාලනයේ වෙනස්වීමක් ඇති වී සෑහෙන සාධාරණ කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම් දීමට නිදහස් කළ තැනැත්තා අසමත් වුවහොත් ;

(*e*) කොමිෂන් සභාව විසින් සිය අභිමතය පරිදි සියලුම අවස්ථාවන්හිදී සාධාරණ යයි සලකනු ලබන ඊට වඩා කිසියම් දිගුකාලයක් ලබා දිය හැකි නිදහස් කළ තැනැත්තාගේ සාධාරණ පාලනයෙන් බැහැර බවට කොමිෂන් සභාවට සෑහීමට පත් විය හැකි, හේතුවක ප්‍රතිඵලයක් ලෙස බෙදාහැරීමේ ව්‍යාපාරය මාස තුනක අඛණ්ඩ කාලයක් තුළ ක්‍රියාත්මක කිරීම නිදහස් කළ තැනැත්තා විසින් නැවතුවහොත් ;

(*f*) මෙම නිදහස් කිරීමේ නියෝගය නිකුත් කිරීම සඳහා පදනම් වී ඇත්තේ නිදහස් කළ තැනැත්තා විසින් සැලකිය යුතු තරම් සාවද්‍ය හෝ වැරදි තොරතුරු බවට සොයා ගැනුනහොත්.

(*g*) නිදහස් කළ තැනැත්තා විසින් මෙම නිදහස් කිරීමේ නියෝගයේ කිසියම් උල්ලංඝනය/කඩ කිරීමක් සිදු කළහොත්.

8 වන කොන්දේසිය ෘ පරිසරය

1. අනුකූල විය යුතු පාරිසරික නීති යටතේ නිදහස් කළ තැනැත්තා වෙත ලබා දිය හැකි කිසියම් නිදහස් කිරීම් හෝ සහන කාලයන්ට යටත්ව, ශ්‍රී ලංකාවේ සියලු අදාළ පාරිසරික නීති රීතිවලට අනුකූල විය යුතුය.

2. නිදහස් කළ තැනැත්තා විසින්, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන දිනයට පසු නොවන දිනයක කොමිෂන් සභාව විමසා, අදාළ සියලු පාරිසරික නීති යටතේ වන එහි කාර්යයන් සහ බැඳීම් සමඟ අනුකූල වීමට නිදහස් කළ තැනැත්තා අදහස් කරන ආකාරය නිශ්චිතව දක්වමින් ලිඛිත ප්‍රතිපත්තියක් සකස් කිරීමට, සහ වරින් වර වෙනස් කිරීමට කටයුතු කළ යුතුය.

3. කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන ආකාරයට සහ කාල සීමාවන්හි සිය පාරිසරික කාර්යසාධනය පිළිබඳව නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.

4. මෙම නිදහස් කළ නියෝගයේ අරමුණු සඳහා, "පාරිසරික නීති" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරිසරය මත යැපෙන මිනිසුන්ගේ සෞඛ්‍යය, ශාක, සතුන් සහ පරිසර පද්ධතිද ඇතුළුව පරිසරයේ ආරක්ෂාව සඳහා, වරින් වර බලාත්මකව පවතින නීති වේ, සැකය මඟහරවා ගැනීම සඳහා ඊට 1980 අංක 47 දරන ජාතික පරිසර පනත ඇතුළුව නමුත් එහෙත් ඊට සීමා නොවී පාරිසරික බලපෑම් ඇගයීම හා වායුගෝලය, ඉඩම් හා ජලය ආරක්ෂා කිරීම හා සම්බන්ධ සියලු අදාළ නීති සම්පාදන ඇතුළත් වේ.

9 වන කොන්දේසිය ෘ සෞඛ්‍යය හා ආරක්ෂාව

1. පහත 2 ඡේදයෙහි දක්වා ඇති ආරක්ෂණ සහ තාක්ෂණික සැලැස්මක් පිළියෙළ කිරීම ඇතුළුව, බෙදාහැරීමේ ව්‍යාපාරය සිදු කර ගෙන යාමේදී නිදහස් කළ තැනැත්තා අතින් පුද්ගලයින්ට, යන්ත්‍රවලට, දේවලවලට සහ දේපළවලට සිදු වීමට ඉඩ ඇති තුවාල සහ හානිවලින් ආරක්ෂා කිරීමට නිදහස් කළ තැනැත්තා සියලු සාධාරණ පියවර ගත යුතුය.

2. නිදහස් කළ තැනැත්තා විසින් ෘ

   (*a*) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන දිනයකට පසු නොවන දිනයක කොමිෂන් සභාව විමසා බලා, ආරක්ෂක තාක්ෂණික කළමනාකරණ සැලැස්මක් පිළියෙල කොට අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය ;

   (*b*) සැලැස්මේ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සහතික කිරීමට වාර්ෂිකව සමාලෝචනය කර, අවශ්‍ය වුවහොත් යාවත්කාල කර, එසේ යාවත්කාල කළ සැලැස්ම අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය ;

   (*c*) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිදි සැලැස්ම (කලින් කලට යාවත්කාල කර) හා අනුකූල විය යුතුය;

   (*d*) කොමිෂන් සභාවේ අනුමැතියක් නොමැතිව සැලැස්ම සංශෝධනය නොකළ යුතුය ; සහ

   (*e*) සැලැස්ම යටතේ එහි බැඳීම් හා එහි අනුකූලත්වය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සහ සැලැස්මට අනුකූලව ස්වාධීන විශේෂඥයකු ලවා වාර්ෂික විගණනයක් සිදු කෙරෙන බවට වග බලා ගැනීම ;

   (*f*) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇති සෞඛ්‍ය හා ආරක්ෂණ සංඛ්‍යාලේඛන සහ දර්ශක සංගෘහිත කිරීම ; සහ

   (*g*) එම විගණන, සංඛ්‍යාලේඛන සහ දර්ශකවල ප්‍රතිඵල ඉක්මණින් කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම.

10 වන කොන්දේසිය ෘ රක්ෂණය

1. නිදහස් කළ තැනැත්තා බෙදාහැරීමේ ව්‍යාපාරය හා සම්බන්ධ අවදානම් කළමනාකරණය හා රක්ෂණය හා අදාළ සාධාරණ සහ දූරදර්ශී ප්‍රතිපත්ති අනුගමනය කර ක්‍රියාත්මක කරනු ඇත.

11 වන කොන්දේසිය ෘ රහස්‍ය තොරතුරු

1. බෙදාහැරීමේ ව්‍යාපාරය පිළිබඳව තමා වෙත ලැබෙන සියලු තොරතුරු සම්බන්ධයෙන් පහත දෑ කිරීම සඳහා නිදහස් කළ තැනැත්තා වග බලා ගත යුතුය ෘ

   (*a*) කොමිෂන් සභාව විසින් එසේ නොකිරීමට අවසර දී ඇති අවස්ථාවලදී හැර, නිදහස් කළ තැනැත්තා විසින් රහස්‍ය ලෙස තබා ගන්නා බවටත්, මෙම නිදහස් කිරීමේ නියෝගය හෝ වෙනත් පරිචය සංග්‍රහයක් සහ එම රහස්‍ය

තොරතුරු වෙත ලබා දෙනුයේ ඒවායේ නිසි නිත්‍යානුකූල කාර්යයන් සිදු කිරීම සඳහා, නිදහස් කළ තැනැත්තාගේ අධ්‍යක්ෂවරුන්ට, නිලධාරීන්ට සහ සේවකයින්ට පමණක් බවටත්, එසේ නැතහොත් මෙම රහස්‍යතා අවශ්‍යතාව පිළිපැදීමට ලිඛිතව එකඟ වී සිටින නිදහස් කළ තැනැත්තන්ගේ නියෝජිතයින්ට පමණක් බවටත් ;

(*b*) එම තොරතුරු ලබා දුන් අරමුණ හෝ මෙම නිදහස් කිරීමේ නියෝගයේ හෝ පරිචය සංග්‍රහයේ අවසර දී ඇති අරමුණක් සඳහා හැර වෙනත් අරමුණක් සඳහා නිදහස් කළ තැනැත්තා විසින් භාවිතා නොකරන බවට ; සහ

(*c*) බෙදාහැරීමේ ව්‍යාපාරයේ සමන්විත වන සේවාවක් නොවන සේවාවක් සැපයීමේදී කිසියම් වාණිජ වාසියක් සඳහා නිදහස් කළ තැනැත්තා විසින් භාවිතා නොකරන බවට.

12 වන කොන්දේසිය ඃ ආරවුල් විසඳීම

1. නිදහස් කළ තැනැත්තා විසින් ඃ

(*a*) i තමා සහ අයකුම පාරිභෝගිකයා අතර වන විසඳීමට නොහැකි අර්බුදයක් - ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද නීති අනුව සමථකරණය සහ විසඳීම සඳහා අර්බුදය කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය ;

(*b*) අර්බුදයක් (1) (*අ ඡේදයෙන් විමර්ශනයට ලක් කරන ලද අර්බුදය නොවන වෙනත් අර්බුදයක්*) - ශ්‍රී ලංකා මහජන උපයෝගීතා පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද නීති අනුව, එම නීතිය අනුව අර්බුදය විසඳීමට හෝ, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන අවස්ථාවක අර්බුදය උසාවියක් හෝ බේරුම්කරණ මණ්ඩලයක් වෙතයොමු කිරීමට එම අර්බුදය කොමිෂන් සභාව වෙත යොමු කෙරේ.

***III කොටස බෙදාහැරීම සඳහා වන නිශ්චිත කොන්දේසි***

13 වන කොන්දේසිය ඃ  නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවය - නියමයන් ලබා දීම සඳහා වන අවශ්‍යතාව

1. නිදහස් කළ තැනැත්තා විසින්, 4, 3 සහ 5 වන ඡේදයන්ට යටත්ව,

(*a*) නිදහස් කිරීමේ නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ස්ථානය තුළ පිහිටා ඇති, නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර ඇති, පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු සමඟ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් සැපයීමට ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම ; සහ

(*b*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් නවීකරණය කිරීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර ඇති කිසියම් තැනැත්තෙකු සමඟ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියෙන් සම්බන්ධතාවයක් වෙනස් කිරීම සඳහා ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම.

2. නිදහස් කළ තැනැත්තාට එම ඉදිරිපත් වීමේ නියමයන් සකස් කිරීම සඳහා සාධාරණ කාලයක් අවශ්‍ය වන බැවින්, නිදහස් කළ තැනැත්තා, 4, 3 සහ 5 වන ඡේදයන්ට යටත්ව, ප්‍රායෝගික වශයෙන් හැකි විගස, කිසිදු විටක, එම සියලු තොරතුරු ඇතුළත්ව අයදුම්පතක් ලැබීමෙන් සති දෙකකට නොඅඩු කාලයක් තුළ, 1 වන ඡේදය අනුව පැවරීමක් සඳහා නියමයන් ඉදිරිපත් කරනු ලබයි

3. නිදහස් කළ තැනැත්තාට නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතියේ ධාරිතාව පුළුල් කිරීමට හෝ ශක්තිමත් කිරීමට අවශ්‍ය වන විට සහ එසේ නොවන විටක, සියලු තත්ත්වයන් සැලකිල්ලට ගෙන, නිදහස් කළ තැනැත්තා විසින් එම පුළුල් කිරීම හෝ ශක්තිමත් කිරීම සිදු කිරීම මහජන හිත සුව පිණිස වන විට මෙම කොන්දේසිය අනුව, නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ ධාරිතාවය සහ සිදු කරන ලද භාවිතය හෝ භාවිතා කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කිරීම යන හේතුව මත, නිදහස් කළ තැනැත්තා නිශ්චිතව දක්වන ලද පරිශ්‍රයක කිසියම් හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු සමඟ ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීමට බැඳී නොසිටී.

4. පුද්ගලයෙකු වෙත වන සම්බන්ධතාවය මගින් නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ ආරක්ෂාවට සහ ස්ථාවරත්වයට තර්ජනයක් ඇති කෙරෙන අවස්ථාවල, නිදහස් කළ තැනැත්තා මෙම කොන්දේසිය අනුව වෙනත් පුද්ගලයෙකු සමඟ ගිවිසුමකට එළඹීමට බැඳී නොසිටී

5. නිදහස් කළ තැනැත්තෙකු සම්බන්ධ වීමට ඉඩ ඇති විටක, නිදහස් කළ තැනැත්තා වෙනත් තැනැත්තෙකු සමඟ පහත ආකාරයෙන් ගිවිසුමකට නොඑළඹිය යුතුය ඃ

(*a*) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාක්ෂණික හෝ මෙහෙයුම් සංග්‍රහ උල්ලංඝනය කරමින් හෝ

(*b*) පනත හෝ පනත යටතේ සිදු කරනු ලබන  නියාමයන් උල්ලංඝනය කරමින්; හෝ

(*c*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතිය හා අදාළ වන ආරක්ෂාව හෝ ප්‍රමිතිය හා සම්බන්ධ කිසියම් නීති සම්පාදනයක් උල්ලංඝනය කරමින්; හෝ

(*d*) කොමිෂන් සභාව විසින් පනවන ලද වෙනත් කිසියම් කොන්දේසි උල්ලංඝනය කරමින්

6. 4, 3 සහ 5 වන ඡේද අනුව, නිදහස් කළ තැනැත්තා වෙනත් පුද්ගලයෙකු සමඟ ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, නිදහස් කළ පුද්ගලයා විසින් ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මන් අවස්ථාවක, කුමන තත්ත්වයකදී වුවත් නිදහස් කළ තැනැත්තා වෙත එම පුද්ගලයා වෙතින් අයදුම්පතක් ලැබී සති 2ක් නොඉක්මවන කාලයක් තුළ, ප්‍රතික්ෂේප කිරීම සඳහා වන හේතුව නිශ්චිතව දක්වමින්, එසේ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව දැනුම් දිය යුතුය.

14 වන කොන්දේසිය ඃ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත වන සම්බන්ධතාවය - කොමිෂන් සභාවේ කාර්යයන්

1. මෙම කාර්යය සඳහා කොමිෂන් සභාවට සාධාරණ යැයි හැඟෙන කාලයකට පසුව, 13 වන කොන්දේසිය අනුව අයදුම්පතක් ඉදිරිපත් කර හිමිකම් ලබා ඇති හෝ හිමිකම් ලබන බව කියා සිටින පුද්ගලයෙකු සමඟ ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීමට නිදහස් කළ තැනැත්තා අපොහොසත් වුවහොත්, කොමිෂන් සභාව, එම තැනැත්තාගේ හෝ නිදහස් කළ තැනැත්තාගේ ඉල්ලීමක් කළ පසුව, නිදහස් කළ තැනැත්තා සහ ප්‍රශ්නගත පුද්ගලයා අතර වන අර්බුදයේ ගිවිසුමෙහි කොන්දේසි කොමිෂන් සභාවට සාධාරණ යැයි පෙනී යන ආකාරයෙන් නියම කළ යුතුය.
2. කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ගිවිසුම මත පදනම්ව කටයුතු කිරීමට පුද්ගලයා අදහස් කරන්නේ නම්, නිදහස් කළ තැනැත්තා වහාම එහි නියමයන් අනුව ගිවිසුමක් වෙත එළඹී එය ක්‍රියාත්මක කරනු ලැබේ.
3. සම්බන්ධතාවය සඳහා, සම්බන්ධතාවයක් නවීකරණය සඳහා වන ගිවිසුමක කුමන පාර්ශ්වයක්, හෝ 13 වන කොන්දේසිය අනුව හෝ මෙම කොන්දේසිය අනුව නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියට ඇතුළත් වී ඇති පාර්ශ්වයක් එම ගිවිසුම යටතේ ප්‍රතිපාදන සලසා ඇති ආකාරයට එම ගිවිසුමේ කොන්ත්‍රාත්තුමය නියමයන්ගෙන් බැහැර වීමට අදහස් කරන්නේ නම්, කොමිෂන් සභාව විසින් නිදහස් කළ තැනැත්තාගේ හෝ එම ගිවිසුමේ අනෙක් පාර්ශ්වයේ ඉල්ලීම පරිදි එම බැහැර වීම හා සම්බන්ධ ආරවුල කොමිෂන් සභාවට සාධාරණ ලෙස හැඟී යන ආකාරයට විසඳනු ලැබේ.

15 වන කොන්දේසිය ඃ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවය ලබා දීමේදී වෙනස් කොට නොසැලකීම

1. නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධ වීමේ කාර්යය සඳහා වන වැඩ කටයුතු සිදු කර ගෙන යාමේදී නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් රඳවා ගැනීමක් ලබා දීමේදී, නිදහස් කළ තැනැත්තා පහත පුද්ගලයන් සම්බන්ධයෙන් අනිසි ලෙස වෙනස් ආකාරයෙන් නොසැලකිය යුතුය ඃ

(*a*) කිසියම් පුද්ගලයන් අතර හෝ පුද්ගල පංතියක් හෝ පංති අතර ;

(*b*) නිදහස් කළ තැනැත්තන් අතර හෝ නිදහස් කළ පුද්ගලයාගේ කිසියම් අනුබද්ධ හෝ ආශ්‍රිත ව්‍යාපාරයක් සහ කිසියම් පුද්ගලයෙකු, පුද්ගල පංතියක් හෝ පංති අතර.

16 වන කොන්දේසිය ඃ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතිය වෙත ගාස්තු අය කිරීමේ පදනම

1. නිදහස් කළ තැනැත්තා, ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මණින්, කුමන තත්ත්වයක වුවත් නිදහස් කිරීමේ නියෝගය බලාත්මක වී දින 28ක කාලයක් ඉක්මවීමට පෙර, නිදහස් කළ තැනැත්තාගේ පද්ධතිය වෙත වන සම්බන්ධතාව සඳහා පදනම් වූ ගාස්තු දක්වමින් ප්‍රකාශයක් සකස් කර, කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර, සම්බන්ධතාව සම්බන්ධයෙන් වන ආරක්ෂක තැන්පතු සඳහා වන ඉල්ලීම් සිදු කළ යුතුය.

2. නිදහස් කළ තැනැත්තා විසින්, කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන වරින් වර සකස් කර ඇති තොරතුර වරින් වර සංශෝධනය කර, 1 වන ඡේදය අනුව පිළියෙල කර ඇති ප්‍රකාශයේ ආකෘතිය වෙනස් කිරීම කළ යුතු අතර, අඩු වශයෙන් මෙම නිදහස් කිරීමේ ගිවිසුම බලාත්මකව ඇති සෑම වසරකම වරක්වත්, එම ප්‍රකාශයේ දක්වා ඇති තොරතුරු සියලුම වැදගත් කරුණු සම්බන්ධයෙන් අඛණ්ඩව නිවැරදිව දැක්වෙන ආකාරයට සංශෝධනය කළ යුතුය.

3. කිසියම් නිදහස් කළ තැනැත්තෙකු විසින් 1 වන උපලේඛනයේ විස්තර කර ඇති පරිශ්‍රය තුළ සිටින විදුලිබල සම්බන්ධතාවයක් ඉල්ලා ඇති තැනැත්තෙකුට සම්බන්ධතාවයක් ලබා දීමේදී, එම විදුලිබල සැපයුම ලබා දීමේදී වැය වූ වියදම්, එම වියදම් සාධාරණ ලෙස දරා ඇති ප්‍රමාණයක් දක්වා, එම තැනැත්තා විසින් දැරිය යුතු බවට නියම කිරීමට නිදහස් කළ තැනැත්තාට පුළුවන.

4. නිදහස් කළ තැනැත්තාට ලිඛිත දැනුම් දීමක් මඟින් විදුලි සම්බන්ධතාවයක් අවශ්‍ය කිසියම් තැනැත්තෙකුගෙන්, විදුලිබලය සැපයීම හේතුවෙන් උපරිම වශයෙන් නිදහස් කළ තැනැත්තා වෙත ගෙවීමට සිදු වන මාස දෙකක විදුලි පාරිභෝජන බිල්පත්වලට සමාන ගෙවීම් සාධාරණ ඇප තැන්පතුවක් ලෙස ලබා දෙන ලෙස නියම කළ හැකිය.

මෙම කොන්දේසිය නියම කර ඇති පරිදි කිසියම් පුද්ගලයෙකු එවැනි තැන්පතුවක් සපයා නොමැති විටක හෝ එම පුද්ගලයා විසින් සපයා දී ඇති ඇප තැන්පතුව ප්‍රමාණවත් නොවන විට -

(*a*) නිදහස් කළ තැනැත්තාට දැනුම් දීම සිදු කර දින 7ක් තුළ, විදුලිබලය සැපයීම හේතුවෙන් උපරිම වශයෙන් නිදහස් කළ තැනැත්තා වෙත ගෙවීමට සිදු වන මාස දෙකක විදුලි පාරිභෝජන බිල්පත් සමාන ගෙවීමක් සාධාරණ ඇප තැන්පතුවක් ලෙස ලබා දෙන ලෙස නියම කළ හැකිය ; සහ

(*b*) එම තැනැත්තා එවැනි තැන්පතුවක් ලබා දීමට අපොහොසත් වන්නේ නම්, නිදහස් කළ තැනැත්තාට, අදාළ වන පරිදි සම්බන්ධතාවය ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හෝ සැපයුම විසන්ධි කිරීම සිදු කළ හැකිය.

(*c*) මෙම කොන්දේසිය අනුව ඇප තැන්පතුවක් ලෙස නිදහස් කළ තැනැත්තා වෙත කිසියම් මුදලක් ලබා දී ඇති විටක, එම මුදල වෙනුවෙන් කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ, එම මුදල නිදහස් කළ තැනැත්තා වෙත පවතින තාක්, නිදහස් කළ තැනැත්තා විසින් වරින් වර නියම කරනු ලබන අනුපාතයක් යටතේ පොළී ගෙවිය යුතුය.

5. නිදහස් කළ තැනැත්තා විසින් 1 වන ඡේදය අනුව පිළියෙල කරන ලද ප්‍රකාශයේ පිටපතක් සහ 2 වන ඡේදය අනුව එම ප්‍රකාශය සම්බන්ධයෙන් වන එක් එක් සංශෝධනයක් කොමිෂන් සභාව වෙත එවිය යුතුය. එම එක් එක් සංශෝධනයක් සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය අවශ්‍ය වන අතර කොමිෂන් සභාව අනුමත කරන තෙක් බලාත්මක නොවේ.

6. නිදහස් කළ තැනැත්තා විසින්, 1 වන ඡේදය අනුව පිළියෙල කළ ප්‍රකාශයේ පිටපතක් හෝ (අදාළ පරිදි) 2 වන ඡේදය අනුව පිළියෙල කළ එම ප්‍රකාශයේ අලුත්ම සංශෝධනයක් එම ඡේද යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කර, එම ප්‍රකාශයේ පිටපතක් ඉල්ලා සිටි තැනැත්තා වෙත ලබා දීම හෝ යැවීම කළ යුතුය.

7. නිදහස් කළ තැනැත්තා විසින් 4 වන ඡේදය අනුව ලබා දෙන හෝ යවන කිසියම් ප්‍රකාශනයක් සඳහා, එසේ ප්‍රකාශයක් ලබා දීම සඳහා නිදහස් කළ තැනැත්තාට වැය වන සාධාරණ වියදම් පිළිබිඹු වන සහ මෙම කොන්දේසියේ අරමුණ වෙනුවෙන් කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන නියෝගයන්හි නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණය නොඉක්මවන කිසියම් ගාස්තුවක් අය කිරීමට කටයුතු කරනු ලැබේ.

17 වන කොන්දේසිය ඃ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට සහ අනෙකුත් බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ට තොරතුරු සැපයීම

1. නිදහස් කළ තැනැත්තා විසින්, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගෙන් සිය අනාගත බලශක්ති අවශ්‍යතා පිළිබඳ පුරෝකථනය කිරීමට ප්‍රමාණවත් වාර්තා සහ පහත දැක්වෙන දෑ සම්බන්ධ විස්තරද ඇතුළුව, එම අවශ්‍යතාවයේ ඉල්ලුම් පැතිකඩක් පවත්වා ගත යුතුය ඃ

(*a*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ තාක්ෂණික සහ තාක්ෂණික නොවන හානි ;

(*b*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියට සම්බන්ධ කර ඇති ජෙනරේටර් (ඇත්නම්) මගින් සපයනු ලබන බලශක්තිය ;

(*c*) නව සම්බන්ධතාවල බලපෑම ; සහ

(*d*) ඉල්ලුම් කළමනාකරණයේ බලපෑම.

(*e*) විවිධ පාරිභෝගික කාණ්ඩවල ධාරා චරිතාංග

2. සමස්ත පද්ධතියේ ආරක්ෂිත සහ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වයක්, සම්බන්ධීකෘත සංවර්ධනයක් සහ අන්තර් ක්‍රියාකාරීත්වයක් සහතික කිරීමට නිදහස් කළ තැනැත්තා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට සහ අනෙක් බෙදාහැරීම් බලපත්‍රලාභීන්ට, සාධාරණ වශයෙන් අවශ්‍ය වන ආකාරයෙන් සහ අවශ්‍ය අවස්ථාවන්හිදී, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා සහ අනෙක් බෙදාහැරීම් බලපත්‍රලාභීන් විසින් සාධාරණ වශයෙන් ඉල්ලා සිටින එම තොරතුරු සහ පුරෝකථන ඉදිරිපත් කළ යුතුය.

3. මෙම කොන්දේසිය තුළ ඃ

"සමස්ත පද්ධතිය" යනු සියලු අනෙකුත් බෙදාහැරීම් බලපත්‍රලාභීන්ගේ සම්ප්‍රේෂණ පද්ධතිය, බලපත්‍රලාභියාගේ බෙදාහැරීමේ පද්ධති සහ බෙදාහැරීම් පද්ධතිවල සමස්තය වේ.

***IV* වන කොටස ඃ සැපයීම සඳහා වන නිශ්චිත කොන්දේසි**

18 වන කොන්දේසිය ඃ සැපයීමේදී වෙනස් කර සැලකීම තහනම් කිරීම

1. නිදහස් කළ තැනැත්තා, පාරිභෝගිකයින් වෙත විදුලිය සැපයීම සඳහා නියමයන් ඉදිරිපත් කිරීමේදී ඃ

(*a*) කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට අනිසි විශේෂත්වයක් දැක්වීම;

(*b*) කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට අනිසි විශේෂත්වයක් ක්‍රියාවෙන් සිදු කිරීම; හෝ

(*c*) අනවශ්‍ය ලෙස දුෂ්කර නියමයන් පැනවීම.

2. මෙම කොන්දේසියේ අරමුණු සඳහා, පාරිභෝගිකයින් වෙත විදුලිය සැපයීමෙන් ලැබෙන ආදායම, එම විදුලිය සැපයීම සඳහා වන වියදමට වඩා සැලකිය යුතු ලෙස ඉහළ නම්, එම නියමයන් අනවශ්‍ය ලෙස දුෂ්කර වේ.

3. මෙම කොන්දේසියේ අරමුණ සඳහා, ප්‍රශ්නගත පාරිභෝගිකයින් වෙත විදුලිය සැපයීමේදී වැය වන වියදම් සාධාරණ ලෙස ආවරණය නොවන ගාස්තු හා එම කොන්දේසි සම්බන්ධ වේද යන්න පිළිබඳව නිසි ලෙස සලකා බලා, එම නියමයක් අනවශ්‍ය ලෙස දුෂ්කරදැයි යන ප්‍රශ්නය පිළිබඳව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

4. මෙම කොන්දේසියේ ඃ

"නියමයන්" යනු විදුලිය සැපයීමේ ඇගයීමට සැලකිය යුතු ලෙස බලපාන මිල සම්බන්ධයෙන් වන නියමයන්ද ඇතුළුව, විදුලිය සැපයුම ඉදිරිපත් කරන හෝ ලබා දෙන නියමයන් වේ.

19 වන කොන්දේසිය ඃ අයකුම ලේඛනය සැපයීම

1. නිදහස් කළ තැනැත්තා, මෙම නියෝගය බලාත්මක වී ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මණින්, කිසිදු හේතුවක් මත, මෙම වගන්තියේ අරමුණ වෙනුවෙන් නිදහස් කළ තැනැත්තා වෙත නිකුත් කරන ලද නියෝගයන්හි කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන දිනකට පසු නොවන දිනයක හෝ ඉන් පසුව වරින් වර, විදුලි පාරිභෝගිකයින් සඳහා විදුලිය අලෙවි කරනු ලබන අයකුම ලේඛනයක් පිළියෙල කළ යුතුය.

2. අයකුම ලේඛනයක් ඃ

(*a*) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආකෘතියෙන් තිබිය යුතුය ;

(*b*) කිසියම් පාරිභෝගිකයෙකුට විදුලිය මිලදී ගැනීම සඳහා ගෙවිය යුතු ගාස්තුවල සාධාරණ ඇස්තමේන්තුවක් සාදා ගැනීමට හැකි වන අවශ්‍ය වන විස්තර සහිත විය යුතුය ;

(*c*) වසරේ, දවසේ හෝ සතියේ නියමිත කාල සීමාවල සහ දහවල් හා රාත්‍රී කාලයන්හි විදුලිය සැපයීමේදී නිදහස් කළ තැනැත්තා දරන වියදම් පිළිබිඹු වන බවට කොමිෂන් සභාව විසින් අනුමත කරන ක්‍රමවේදයක් අනුව සහ කාර්යක්ෂම ආකාරයෙන් මෙම නිදහස් කිරීමේ නියෝගයෙන් බලය ලබා දී ඇති ක්‍රියාකාරකම් ඉටු කිරීමේදී සාධාරණ ලෙස වැය වන සියලු වියදම් අය කර ගැනීමට නිදහස් කළ පුද්ගලයාට අවසර ලබා දෙන පරිදි සකස් වී තිබිය යුතුය ; සහ

(*d*) පහත දැ වෙන වෙනම හඳුනාගත යුතුය ඃ

(*a*) නිදහස් කළ තැනැත්තාගේ විදුලිය මිලට ගැනිමේ පිරිවැය

(*b*) පොරොත්තු හෝ හදිසි ජෙනරේටර්වල මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය

(*c*) බෙදාහැරීමේ පද්ධති මෙහෙයුම් හා කළමනාකරණ නඩත්තු ගාස්තුව

3. නිදහස් කළ තැනැත්තා විසින් නියම කරනු ලබන එවැනි අයකුම සංකීර්ණ වීම හේතුවෙන්, සරල පැහැදිලි කිරීමේ ප්‍රකාශ අවශ්‍ය බවට කොමිෂන් සභාවට හැඟුනහොත්, පාරිභෝගිකයින්හට පහසුවෙන් අවබෝධ කර ගැනීමට සුදුසු පරිදි, නිදහස් කළ තැනැත්තාට එකී පැහැදිලි කිරීමේ ප්‍රකාශ පිළියෙල කරන ලෙසත් ඉන් පසුව ඒවා අයකුම ලේඛනයේ පළ කරන ලෙසත් නියම කිරීමට කොමිෂන් සභාවට පුළුවන.

4. නිදහස් කළ තැනැත්තා කොමිෂන්සභාව වෙතින් සැපයුම් අයකුම ලේඛනය සඳහා අනුමැතිය ලබා ගත යුතුය.

5. වෙනත් කිසියම් තැනැත්තෙකු වෙත ලබා දීමට දින 14කට වඩා නොවැඩි කාලයක් තුළ, නිදහස් කළ තැනැත්තා අයකුම ලේඛනවල පිටපතක් (වරින් වර සංශෝධනයට ලක් කරනු ලබන පරිදි) කොමිෂන් සභාව වෙත ලබා දීම හෝ යැවීම සිදු කළ යුතුය.

6. කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන පරිදි නිදහස් කළ තැනැත්තා අයකුම ලේඛනය ප්‍රකාශයට පත් කළ යුතුය.

7. නිදහස් කළ තැනැත්තා (8 වන ඡේදයට යටත්ව) අයකුම ලේඛනයේ සහ කිසියම් පැහැදිලි කිරීමේ ප්‍රකාශනයේ (වරින් වර සංශෝධනයට ලක් කරනු ලබන පරිදි) පිටපතක් එවැන්නක් ඉල්ලා සිටින ඕනෑම තැනැත්තෙකු වෙත ලබා දීම හෝ යැවීම සිදු කළ යුතුය.

8. නිදහස් කළ තැනැත්තා, 7 වන ඡේදය අනුව ලබා දුන් හෝ යවන ලද අයකුම ලේඛනයේ ඕනෑම පිටපතක් සඳහා සහ කිසියම් පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් (වරින්වර සංශෝධනය කරන ලද) සඳහා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝගයන්හි මෙම වගන්තියේ අරමුණ වෙනුවෙන් අදාළ කාලය තුළ නිශ්චිතව දක්වා ඇති මුදල නොඉක්මවන ගාස්තුවක් අය කරනු ලැබේ.

9. නියෝගවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට, හෝ නියෝගවල දක්වා ඇති අරමුණු ඉටු කර ගත හැකි ආකාරයට, නිදහස් කළ තැනැත්තා වරින් වර අයකුම ලේඛනය වෙනස් කළ යුතු බවට, නියම කරමින් කොමිෂන් සභාව විසින් නිදහස් කළ තැනැත්තා වෙත නියෝග ලබා දෙන අතර නිදහස් කළ තැනැත්තා එවැනි නියෝගයන් හා වහාම අනුකූල විය යුතුය.

10. අයකුමලේඛනය සමාලෝචනය කිරීම සඳහා වන ක්‍රියාමාර්ගයක් කොමිෂන් සභාව නිර්දේශ කළ යුතුය.

20 වන කොන්දේසිය : අයකුම ගිවිසුම බෙදාහැරීම සහ සැපයීම

1. නිදහස් කළ තැනැත්තා විදුලි පාරිභෝගිකයෙකු සමඟ හෝ විදුලිබල පාරිභෝගිකයෙකු වීමට අපේක්ෂා කරන තැනැත්තෙකු සමඟ ගිවිසුමකට එළඹීමට (පහත 3 වන ඡේදයට සහ 14 වන කොන්දේසියට යටත්ව) ඉදිරිපත් වනු ඇති අතර, එම විදුලිය අලෙවි කිරීම හා සම්බන්ධයෙන් අය කළ යුතු ගාස්තු සඳහා වන විධිවිධාන සැලසීම සහ ඉහත 19 වන කොන්දේසියෙහි තීරණය කරනු ලබන අයකුම ලේඛනයෙන් පරිශීලනය ලබා දී ඇති ආකාරයට ඉදිරිපත් කළ යුතුය.

2. ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මණින්, කුමන තත්ත්වයේ වුවත් අර්පනයේ නියමයන් සැකසීම සඳහා නිදහස් කළ තැනැත්තා විසින් සාධාරණ ලෙස ඉල්ලා සිටින එම සියලු තොරතුරු සහිත අයදුම්පතක් නිදහස් කළ තැනැත්තා වෙත ලැබී සති 02කට නොවැඩි කාලයක් තුළ, නිදහස් කළ තැනැත්තා ගිවිසුම සඳහා වන නියමයන් ඉදිරිපත් කළ යුතුය.

3. නිදහස් කළ තැනැත්තා කිසියම් ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම තුළ නිදහස් කළ තැනැත්තෙකු සම්බන්ධ වේ නම් මෙම කොන්දේසියෙන් බැඳී නොසිටී :

(*a*) පනත යටතේ වන කාර්යයන් උල්ලංඝනය වන ආකාරයෙන් ;

(*b*) පනත යටතේ හෝ බෙදාහැරීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් වන ආරක්ෂාව හා ප්‍රමිතිය සම්බන්ධ වෙනත් කිසියම් නීති පැනවීමක් යටතේ සාදන ලද කිසියම් රෙගුලාසි උල්ලංඝනය වන ආකාරයෙන් ;

(*c*) මෙම නිදහස් කිරීමේ නියෝගය උල්ලංඝනය වන ආකාරයෙන් ; හෝ

(*d*) කිසියම් අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සාර සංග්‍රහ උල්ලංඝනය වන ආකාරයෙන්.

4. මෙම කොන්දේසිය යටතේ ගිවිසුමකට එළඹීම සඳහා නිදහස් කළ තැනැත්තෙකු සතු බැඳීම 25 වන කොන්දේසිය අනුව එළඹෙන සම්බන්ධතා ගිවිසුමට සුදුසු පරිදි වගන්ති ඇතුල් කිරීමෙන් ඉටු කර ගත හැකි වේ.

21 වන කොන්දේසිය - පරිශ්‍රයන් තුළට ඇතුළු වීම

1. මෙම නිදහස් කිරීමේ නියෝගය යටතේ කිසියම් පරිශ්‍රයකට ඇතුළු වීමේදී ඒ බව නිදහස් කළ තැනැත්තා හෝ නිදහස් කළ තැනැත්තා විසින් බලය දී ඇති තැනැත්තෙකු විසින් දැනුම් දිය යුතු අතර පහත අවස්ථාවන් සපුරා නැති නම් එසේ කිරීමට ඉල්ලා සිටීමට හෝ අයිතියක් ලෙස සලකා ඇතුළු වීමට නොහැක -

(i) නිදහස් කළ තැනැත්තාගේ බලයලත් නිලධාරියා විසින් හෝ නිදහස් කළ තැනැත්තා විසින් සිදු කිරිමට අදහස් කරන කටයුතුවල ස්වභාවය සහ ප්‍රමාණය දක්වමින් කිසියම් පරිශ්‍රයකට ඇතුළු වීමට දින තුනකට පෙර දැනුම් දී තිබීම ;

(ii) අවශ්‍ය වුවහොත්, ඔහු හෝ ඇය ඔහුගේ හෝ ඇයගේ බලය පිළිබඳ සාක්ෂි සපයා තිබීම ;

(iii) මෙම ඇතුළු වීම හේතුවෙන් ඉඩමට හෝ පරිශ්‍රයට කිසියම් බාධා කිරීමක්, අක්‍රිය කිරීමක්, හානියක් සිදු වේ නම් එහි හිමිකරුට ඒ සඳහා සාධාරණ වන්දි මුදලක් ගෙවා තිබීම.

2. නිදහස් කළ තැනැත්තා හෝ තමා වෙනුවෙන් නිදහස් කළ තැනැත්තා විසින් ලිඛිතව බලය පවරා ඇති තැනැත්තෙකු, (1) (අ) ඡේදයෙහි විස්තර කර ඇති පරිදි දැනුම් දීමක් ලබා දීමේ අරමුණ සඳහා ඉඩමට ඇතුළු වීම සඳහා හිමිකම් ලබයි.

3. මෙම අයිතමය යටතේ පැවරී ඇති කිසියම් බලතලයක් ක්‍රියාවේ යෙදවීමේදී, නිදහස් කළ තැනැත්තා විසින් ලිඛිතව බලය ලබා දී ඇති තැනැත්තා ලවා එසේ ඇතුළු වීමේදී පරිශ්‍රයට සිදු වන හානිය සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කළ යුතුය.

4. මෙම නිදහස් කිරීමේ නියෝගය අනුව හෝ යටතේ පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීමේදී, පරිශ්‍රයට හෝ කිසියම් චංචල දේපලකට හානියක් සිදු වුවහොත්, අදාළ පරිශ්‍රයේ හෝ චංචල දේපලවල භාරකරුට ක්‍රියාවේ යොදවන ලබන බලය සහිත නිදහස් කළ තැනැත්තාගෙන් එම හානි සම්බන්ධයෙන් වන්දි මුදලක් ලබා ගත හැකිය ; එසේම එම බලය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කිසියම් තැනැත්තෙකුට සිය පරිශ්‍රය හෝ චංචල දේපළ භුක්ති විඳීමට බාධා පැමිණේ නම් ඔහුට හො ඇයට එම බාධා කිරීම වෙනුවෙන් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි නිදහස් කළ තැනැත්තාගෙන් සාධාරණ වන්දියක් ලබා ගත හැකිය.

*උපලේඛනය* 1

බලයලත් මිනින්දෝරු ඒ. එම්. එන්. කේ. ඒකනායක විසින් සාදන ලද 2008 අප්‍රේල් 30 දිනැති අංක 121 දරන මිනින්දෝරු සැලසුමෙහි දක්වා ඇති පරිදි මොරටුව නගර සීමාවෙහි පහත සීමාවන්ට යටත් වූ පරිශ්‍රය,

| | | |
|---|---|---|
| උතුරින් | : | ඉහත සඳහන් අංක 121 දරන සැළසුමෙහි ලොට් X වශයෙන් දක්වා ඇති කොටසේ ඉතිරි ප්‍රදේශයෙන්ද |
| නැගෙනහිරින් | : | ගාලු මාර්ගයෙන්ද |
| දකුණින් | : | ප්‍රයිම් ලෑන්ඩ් සමාගමට අයත් භූමියෙන්ද |
| බටහිරින් | : | අංක 121 දරණ බිම් සැළැස්මෙහි ලොට් X හි ඉතිරි කොටසින්ද |

සීමාවන හෙක්ටයාර 0.9857 ක භූමි ප්‍රදේශය.

05-626/1

## ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 10 වන වගන්තිය යටතේ ප්‍රදානය කෙරෙන
නිදහස් කිරීමේ නියෝගය

**1. නිදහස් කිරීම් ප්‍රදානය කිරීම**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 10 (01) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව (මෙහි මින් මතුවට "කොමිෂන් සභාව" ලෙස හැඳින්වෙන) අංක 01, බගතලේ පාර, කොළඹ 02 ලිපිනයේ පිහිටා ඇති ප්ලැටිනම් රියලටි ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (මෙහි මින් මතුවට නිදහස් කළ තැනැත්තා ලෙස හැඳින්වෙන) වෙත බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමක් මෙයින් ලබාදේ:

මීට යා කොට 1 වන ඇමුණුමේ වැඩිදුරටත් විස්තර කර ඇති කොළඹ 02, බගතලේ පාරේ, අංක 01 දරන පරිශ්‍රයන් තුළ මෙම නියෝගයෙහි දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, විදුලිය බෙදාහැරීම සහ සැපයීම හෝ බෙදාහැරීම හෝ සැපයීමේ සීමිත කාර්යය සඳහා.

**2. අනුමැතිය**

නිදහස් කළ තැනැත්තා 2009 අංක 20 දරන ලංකා විදුලිබල පනතේ විධිවිධානයන් ඇතුළත් ඊට පමණක් සීමා නොවූ විධිවිධානයන්ට යටත්ව විදුලිබලය සැපයීම සහ බෙදාහැරීම සිදු කිරීම පිණිස අවශ්‍ය අදාළ නීති, රෙගුලාසි සහ රීති යටතේ අවශ්‍ය සියලු අනුමැතීන් ලබා ගත යුතු ය.

**3. නිදහස් කිරීමේ කාල සීමාව**

මෙයින් ලබා දෙන නිදහස් කිරීම 2012.01.26 දින බලාත්මක වන අතර අවලංගු හෝ ඉවත් කර ගැනීම නොකළහොත්, පහතින් දක්වා ඇති නිදහස් කිරීමේ නියෝගයේ අවලංගු කිරීමේ සහ ඉවත් කර ගැනීමේ විධිවිධානයන්ට යටත්ව, 2012.01.26 දින සිට වසර පහක (05) කාලයක් බලාත්මකව පවතිනු ඇත.

**4. නිදහස් කිරීම අවලංගු කිරීම හෝ ඉවත් කර ගැනීම**

මෙම නිදහස් කිරීම පනතේ 22 වන වගන්තිය යටතේ අවලංගු කිරීම හෝ ඉවත් කර ගැනීම සිදු කළ හැකිය.

ආචාර්ය ජයතිස්ස ද කොස්තා,
සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව.

***නිදහස් කිරීමේ කොන්දේසි***

1 වන කොන්දේසිය : අර්ථ කථනය සහ ගොඩනැගීම

1. ප්‍රතිවිරුද්ධ අභිමථාර්ථයක් දිස් නොවේ නම්:

(අ) කොන්දේසිවල හෝ උපලේඛනවල භාවිතා කෙරෙන පාඨ සහ ප්‍රකාශන ඒවා නීති පැනවීමක සහ ඒවා හා අදාළ වන අර්ථකථන පනත්වල තිබෙන ආකාරයට අර්ථ දැක්වේ.

(ආ) නීති පැනවීමක් සඳහා වන පරිශීලනයන් සඳහා ප්‍රාථමික සහ ආනුෂාංගික නීති සම්පාදන ඇතුළත් වන අතර, මෙම අවස්ථා දෙකෙහිදීම, මෙම නීති සම්පාදනය බලාත්මක කෙරෙන දිනට පසුව සිදු කෙරෙන කිසියම් නවීකරණයක් හෝ ඒ සම්බන්ධයෙන් වන නැවත නීති පැනවීමක් ඇතුළත් වනු ඇත.

2. පනතේ කිසියම් විධිවිධානයක කාර්යයක් සඳහා පනතේ අර්ථ දක්වා ඇති කිසියම් පාඨයක් හෝ අර්ථ දැක්වීමක්, ප්‍රතිවිරුද්ධ අභිමථාර්ථයක් උද්ගත වුවහොත් හැර, කොන්දේසිවල හෝ උපලේඛනවල භාවිතා වන අර්ථයට සමාන අර්ථ දැක්වේ.

3. කොන්දේසි සහ උපලේඛනවල, විශේෂ කර දක්වා නොමැති නම් හෝ සංදර්භය මඟින් නියම කරනු ලබන්නේ නැතිනම්:

**"අනුබද්ධ"** නිදහස් කළ පුද්ගලයෙකු සම්බන්ධයෙන්, මෙහි අදහස වනුයේ නිදහස් කළ පුද්ගලයා අයත් සමාගම හෝ නිදහස් කළ පුද්ගලයාගේ කිසියම් අනුබද්ධ ආයතනයක් හෝ කිසියම් අයිති සමාගමක අනුබද්ධ ආයතනයක් මෙයින් අදහස් වන අතර, එම එක් එක් අවස්ථාවල එය 2007 අංක 7 දරන පනතේ අර්ථය තුළට ගැනේ;

**"අනුමත"** 4, 9, 13, 16, 19, සහ 20 වන කොන්දේසිවල කාර්යභාරය සඳහා මෙහි අර්ථය වනුයේ කොමිෂන් සභාව මඟින් අනුමත ඒවා වන අතර "අනුමත" යන්නෙහි අනුරූප අර්ථයක් පවතිනු ඇත.

**"බලපත්‍රලාභියා"** 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13 වන වගන්තිය යටතේ වලංගු බලපත්‍රයක් සහිත තැනැත්තෙකු.

**"බෙදාහැරීමේ ව්‍යාපාරය"** යනු ප්‍රධාන වශයෙන් උඩිස් රැහැන්, භූගත රැහැන්, සේවා රැහැන්, ට්‍රාන්ස්ෆෝමර්, මනු සහ අනෙකුත් උපකාරක බලගාර පිරියත සහ උපකරණ භාවිතා කරමින්, කැප කළ 33 kv ක් හෝ ඊට වඩා අඩු වෝල්ටීයතාවයක් (කලා සන්නායක අතර) සහිත බලපත්‍රකරුට අයත් සහ ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලබන සම්ප්‍රේෂණ පද්ධතියකින් හෝ නිෂ්පාදන බලාගාර හෝ වෙනත් මිලදී ගැනීමේ ස්ථානවල සිට, අවසාන පාරිභෝගිකයාගේ හෝ ලබා දීමේ ස්ථානය වෙත 33 kVක් හෝ ඊට වඩා අඩු වෝල්ටීයතාවයක් සහිත විදුලියක් මිලදී ගැනීම සඳහා කැමැත්තක් දක්වන තැනැත්තන් වෙත විදුලි බලශක්තිය ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍රලාභියාගේ බලපත්‍ර සහිත ව්‍යාපාරයකි. ;

**"නිදහස් කළ තැනැත්තා"** යනු පනතේ 10 වන වගන්තිය යටතේ විදුලිබලය බෙදාහැරීම සහ සැපයීම, හෝ බෙදාහැරීම හෝ සැපයීම සඳහා බලපත්‍ර ලබා ගැනීමෙන් නිදහස් කළ තැනැත්තෙකි;

**"විදුලිබල ව්‍යාපාරය"** යනු විදුලිබලය බෙදාහැරීමෙහි හෝ සැපයීමෙහි නිරතව සිටින කිසියම් තැනැත්තෙකි;

**"පරිපාලන සමාගම"** යනු 2007 අංක 7 දරන සමාගම් පනත තුළට අයත් පරිපාලන සමාගමකි;

**"නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතිය"** යනු මෙහි 01 වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිශ්‍රය තුළ පිහිටා ඇති සම්ප්‍රේෂණ පද්ධතියේ කොටසක් සාදන විදුලි රැහැන් සහ කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව නිදහස් කළ පුද්ගලයා විසින් නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ කොටසක් ලෙස නිදහස් කළ තැනැත්තා විසින් නිශ්චිත කර දක්වන අනෙකුත් විදුලි රැහැන් හැර නිදහස් කළ තැනැත්තාගේ සියලු විදුලි රැහැන් මාර්ග වන අතර පරිශ්‍ර වෙත විදුලිය රැගෙන යාම සඳහා භාවිතා වන නිදහස් කළ පුද්ගලයාගේ කිසියම් විදුලි බලාගාරයක්, මනු, සම්ප්‍රේෂණ සහ ස්විච්චපන්න ඊට අයත් වේ;

**"නවීකරණය"** යන්නට එකතු කිරීම්, මඟහැරීම්, සංශෝධන සහ ආදේශ කිරීම් ඇතුළත් වන අතර ඊට සමාන ප්‍රකාශන ඒ අනුව අර්ථ දැක්වෙනු ඇත;

**"PUCSL පනත"** යනු 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත වේ;

**"ආශ්‍රිත සමාගම"** යනු 2007 අංක 7 දරන සමාගම් පනත තුළට ගැනෙන ආශ්‍රිත සමාගමකි;

**"කරුණු දැක්වීම"** යන්නට ලිඛිතව සිදු කරන කිසියම් විරෝධතාවයක් හෝ වෙනත් කිසියම් යෝජනාවක් ඇතුළත් වේ;

**"අනුබද්ධ ආයතනය"** යන්නෙහි 2007 අංක 7 දරන සමාගම් පනත තුළ දක්වා ඇති අර්ථය ඇත, **"අනුබද්ධ ආයතන"** ඒ අනුව අර්ථ දැක්වෙනු ඇත;

**"සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා"** යනු පනතේ 13(1)(ඇ)(i)(ආ) වගන්තිය යටතේ විදුලිබලය සම්ප්‍රේෂණය කිරීම සඳහා බලපත්‍රලාභියෙකි, එසේම

**"සම්ප්‍රේෂණ පද්ධතිය"** යනු සම්ප්‍රේෂණ බලපත්‍රලාභියෙකුට අයත් සහ ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලබන සහ (සම්පූර්ණ වශයෙන් හෝ ප්‍රධාන වශයෙන්) ඉහළ අධිසැර විදුලි රැහැන් සහ විදුලි බලාගාරවලින් සමන්විත සහ උත්පාදන බලාගාරයක සිට උපපොලක් වෙත, එක් උත්පාදන බලාගාරයක සිට තවත් උත්පාදක බලාගාරයක් වෙත හෝ එක් උපපොලක සිට තවත් උපපොලක් දක්වා තොග සැපයුම් පාරිභෝගිකයින්ගේ (කිසියම් බෙදාහැරීමේ පද්ධතියක කොටසක් සකස් නොකරන එවැනි මාර්ග ඇතුළත් නොවේ) පරිශ්‍ර වෙත විදුලිය රැගෙන යාම සඳහා භාවිතා කෙරෙන සියලු ඉහළ අධි සැර විදුලි රැහැන් සහිත පද්ධතියක් වේ.

4. විශේෂ වශයෙන් විස්තර කර නොමැති නම්:

(අ) අනුපිළිවෙලින් අංකිත කොන්දේසියකට හෝ අංකිත උපලේඛනයකට වන කිසියම් මෙම නිදහස් කිරීමේ නියෝගයේ එම අංකය දරන කොන්දේසියට හෝ උපලේඛනයට අදාළ පරිශීලනයක් වේ;

(ආ) අංකිත උප වගන්තියකට වන කිසියම් පරිශීලනයක් එම පරිශීලනය පැන නඟින උපලේඛනයේ එම අංකය සහිත උප වගන්තියට අදාළ පරිශීලනයක් වේ;

(ඇ) අංකිත ඡේදයක් සඳහා වන කිසියම් පරිශීලනයක් එම පරිශීලනය උද්ගත වන කොන්දේසියේ හෝ උප වගන්තියේ එම අංකය දරන ඡේදය සඳහා වන පරිශීලනයක් වේ; සහ

එවැනි විචලතාවයක්, අතිරේකයක් හෝ ප්‍රතිස්ථාපනයක් සහ කිසියම් ගිවිසුමක් සඳහා වන කිසියම් පරිශීලනයක් සීමා කරන කිසියම් විධිවිධානයකට අගතියක් නොමැතිව, නිදහස් කිරීමේ නියෝගය (මෙම නිදහස් කිරීමේ නියෝගය හැර), සාර සංග්‍රහය හෝ වෙනත් උපකරණයක් යන්නට එවැනි ගිවිසුමක්, නිදහස් කිරීමේ නියෝගයක්, සාර සංග්‍රහයක් හෝ වරින්වර වෙනස් කරන ලද, අතිරේකව සපයන ලද හෝ ප්‍රතිස්ථාපනය කරන ලද උපකරණයක් ඇතුළත් වේ.

5. කිසියම් කොටසක, කොන්දේසියක, උපලේඛනයක හෝ ඡේදයක ශීර්ෂ පාඨය හෝ මාතෘකාව එහි සම්ප්‍රයුක්තියට බලපෑමක් කරනු නොලබයි.

6. කිසියම් කාල සීමාවක් තුළ සිදු කළ යුතු බවට නිදහස් කිරීමේ නියෝගයක කිසියම් බැඳීමක් ප්‍රකාශ කෙරෙන අවස්ථාවකදී, එම නිදහස් කළ තැනැත්තා නියම කළ කාල සීමාව තුළ එම පොරොන්දුව ඉටු කිරීමට අපොහොසත් වුවහොත් එම කාල සීමාවෙන් පසුව එම පොරොන්දුව අඛණ්ඩව බන්ධනීය සහ බලාත්මක වේ (නියමිත කාල සීමාව තුළ නිදහස් කළ පුද්ගලයාට එම කටයුතු ඉටු කිරීමට නොහැකි වීමේ හේතුව මත නිදහස් කළ පුද්ගලයා සම්බන්ධයෙන් ඇති සියලු හිමිකම් සහ ප්‍රතිකර්මවලට අගතියක් නොවී.)

7. මෙම නිදහස් කිරීමේ නියෝගය සහ පනත අතර කිසියම් අනනුකූලතාවයක් ඇත්නම්, එම අනනුකූලතාවයේ ප්‍රමාණයට පනත බලාත්මක වේ. පනතේ දක්වා ඇති කොන්දේසි මගින් එහි දක්වා ඇති කොන්දේසිවලට අමතරව නිදහස් කිරීමේ නියෝගයේ සංඝටනීය කොටස් සකස් වේ.

2 වන කොන්දේසිය : කොමිෂන් සභාව වෙත තොරතුරු ලබා දීම

1. නිදහස් කළ පුද්ගලයා විසින්, එම තොරතුරු කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කාල සීමාව තුළ නියම කරනු ලබන ආකාරයෙන් ලබා දිය යුතු අතර, කොන්දේසි අනුව හෝ පනත හෝ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත යටතේ කොමිෂන් සභාව වෙත නියම කර හෝ පවරා ඇති කාර්යයන් සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවන්හිදී එම වාර්තා ප්‍රසම්පාදනය කර ඉදිරිපත් කළ යුතුය.
2. 1 වන ඡේදයේ සාකල්‍යතාවයට අගතියක් නොවන ආකාරයෙන්, කොමිෂන් සභාව වෙත පිළියෙල කර සැපයිය යුතු ප්‍රමාණයට වඩා වැඩි, සහ වෙනස් ගිණුම් තොරතුරු ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව නියම කරනු ලැබිය හැක.
3. 1 වන ඡේදය යටතේ තොරතුරු ලබා දෙන ඉල්ලා සිටීම සඳහා වන කොමිෂන් සභාවේ බලය, මෙම නිදහස් කිරීමේ නියෝගයේ වෙනත් කිසියම් කොන්දේසියක් යටතේ හෝ අනුව හෝ, පනත, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත හෝ වෙනත් කිසියම් නීති සම්පාදනයක් යටතේ හෝ අනුව තොරතුරු ඉල්ලා සිටීමට ඇති බලයට අගතියක් සිදු නොවේ.
4. නිදහස් කිරීම ලබා ගෙන මාස එකක කාලයක් තුළ නිදහස් කළ තැනැත්තා බෙදාහැරීමේ ව්‍යාපාරය සඳහා වගකිව යුතු පුද්ගලයෙකු එම සංවිධානය තුළ පත් කළ යුතුය.
5. මෙම කොන්දේසිය තුළ:
"තොරතුරු" යන්නට කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන කිසියම් විස්තරාත්මක සහ ආකෘතියක පොත්, ලිපි ලේඛන, සටහන් ගිණුම්, ඇස්තමේන්තු, ප්‍රතිලබ්ධි හෝ වාර්තා (කොමිෂන් සභාවේ ඉල්ලීම අනුව විශේෂයෙන්ම පිළියෙල කරන ලද හෝ එසේ නොවන) ඇතුළත් වේ.

3 වන කොන්දේසිය : කොමිෂන් සභාවේ තීරණ, නියෝග සහ පරිසමාප්තීන්

1. නිදහස් කිරීමේ නියෝගය අනුව කොමිෂන් සභාව විසින් සාදන ලද ඕනෑම තීන්දු, නියෝග, විධාන සහ පරිසමාප්තීන්වලට නිදහස් කළ පුද්ගලයා අවනත විය යුතුය.
2. එම තීන්දු, නියෝග, විධාන සහ පරිසමාප්තීන් හා අදාළ ගාස්තු සඳහා නිදහස් කළ තැනැත්තා වගකිව යුතුය.
3. කොමිෂන් සභාව විසින් සාදන ලද කිසියම් නියෝගයක් හෝ විධානයක් හා අනුකූල වීම සඳහා නිදහස් කළ තැනැත්තා විසින් කොමිෂන් සභාවට, වෙනත් කිසියම් බලධාරියෙකුට හෝ කොමිෂන් සභාවේ නියෝගය තුළ නිශ්චිතව දක්වනු ලබන තැනැත්තෙකු විසින් කොමිෂන් සභාවට අවශ්‍ය අවස්ථාන්හිදී එහි දේපල වෙත පිවිසීමට සහ පාලනය කිරීමට ඉඩ ලබා දිය යුතුය.

4 වන කොන්දේසිය : තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවලට අනුකූල වීම

1. කොමිෂන් සභාවේ ඉල්ලීම අනුව, නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව විසින් සුදුසු බවට සලකනු ලබන කිසියම් විදුලිබල සමාගමක් විමසා කොමිෂන් සභාව විසින් වරින් වර නියම කරනු ලබන එවැනි තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ සංවර්ධනය කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය.
2. 1 වන ඡේදය අනුව සංවර්ධනය කරන ලද කිසියම් තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ ඒවා ක්‍රියාත්මක කිරීමට පෙර අනුමත කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.
3. අදාළ සාර සංග්‍රහයේ දක්වා ඇති නවීකරණ ක්‍රියාවලිය අනුව කොමිෂන් සභාව වෙත සිය යෝජනා අදාළ අවස්ථාවේදී දැනුම් දීම මගින් බලාත්මකව ඇති සාර සංග්‍රහයකට නවීකරණ යෝජනා ඉදිරිපත් කිරීමට නිදහස් කළ තැනැත්තාට පුළුවන.

4. මෙම කොන්දේසිය අනුව නිදහස් කළ තැනැත්තා විසින් සංවර්ධනය කර ක්‍රියාත්මක කරන ලද සියලු අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවල පිටපතක් නිදහස් කළ තැනැත්තා පහත අයවළුන් වෙත ලබා දීම හෝ යැවීම සිදු කළ යුතුය:

(අ) කොමිෂන් සභාව; සහ

(ආ) එය ඉල්ලා සිටින කිසියම් තැනැත්තෙකු වෙත.

5. නිදහස් කළ තැනැත්තා 4 (ආ) ඡේදය අනුව ලබා දුන් හෝ යවන ලද පිටපතක් සඳහා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝගවල මෙම කොන්දේසිය සඳහා එම අවස්ථාව අනුව නිශ්චිතව කර දක්වා ඇති මුදල නොඉක්මවන ගාස්තුවක් අය කළ හැකිය. නිදහස් කළ තැනැත්තා විසින් ඊට සුදුසු ලෙසට එහි නිශ්චිතව දක්වා ඇති ඕනෑම අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවල විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය.

6. අදාළ අවස්ථාවන්හි කොමිෂන් සභාව විසින් සුදුසු බවට සලකනු ලබන විදුලිබල සමාගම් වෙතින් විමසා, නිදහස් කළ තැනැත්තා 6 වන ඡේදය යටතේ එම නියෝගවල නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවලින් කොටසක් හෝ කොටස් සම්බන්ධයෙන් දක්වා ඇති එහි බැඳීම්වලින් නිදහස් කරමින් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන එම නියමයන් හා කොන්දේසිවලට යටත්ව කොමිෂන් සභාව විසින් නියෝග නිකුත් කරනු ඇත.

7. කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ ලැබෙන තෙක්, නිදහස් කළ තැනැත්තා සියලු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දැනට තිබෙන තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවලට අනුකූල විය යුතුය.

5 වන කොන්දේසිය : අනෙකුත් ගිවිසුම්

1. නිදහස් කළ තැනැත්තා, අදාළ බලපත්‍රලාභීන් සමඟ අයකුම සහ සම්බන්ධතා ගිවිසුම් ඇතුළුව කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන අනෙක් තැනැත්තන් සමඟ ගිවිසුම්වලට එළඹිය යුතුය.

2. කොමිෂන් සභාව විසින් නිදහස් කළ තැනැත්තා එළඹිය යුතු බවට නියෝග කර ඇති කිසියම් ගිවිසුමක් පිළියෙළ කිරීමට සහභාගී විය යුතුය.

3. මෙම කාර්යය සඳහා කොමිෂන් සභාවට සාධාරණ යයි පෙනී යන කාල පරිච්ඡේදයකට පසුව, නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව මගින් නියම කර ඇති ගිවිසුම්වලට එළඹීමට අපොහොසත් වුවහොත්, එම තැනැත්තාගේ හෝ නිදහස් කළ තැනැත්තාගේ ඉල්ලීම අනුව, නිදහස් කළ තැනැන්තා සහ ප්‍රශ්නගත පුද්ගලයා අතර වන කිසියම් අර්බුදයක ගිවිසුමේ නියමයන් කොමිෂන් සභාවට සුදුසු යැයි පෙනී යන ආකාරයට නියම කරනු ලැබේ.

6 වන කොන්දේසිය : නිදහස් කිරීමේ නියෝගය නියම කිරීම සහ බෙදාහැරීමේ ව්‍යාපාරයේ පැවරීම

1. කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත එකඟතාව නොමැතිව, නිදහස් කළ තැනැත්තා මෙම නිදහස් කිරීමේ නියෝගය සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් පැවරීම නොකළ යුතුය.

2. කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත එකගතාවයක් නොමැතිව මෙම නිදහස් කිරීමේ නියෝගය යටතේ සිදු කර ගෙන යන බෙදාහැරීමේ ව්‍යාපාරය සම්පූර්ණ වශයෙන්ම හෝ එහි කොටසක් වෙනත් පුද්ගලයෙකුට ("පැවරුම්ලාභියා") පැවරීමට, නිදහස් කළ පුද්ගලයා කටයුතු නොකළ යුතුය.

3. මෙම නිදහස් කිරීමේ නියෝගයේ කිසියම් නියම කිරීමක් සඳහා හෝ බෙදාහැරීමේ ව්‍යාපාරයේ පැවරීම සඳහා වන කොමිෂන් සභාවේ කිසියම් එකඟතාව අදාළ වන පරිදි, පැවරුම්කරු හෝ පැවරුම්ලාභියා සතුව මෙම නිදහස් කිරීමේ නියෝගයේ කොන්දේසිවලට අනුකූල වීම සඳහා වන තාක්ෂණික හා මූල්‍ය ශක්‍යතාවය තිබෙන බවට කොමිෂන් සභාවේ සෑහීමට පත් වීමට යටත් වන අතර, පැවරීමක් සම්බන්ධයෙන් පමණක් වන විට, පැවරුම්ලාභියා වෙත නිදහස් කිරීමේ නියෝගයක් ලබා දීමේදී, අදාළ ආකාරය අනුව පැවරුම්කරු හෝ පැවරුම්ලාභියා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන විට පනත අනුව මෙම නිදහස් කිරීමේ නියෝගය වෙනස් කිරීමද ඇතුළුව, කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලබන වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අනුකූල වීමට යටත් වේ.

4. මෙම කොන්දේසියේ කිසිවක් මගින් නිදහස් කළ තැනැන්තා බෙදාහැරීමේ ව්‍යාපාරය පැවරීම සඳහා කොමිෂන් සභාව එකඟතාවය ලබා දී ඇති පැවරුම්ලාභියෙකුට පැවරීමෙන් වළක්වාලන විධිවිධානයක් නොමැත, එසේ වුවද කිසියම් පැවරීමක් සඳහා එකඟතාව ලබා දුන් පසුව ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මන් අවස්ථාවක එම පැවරීම ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

7 වන කොන්දේසිය : නිදහස් කිරීමේ නියෝගය අවලංගු කිරීම හෝ ඉවත් කර ගැනීම

1. පහත දැක්වෙන අවස්ථාවන්හිදී 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 22 වන වගන්තිය යටතේ කොමිෂන් සභාවට නිදහස් කිරීමේ නියෝගය අවලංගු කළ හැකිය :

(*a*) නිදහස් කළ තැනැත්තා මෙම නිදහස් කිරීමේ නියෝගය අවලංගු කළ යුතු බවට ලිඛිතව එකඟ වේ නම් ;

(*b*) මෙම නියෝගයේ හෝ විධානයේ 2 වන කොන්දේසිය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන නියෝගයක් හෝ විධානයක් හා අනුකූල වීමට එය නිකුත් කළ දින සිට දින 60ක් තුළ හෝ එම නියෝගයේ හෝ විධානයේ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන කාල සීමාවක් තුළ නිදහස් කළ තැනැත්තා අසමත් වේ නම් ;

(*c*) පහත අවස්ථාවන්හිදී:

(i) නිදහස් කළ තැනැත්තාගේ පාලනය සම්බන්ධයෙන් වෙනස්වීමක් සිදු වුවහොත් ; සහ

(ii) නිදහස් කළ තැනැත්තා තුළ බෙදාහැරීමේ ව්‍යාපාරය සිදු කර ගෙන යාම සඳහා ඇති එහි පාර්ශ්වකරණයේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන නව පාර්ශ්වකරුවා හෝ නව පාර්ශ්වකරුවා (සිටී නම්) විසින් පත් කරනු ලබන අස්ථිත්වය සතුව බෙදාහැරීමේ ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් තාක්ෂණික, මූල්‍ය හෝ කළමනාකරණ ශක්තියක් නොමැති බවට කොමිෂන් සභාව සෑහීමට පත් වුවහොත් ; සහ

(iii) නිදහස් කළ තැනැත්තාගේ පාලනයේ වැඩිදුර වෙනස්වීමක් නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට නිවේදනය ලබා දුන් දින සිට ආරම්භ වී මාස තුනක කාලයක් තුළ සිදු වුවහොත් කොමිෂන් සභාව මෙම ඡේදය අනුව මෙම නියෝගය අවලංගු කිරීමට අදහස් කරන බව ප්‍රකාශ කරමින් කොමිෂන් සභාව නිදහස් කළ තැනැත්තා වෙත දැනුම් දීමක් කරන්නේ නම් ; සහ

(iv) එම කාලය තුළ වැඩිදුර වෙනස් වීම් සිදු නොවුවහොත් ;

(*d*) නිදහස් කළ තැනැත්තාගේ පාලනයේ වෙනස්වීමක් ඇති වී සෑහෙන සාධාරණ කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම් දීමට නිදහස් කළ තැනැත්තා අසමත් වුවහොත් ;

(*e*) කොමිෂන් සභාව විසින් සිය අභිමථය පරිදි සියලුම අවස්ථාවන්හිදී සාධාරණ යයි සලකනු ලබන ඊට වඩා කිසියම් දිගුකාලයක් ලබා දිය හැකි නිදහස් කළ තැනැත්තාගේ සාධාරණ පාලනයෙන් බැහැර බවට කොමිෂන් සභාවට සෑහීමට පත් විය හැකි, හේතුවක ප්‍රතිඵලයක් ලෙස බෙදාහැරීමේ ව්‍යාපාරය මාස තුනක අඛණ්ඩ කාලයක් තුළ ක්‍රියාත්මක කිරීම නිදහස් කළ තැනැත්තා විසින් නැවතුවහොත් ;

(*f*) මෙම නිදහස් කිරීමේ නියෝගය නිකුත් කිරීම සඳහා පදනම් වී ඇත්තේ නිදහස් කළ තැනැත්තා විසින් සැලකිය යුතු තරම් සාවද්‍ය හෝ වැරදි තොරතුරු බවට සොයා ගැනුනහොත්.

(*g*) නිදහස් කළ තැනැත්තා විසින් මෙම නිදහස් කිරීමේ නියෝගයේ කිසියම් උල්ලංඝනය/කඩ කිරීමක් සිදු කළහොත්.

8 වන කොන්දේසිය : පරිසරය

1. අනුකූල විය යුතු පාරිසරික නීති යටතේ නිදහස් කළ තැනැත්තා වෙත ලබා දිය හැකි කිසියම් නිදහස් කිරීම් හෝ සහන කාලයන්ට යටත්ව, ශ්‍රී ලංකාවේ සියලු අදාළ පාරිසරික නීති රීතිවලට අනුකූල විය යුතුය.

2. නිදහස් කළ තැනැත්තා විසින්, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන දිනයට පසු නොවන දිනයක කොමිෂන් සභාව විමසා, අදාළ සියලු පාරිසරික නීති යටතේ වන එහි කාර්යයන් සහ බැඳීම් සමඟ අනුකූල වීමට නිදහස් කළ තැනැත්තා අදහස් කරන ආකාරය නිශ්චිතව දක්වමින් ලිඛිත ප්‍රතිපත්තියක් සකස් කිරීමට, සහ වරින් වර වෙනස් කිරීමට කටයුතු කළ යුතුය.

3. කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන ආකාරයට සහ කාල සීමාවන්හි සිය පාරිසරික කාර්යසාධනය පිළිබඳව නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.

4. මෙම නිදහස් කළ නියෝගයේ අරමුණු සඳහා, "පාරිසරික නීති" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරිසරය මත යැපෙන මිනිසුන්ගේ සෞඛ්‍යය, ශාක, සතුන් සහ පරිසර පද්ධතිද ඇතුළුව පරිසරයේ ආරක්ෂාව සඳහා, වරින් වර බලාත්මකව පවතින නීති වේ, සැකය මඟහරවා ගැනීම සඳහා ඊට 1980 අංක 47 දරන ජාතික පරිසර පනත ඇතුළුව නමුත් එහෙත් ඊට සීමා නොවී පාරිසරික බලපෑම් ඇගයීම හා වායුගෝලය, ඉඩම් හා ජලය ආරක්ෂා කිරීම හා සම්බන්ධ සියලු අදාළ නීති සම්පාදන ඇතුළත් වේ.

9 වන කොන්දේසිය : සෞඛ්‍යය හා ආරක්ෂාව

1. පහත 2 ඡේදයෙහි දක්වා ඇති ආරක්ෂණ සහ තාක්ෂණික සැලැස්මක් පිළියෙළ කිරීම ඇතුළුව, බෙදාහැරීමේ ව්‍යාපාරය සිදු කර ගෙන යාමේදී නිදහස් කළ තැනැත්තා අතින් පුද්ගලයින්ට, යන්ත්‍රවලට, දේවලවලට සහ දේපළවලට සිදු වීමට ඉඩ ඇති තුවාල සහ හානිවලින් ආරක්ෂා කිරීමට නිදහස් කළ තැනැත්තා සියලු සාධාරණ පියවර ගත යුතුය.

2. නිදහස් කළ තැනැත්තා විසින් :

(*a*) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන දිනයකට පසු නොවන දිනයක කොමිෂන් සභාව විමසා බලා, ආරක්ෂක තාක්ෂණික කළමනාකරණ සැලැස්මක් පිළියෙල කොට අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය ;

(*b*) සැලැස්මේ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සහතික කිරීමට වාර්ෂිකව සමාලෝචනය කර, අවශ්‍ය වුවහොත් යාවත්කාල කර, එසේ යාවත්කාල කළ සැලැස්ම අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය ;

(*c*) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිදි සැලැස්ම (කලින් කලට යාවත්කාල කර) හා අනුකූල විය යුතුය;

(*d*) කොමිෂන් සභාවේ අනුමැතියක් නොමැතිව සැලැස්ම සංශෝධනය නොකළ යුතුය ; සහ

(*e*) සැලැස්ම යටතේ එහි බැඳීම් හා එහි අනුකූලත්වය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සහ සැලැස්මට අනුකූලව ස්වාධීන විශේෂඥයකු ලවා වාර්ෂික විගණනයක් සිදු කෙරෙන බවට වග බලා ගැනීම ;

(*f*) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇති සෞඛ්‍ය හා ආරක්ෂණ සංඛ්‍යාලේඛන සහ දර්ශක සංගෘහිත කිරීම ; සහ

(*g*) එම විගණන, සංඛ්‍යාලේඛන සහ දර්ශකවල ප්‍රතිඵල ඉක්මණින් කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම.

10 වන කොන්දේසිය : රක්ෂණය

1. නිදහස් කළ තැනැත්තා බෙදාහැරීමේ ව්‍යාපාරය හා සම්බන්ධ අවදානම් කළමනාකරණය හා රක්ෂණය හා අදාළ සාධාරණ සහ දූරදර්ශී ප්‍රතිපත්ති අනුගමනය කර ක්‍රියාත්මක කරනු ඇත.

11 වන කොන්දේසිය : රහස්‍ය තොරතුරු

1. බෙදාහැරීමේ ව්‍යාපාරය පිළිබඳව තමා වෙත ලැබෙන සියලු තොරතුරු සම්බන්ධයෙන් පහත දැ කිරීම සඳහා නිදහස් කළ තැනැත්තා වග බලා ගත යුතුය :

(*a*) කොමිෂන් සභාව විසින් එසේ නොකිරීමට අවසර දී ඇති අවස්ථාවලදී හැර, නිදහස් කළ තැනැත්තා විසින් රහස්‍ය ලෙස තබා ගන්නා බවටත්, මෙම නිදහස් කිරීමේ නියෝගය හෝ වෙනත් පරිචය සංග්‍රහයක් සහ එම රහස්‍ය තොරතුරු වෙත ලබා දෙනුයේ ඒවායේ නිසි නිත්‍යානුකූල කාර්යයන් සිදු කිරීම සඳහා, නිදහස් කළ තැනැත්තාගේ අධ්‍යක්ෂවරුන්ට, නිලධාරීන්ට සහ සේවකයින්ට පමණක් බවටත්, එසේ නැතහොත් මෙම රහස්‍යතා අවශ්‍යතාව පිළිපැදීමට ලිඛිතව එකඟ වී සිටින නිදහස් කළ තැනැත්තන්ගේ නියෝජිතයින්ට පමණක් බවටත් ;

(*b*) එම තොරතුරු ලබා දුන් අරමුණ හෝ මෙම නිදහස් කිරීමේ නියෝගයේ හෝ පරිචය සංග්‍රහයේ අවසර දී ඇති අරමුණක් සඳහා හැර වෙනත් අරමුණක් සඳහා නිදහස් කළ තැනැත්තා විසින් භාවිතා නොකරන බවට ; සහ

(*c*) බෙදාහැරීමේ ව්‍යාපාරයේ සමන්විත වන සේවාවක් නොවන සේවාවක් සැපයීමේදී කිසියම් වාණිජ වාසියක් සඳහා නිදහස් කළ තැනැත්තා විසින් භාවිතා නොකරන බවට.

12 වන කොන්දේසිය : ආරවුල් විසඳීම

1. නිදහස් කළ තැනැත්තා විසින් :

(*a*) i තමා සහ අයකුම පාරිභෝගිකයා අතර වන විසඳීමට නොහැකි අර්බුදයක් - ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද නීති අනුව සමථකරණය සහ විසඳීම සඳහා අර්බුදය කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය ;

(*b*) අර්බුදයක් (1) *අ)* ඡේදයෙන් විමර්ශනයට ලක් කරන ලද අර්බුදය නොවන වෙනත් අර්බුදයක්) - ශ්‍රී ලංකා මහජන උපයෝගීතා පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද නීති අනුව, එම නීතිය අනුව අර්බුදය විසඳීමට හෝ, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන අවස්ථාවක අර්බුදය උසාවියක් හෝ බේරුම්කරණ මණ්ඩලයක් වෙතයොමු කිරීමට එම අර්බුදය කොමිෂන් සභාව වෙත යොමු කෙරේ.

***III* කොටස බෙදාහැරීම සඳහා වන නිශ්චිත කොන්දේසි**

13 වන කොන්දේසිය : නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවය - නියමයන් ලබා දීම සඳහා වන අවශ්‍යතාව

1. නිදහස් කළ තැනැත්තා විසින්, 3, 4 සහ 5 වන ඡේදයන්ට යටත්ව,

(*a*) නිදහස් කිරීමේ නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ස්ථානය තුළ පිහිටා ඇති, නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර ඇති, පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු සමඟ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් සැපයීමට ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම ; සහ

(*b*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් නවීකරණය කිරීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර ඇති කිසියම් තැනැත්තෙකු සමඟ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියෙන් සම්බන්ධතාවයක් වෙනස් කිරීම සඳහා ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම.

2. නිදහස් කළ තැනැත්තාට එම ඉදිරිපත් වීමේ නියමයන් සකස් කිරීම සඳහා සාධාරණ කාලයක් අවශ්‍ය වන බැවින්, නිදහස් කළ තැනැත්තා, 3, 4 සහ 5 වන ඡේදයන්ට යටත්ව, ප්‍රායෝගික වශයෙන් හැකි විගස, කිසිදු විටක, එම සියලු තොරතුරු ඇතුළත්ව අයදුම්පතක් ලැබීමෙන් සති දෙකකට නොඅඩු කාලයක් තුළ, 1 වන ඡේදය අනුව පැවරීමක් සඳහා නියමයන් ඉදිරිපත් කරනු ලබයි.

3. නිදහස් කළ තැනැත්තාට නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතියේ ධාරිතාව පුළුල් කිරීමට හෝ ශක්තිමත් කිරීමට අවශ්‍ය වන විට සහ එසේ නොවන විටක, සියලු තත්ත්වයන් සැලකිල්ලට ගෙන, නිදහස් කළ තැනැත්තා විසින් එම පුළුල් කිරීම හෝ ශක්තිමත් කිරීම සිදු කිරීම මහජන හිත සුව පිණිස වන විට මෙම කොන්දේසිය අනුව, නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ ධාරිතාවය සහ සිදු කරන ලද භාවිතය හෝ භාවිතා කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කිරීම යන හේතුව මත, නිදහස් කළ තැනැත්තා නිශ්චිතව දක්වන ලද පරිශ්‍රයක කිසියම් හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු සමඟ ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීමට බැඳී නොසිටී.

4. පුද්ගලයෙකු වෙත වන සම්බන්ධතාවය මඟින් නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ ආරක්ෂාවට සහ ස්ථාවරත්වයට තර්ජනයක් ඇති කෙරෙන අවස්ථාවල, නිදහස් කළ තැනැත්තා මෙම කොන්දේසිය අනුව වෙනත් පුද්ගලයෙකු සමඟ ගිවිසුමකට එළඹීමට බැඳී නොසිටී.

5. නිදහස් කළ තැනැත්තෙකු සම්බන්ධ වීමට ඉඩ ඇති විටක, නිදහස් කළ තැනැත්තා වෙනත් තැනැත්තෙකු සමඟ පහත ආකාරයෙන් ගිවිසුමකට නොඑළඹිය යුතුය :

(*a*) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාක්ෂණික හෝ මෙහෙයුම් සංග්‍රහ උල්ලංඝනය කරමින් හෝ

(*b*) පනත හෝ පනත යටතේ සිදු කරනු ලබන නියාමයන් උල්ලංඝනය කරමින්; හෝ

(*c*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතිය හා අදාළ වන ආරක්ෂාව හෝ ප්‍රමිතිය හා සම්බන්ධ කිසියම් නීති සම්පාදනයක් උල්ලංඝනය කරමින්; හෝ

(*d*) කොමිෂන් සභාව විසින් පනවන ලද වෙනත් කිසියම් කොන්දේසි උල්ලංඝනය කරමින්

6. 3, 4 සහ 5 වන ඡේද අනුව, නිදහස් කළ තැනැත්තා වෙනත් පුද්ගලයෙකු සමඟ ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, නිදහස් කළ පුද්ගලයා විසින් ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මන් අවස්ථාවක, කුමන තත්ත්වයකදී වුවත් නිදහස් කළ තැනැත්තා වෙත එම පුද්ගලයා වෙතින් අයදුම්පතක් ලැබී සති 2ක් නොඉක්මවන කාලයක් තුළ, ප්‍රතික්ෂේප කිරීම සඳහා වන හේතුව නිශ්චිතව දක්වමින්, එසේ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව දැනුම් දිය යුතුය.

14 වන කොන්දේසිය : නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත වන සම්බන්ධතාවය - කොමිෂන් සභාවේ කාර්යයන් :

1. මෙම කාර්යය සඳහා කොමිෂන් සභාවට සාධාරණ යැයි හැඟෙන කාලයකට පසුව, 13 වන කොන්දේසිය අනුව අයදුම්පතක් ඉදිරිපත් කර හිමිකම් ලබා ඇති හෝ හිමිකම් ලබන බව කියා සිටින පුද්ගලයෙකු සමඟ ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීමට නිදහස් කළ තැනැත්තා අපොහොසත් වුවහොත්, කොමිෂන් සභාව, එම තැනැත්තාගේ හෝ නිදහස් කළ තැනැත්තාගේ ඉල්ලීමක් කළ පසුව, නිදහස් කළ තැනැත්තා සහ ප්‍රශ්නගත පුද්ගලයා අතර වන අර්බුදයේ ගිවිසුමෙහි කොන්දේසි කොමිෂන් සභාවට සාධාරණ යැයි පෙනී යන ආකාරයෙන් නියම කළ යුතුය.

2. කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ගිවිසුම මත පදනම්ව කටයුතු කිරීමට පුද්ගලයා අදහස් කරන්නේ නම්, නිදහස් කළ තැනැත්තා වහාම එහි නියමයන් අනුව ගිවිසුමක් වෙත එළඹී එය ක්‍රියාත්මක කරනු ලැබේ.

3. සම්බන්ධතාවය සඳහා, සම්බන්ධතාවයක් නවීකරණය සඳහා වන ගිවිසුමක කුමන පාර්ශවයක්, හෝ 13 වන කොන්දේසිය අනුව හෝ මෙම කොන්දේසිය අනුව නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියට ඇතුළත් වී ඇති පාර්ශ්වයක්

එම ගිවිසුම යටතේ ප්‍රතිපාදන සලසා ඇති ආකාරයට එම ගිවිසුමේ කොන්ත්‍රාත්තුමය නියමයන්ගෙන් බැහැර වීමට අදහස් කරන්නේ නම්, කොමිෂන් සභාව විසින් නිදහස් කළ තැනැත්තාගේ හෝ එම ගිවිසුමේ අනෙක් පාර්ශ්වයේ ඉල්ලීම පරිදි එම බැහැර වීම හා සම්බන්ධ ආරවුල කොමිෂන් සභාවට සාධාරණ ලෙස හැඟී යන ආකාරයට විසඳනු ලැබේ.

15 වන කොන්දේසිය : නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවය ලබාදීමේදී වෙනස් කොට නොසැලකීම.

1. නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධ වීමේ කාර්යය සඳහා වන වැඩ කටයුතු සිදු කර ගෙන යාමේදී නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් රඳවා ගැනීමක් ලබාදීමේදී, නිදහස් කළ තැනැත්තා පහත පුද්ගලයන් සම්බන්ධයෙන් අනිසි ලෙස වෙනස් ආකාරයෙන් නොසැලකිය යුතුය :

(*a*) කිසියම් පුද්ගලයන් අතර හෝ පුද්ගල පංතියක් හෝ පංති අතර ;

(*b*) නිදහස් කළ තැනැත්තන් අතර හෝ නිදහස් කළ පුද්ගලයාගේ කිසියම් අනුබද්ධ හෝ ආශ්‍රිත ව්‍යාපාරයක් සහ කිසියම් පුද්ගලයෙකු, පුද්ගල පංතියක් හෝ පංති අතර.

16 වන කොන්දේසිය : නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතිය වෙත ගාස්තු අය කිරීමේ පදනම.

1. නිදහස් කළ තැනැත්තා, ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මණින්, කුමන තත්ත්වයක වුවත් නිදහස් කිරීමේ නියෝගය බලාත්මක වී දින 28ක කාලයක් ඉක්මවීමට පෙර, නිදහස් කළ තැනැත්තාගේ පද්ධතිය වෙත වන සම්බන්ධතාව සඳහා පදනම් වූ ගාස්තු දක්වමින් ප්‍රකාශයක් සකස් කර, කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර, සම්බන්ධතාව සම්බන්ධයෙන් වන ආරක්ෂක තැන්පතු සඳහා වන ඉල්ලීම් සිදු කළ යුතුය.

2. නිදහස් කළ තැනැත්තා විසින්, කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන වරින් වර සකස් කර ඇති තොරතුර වරින් වර සංශෝධනය කර, 1 වන ඡේදය අනුව පිළියෙල කර ඇති ප්‍රකාශයේ ආකෘතිය වෙනස් කිරීම කළ යුතු අතර, අඩු වශයෙන් මෙම නිදහස් කිරීමේ ගිවිසුම බලාත්මකව ඇති සෑම වසරකම වරක්වත්, එම ප්‍රකාශයේ දක්වා ඇති තොරතුරු සියලුම වැදගත් කරුණු සම්බන්ධයෙන් අඛණ්ඩව නිවැරදිව දැක්වෙන ආකාරයට සංශෝධනය කළ යුතුය.

3. කිසියම් නිදහස් කළ තැනැත්තෙකු විසින් 1 වන උපලේඛනයේ විස්තර කර ඇති පරිශ්‍රය තුළ සිටින විදුලිබල සම්බන්ධතාවයක් ඉල්ලා ඇති තැනැත්තෙකුට සම්බන්ධතාවයක් ලබා දීමේදී, එම විදුලිබල සැපයුම ලබා දීමේදී වැය වූ වියදම්, එම වියදම් සාධාරණ ලෙස දරා ඇති ප්‍රමාණයක් දක්වා, එම තැනැත්තා විසින් දැරිය යුතු බවට නියම කිරීමට නිදහස් කළ තැනැත්තාට පුළුවන.

4. නිදහස් කළ තැනැත්තාට ලිඛිත දැනුම්දීමක් මඟින් විදුලි සම්බන්ධතාවයක් අවශ්‍ය කිසියම් තැනැත්තෙකුගෙන්, විදුලිබලය සැපයීම හේතුවෙන් උපරිම වශයෙන් නිදහස් කළ තැනැත්තා වෙත ගෙවීමට සිදු වන මාස දෙකක විදුලි පාරිභෝජන බිල්පත්වලට සමාන ගෙවීම් සාධාරණ ඇප තැන්පතුවක් ලෙස ලබා දෙන ලෙස නියම කළ හැකිය.

මෙම කොන්දේසිය නියම කර ඇති පරිදි කිසියම් පුද්ගලයෙකු එවැනි තැන්පතුවක් සපයා නොමැති විටක හෝ එම පුද්ගලයා විසින් සපයා දී ඇති ඇප තැන්පතුව ප්‍රමාණවත් නොවන විට -

(*a*) නිදහස් කළ තැනැත්තාට දැනුම් දීම සිදු කර දින 7ක් තුළණී විදුලිබලය සැපයීම හේතුවෙන් උපරිම වශයෙන් නිදහස් කළ තැනැත්තා වෙත ගෙවීමට සිදු වන මාස දෙකක විදුලි පාරිභෝජන බිල්පත් සමාන ගෙවීමක් සාධාරණ ඇප තැන්පතුවක් ලෙස ලබා දෙන ලෙස නියම කළ හැකිය ; සහ

(*b*) එම තැනැත්තා එවැනි තැන්පතුවක් ලබාදීමට අපොහොසත් වන්නේ නම්, නිදහස් කළ තැනැත්තාට, අදාළ වන පරිදි සම්බන්ධතාවය ලබාදීම ප්‍රතික්ෂේප කිරීම හෝ සැපයුම විසන්ධි කිරීම සිදු කළ හැකිය.

(*c*) මෙම කොන්දේසිය අනුව ඇප තැන්පතුවක් ලෙස නිදහස් කළ තැනැත්තා වෙත කිසියම් මුදලක් ලබා දී ඇති විටක, එම මුදල වෙනුවෙන් කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ, එම මුදල නිදහස් කළ තැනැත්තා වෙත පවතින තාක්, නිදහස් කළ තැනැත්තා විසින් වරින් වර නියම කරනු ලබන අනුපාතයක් යටතේ පොළී ගෙවිය යුතුය.

5. නිදහස් කළ තැනැත්තා විසින් 1 වන ඡේදය අනුව පිළියෙල කරන ලද ප්‍රකාශයේ පිටපතක් සහ 2 වන ඡේදය අනුව එම ප්‍රකාශය සම්බන්ධයෙන් වන එක් එක් සංශෝධනයක් කොමිෂන් සභාව වෙත එවිය යුතුය. එම එක් එක් සංශෝධනයක් සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය අවශ්‍ය වන අතර කොමිෂන් සභාව අනුමත කරන තෙක් බලාත්මක නොවේ.

6. නිදහස් කළ තැනැත්තා විසින්, 1 වන ඡේදය අනුව පිළියෙල කළ ප්‍රකාශයේ පිටපතක් හෝ (අදාළ පරිදි) 2 වන ඡේදය අනුව පිළියෙල කළ එම ප්‍රකාශයේ අලුත්ම සංශෝධනයක් එම ඡේද යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කර, එම ප්‍රකාශයේ පිටපතක් ඉල්ලා සිටි තැනැත්තා වෙත ලබාදීම හෝ යැවීම කළ යුතුය.

7. නිදහස් කළ තැනැත්තා විසින් 4 වන ඡේදය අනුව ලබා දෙන හෝ යවන කිසියම් ප්‍රකාශනයක් සඳහා, එසේ ප්‍රකාශයක් ලබා දීම සඳහා නිදහස් කළ තැනැත්තාට වැය වන සාධාරණ වියදම් පිළිබිඹු වන සහ මෙම කොන්දේසියේ අරමුණ වෙනුවෙන් කොමිෂන්

සභාව විසින් වරින් වර නිකුත් කරන නියෝගයන්හි නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණය නොඉක්මවන කිසියම් ගාස්තුවක් අය කිරීමට කටයුතු කරනු ලැබේ.

17 වන කොන්දේසිය : සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට සහ අනෙකුත් බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ට තොරතුරු සැපයීම

1. නිදහස් කළ තැනැත්තා විසින්, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගෙන් සිය අනාගත බලශක්ති අවශ්‍යතා පිළිබඳ පුරෝකථනය කිරීමට ප්‍රමාණවත් වාර්තා සහ පහත දැක්වෙන දෑ සම්බන්ධ විස්තරද ඇතුළුව, එම අවශ්‍යතාවයේ ඉල්ලුම් පැතිකඩක් පවත්වා ගත යුතුය :

(*a*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ තාක්ෂණික සහ තාක්ෂණික නොවන හානි ;

(*b*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියට සම්බන්ධ කර ඇති ජෙනරේටර් (ඇත්නම්) මගින් සපයනු ලබන බලශක්තිය ;

(*c*) නව සම්බන්ධතාවල බලපෑම ; සහ

(*d*) ඉල්ලුම් කළමනාකරණයේ බලපෑම.

(*e*) විවිධ පාරිභෝගික කාණ්ඩවල ධාරා චරිතාංග

2. සමස්ත පද්ධතියේ ආරක්ෂිත සහ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වයක්, සම්බන්ධීකෘත සංවර්ධනයක් සහ අන්තර් ක්‍රියාකාරීත්වයක් සහතික කිරීමට නිදහස් කළ තැනැත්තා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට සහ අනෙක් බෙදාහැරීම් බලපත්‍රලාභීන්ට, සාධාරණ වශයෙන් අවශ්‍ය වන ආකාරයෙන් සහ අවශ්‍ය අවස්ථාවන්හිදී, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා සහ අනෙක් බෙදාහැරීම් බලපත්‍රලාභීන් විසින් සාධාරණ වශයෙන් ඉල්ලා සිටින එම තොරතුරු සහ පුරෝකථන ඉදිරිපත් කළ යුතුය.

3. මෙම කොන්දේසිය තුළ :

"සමස්ත පද්ධතිය" යනු සියලු අනෙකුත් බෙදාහැරීම් බලපත්‍රලාභීන්ගේ සම්ප්‍රේෂණ පද්ධතිය, බලපත්‍රලාභියාගේ බෙදාහැරීමේ පද්ධති සහ බෙදාහැරීම් පද්ධතිවල සමස්තය වේ.

***IV* වන කොටස : සැපයීම සඳහා වන නිශ්චිත කොන්දේසි**

18 වන කොන්දේසිය : සැපයීමේදී වෙනස් කර සැලකීම තහනම් කිරීම

1. නිදහස් කළ තැනැත්තා, පාරිභෝගිකයින් වෙත විදුලිය සැපයීම සඳහා නියමයන් ඉදිරිපත් කිරීමේදී :

(*a*) කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට අනිසි විශේෂත්වයක් දැක්වීම;

(*b*) කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට අනිසි විශේෂත්වයක් ක්‍රියාවෙන් සිදු කිරීම; හෝ

(*c*) අනවශ්‍ය ලෙස දුෂ්කර නියමයන් පැනවීම.

2. මෙම කොන්දේසියේ අරමුණු සඳහා, පාරිභෝගිකයින් වෙත විදුලිය සැපයීමෙන් ලැබෙන ආදායම, එම විදුලිය සැපයීම සඳහා වන වියදමට වඩා සැලකිය යුතු ලෙස ඉහළ නම්, එම නියමයන් අනවශ්‍ය ලෙස දුෂ්කර වේ.

3. මෙම කොන්දේසියේ අරමුණ සඳහා, ප්‍රශ්නගත පාරිභෝගිකයින් වෙත විදුලිය සැපයීමේදී වැය වන වියදම් සාධාරණ ලෙස ආවරණය නොවන ගාස්තු හා එම කොන්දේසි සම්බන්ධ වේද යන්න පිළිබඳව නිසි ලෙස සලකා බලා, එම නියමයක් අනවශ්‍ය ලෙස දුෂ්කරදැයි යන ප්‍රශ්නය පිළිබඳව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

4. මෙම කොන්දේසියේ :

"නියමයන්" යනු විදුලිය සැපයීමේ ඇගයීමට සැලකිය යුතු ලෙස බලපාන මිල සම්බන්ධයෙන් වන නියමයන්ද ඇතුළුව, විදුලිය සැපයුම ඉදිරිපත් කරන හෝ ලබාදෙන නියමයන් වේ.

19 වන කොන්දේසිය : අයකුම ලේඛනය සැපයීම

1. නිදහස් කළ තැනැත්තා, මෙම නියෝගය බලාත්මක වී ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මණින්, කිසිදු හේතුවක් මත, මෙම වගන්තියේ අරමුණ වෙනුවෙන් නිදහස් කළ තැනැත්තා වෙත නිකුත් කරන ලද නියෝගයන්හි කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන දිනකට පසු නොවන දිනයක හෝ ඉන් පසුව වරින් වර, විදුලි පාරිභෝගිකයින් සඳහා විදුලිය අලෙවි කරනු ලබන අයකුම ලේඛනයක් පිළියෙල කළ යුතුය.

2. අයකුම ලේඛනයක් :

(*a*) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආකෘතියෙන් තිබිය යුතුය ;

(*b*) කිසියම් පාරිභෝගිකයෙකුට විදුලිය මිලදී ගැනීම සඳහා ගෙවිය යුතු ගාස්තුවල සාධාරණ ඇස්තමේන්තුවක් සාදා ගැනීමට හැකි වන අවශ්‍ය වන විස්තර සහිත විය යුතුය ;

(*c*) වසරේ, දවසේ හෝ සතියේ නියමිත කාල සීමාවල සහ දහවල් හා රාත්‍රී කාලයන්හි විදුලිය සැපයීමේදී නිදහස් කළ තැනැත්තා දරන වියදම් පිළිබිඹු වන බවට කොමිෂන් සභාව විසින් අනුමත කරන ක්‍රමවේදයක් අනුව සහ කාර්යක්ෂම ආකාරයෙන් මෙම නිදහස් කිරීමේ නියෝගයෙන් බලය ලබා දී ඇති ක්‍රියාකාරකම් ඉටු කිරීමේදී සාධාරණ ලෙස වැය වන සියලු වියදම් අය කර ගැනීමට නිදහස් කළ පුද්ගලයාට අවසර ලබා දෙන පරිදි සකස් වී තිබිය යුතුය ; සහ

(*d*) පහත දැ වෙන වෙනම හඳුනාගත යුතුය :

(*a*) නිදහස් කළ තැනැත්තාගේ විදුලිය මිලට ගැනීමේ පිරිවැය

(*b*) පොරොත්තු හෝ හදිසි ජෙනරේටර්වල මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය

(*c*) බෙදාහැරීමේ පද්ධති මෙහෙයුම් හා කළමනාකරණ නඩත්තු ගාස්තුව

3. නිදහස් කළ තැනැත්තා විසින් නියම කරනු ලබන එවැනි අයකුම සංකීර්ණ වීම හේතුවෙන්, සරල පැහැදිලි කිරීමේ ප්‍රකාශ අවශ්‍ය බවට කොමිෂන් සභාවට හැඟුනහොත්, පාරිභෝගිකයින්හට පහසුවෙන් අවබෝධ කර ගැනීමට සුදුසු පරිදි, නිදහස් කළ තැනැත්තාට එකී පැහැදිලි කිරීමේ ප්‍රකාශ පිළියෙල කරන ලෙසත් ඉන් පසුව ඒවා අයකුම ලේඛනයේ පළ කරන ලෙසත් නියම කිරීමට කොමිෂන් සභාවට පුළුවන.

4. නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව වෙතින් සැපයුම් අයකුම ලේඛනය සඳහා අනුමැතිය ලබා ගත යුතුය.

5. වෙනත් කිසියම් තැනැත්තෙකු වෙත ලබාදීමට දින 14කට වඩා නොවැඩි කාලයක් තුළ, නිදහස් කළ තැනැත්තා අයකුම ලේඛනවල පිටපතක් (වරින් වර සංශෝධනයට ලක් කරනු ලබන පරිදි) කොමිෂන් සභාව වෙත ලබාදීම හෝ යැවීම සිදු කළ යුතුය.

6. කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන පරිදි නිදහස් කළ තැනැත්තා අයකුම ලේඛනය ප්‍රකාශයට පත් කළ යුතුය.

7. නිදහස් කළ තැනැත්තා (8 වන ඡේදයට යටත්ව) අයකුම ලේඛනයේ සහ කිසියම් පැහැදිලි කිරීමේ ප්‍රකාශනයේ) වරින් වර සංශෝධනයට ලක් කරනු ලබන පරිදි) පිටපතක් එවැන්නක් ඉල්ලා සිටින ඕනෑම තැනැත්තෙකු වෙත ලබාදීම හෝ යැවීම සිදු කළ යුතුය.

8. නිදහස් කළ තැනැත්තා, 7 වන ඡේදය අනුව ලබා දුන් හෝ යවන ලද අයකුම ලේඛනයේ ඕනෑම පිටපතක් සඳහා සහ කිසියම් පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් (වරින්වර සංශෝධනය කරන ලද) සඳහා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝගයන්හි මෙම වගන්තියේ අරමුණ වෙනුවෙන් අදාළ කාලය තුළ නිශ්චිතව දක්වා ඇති මුදල නොඉක්මවන ගාස්තුවක් අය කරනු ලැබේ.

9. නියෝගවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට, හෝ නියෝගවල දක්වා ඇති අරමුණු ඉටු කර ගත හැකි ආකාරයට, නිදහස් කළ තැනැත්තා වරින් වර අයකුම ලේඛනය වෙනස් කළ යුතු බවට, නියම කරමින් කොමිෂන් සභාව විසින් නිදහස් කළ තැනැත්තා වෙත නියෝග ලබා දෙන අතර නිදහස් කළ තැනැත්තා එවැනි නියෝගයන් හා වහාම අනුකූල විය යුතුය.

10. අයකුමලේඛනය සමාලෝචනය කිරීම සඳහා වන ක්‍රියාමාර්ගයක් කොමිෂන් සභාව නිර්දේශ කළ යුතුය.

20 වන කොන්දේසිය : අයකුම ගිවිසුම බෙදාහැරීම සහ සැපයීම

1. නිදහස් කළ තැනැත්තා විදුලි පාරිභෝගිකයෙකු සමඟ හෝ විදුලිබල පාරිභෝගිකයෙකු වීමට අපේක්ෂා කරන තැනැත්තෙකු සමඟ ගිවිසුමකට එළඹීමට (පහත 3 වන ඡේදයට සහ 14 වන කොන්දේසියට යටත්ව) ඉදිරිපත් වනු ඇති අතර, එම විදුලිය අලෙවි කිරීම හා සම්බන්ධයෙන් අය කළ යුතු ගාස්තු සඳහා වන විධිවිධාන සැලසීම සහ ඉහත 19 වන කොන්දේසියෙහි තීරණය කරනු ලබන අයකුම ලේඛනයෙන් පරිශීලනය ලබා දී ඇති ආකාරයට ඉදිරිපත් කළ යුතුය.

2. ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මණින්, කුමන තත්ත්වයේ වුවත් අර්පනයේ නියමයන් සැකසීම සඳහා නිදහස් කළ තැනැත්තා විසින් සාධාරණ ලෙස ඉල්ලා සිටින එම සියලු තොරතුරු සහිත අයදුම්පතක් නිදහස් කළ තැනැත්තා වෙත ලැබී සති 02කට නොවැඩි කාලයක් තුළ, නිදහස් කළ තැනැත්තා ගිවිසුම සඳහා වන නියමයන් ඉදිරිපත් කළ යුතුය.

3. නිදහස් කළ තැනැත්තා කිසියම් ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම තුළ නිදහස් කළ තැනැත්තෙකු සම්බන්ධ වේ නම් මෙම කොන්දේසියෙන් බැඳී නොසිටී :

(*a*) පනත යටතේ වන කාර්යයන් උල්ලංඝනය වන ආකාරයෙන් ;

(*b*) පනත යටතේ හෝ බෙදාහැරීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් වන ආරක්ෂාව හා ප්‍රමිතිය සම්බන්ධ වෙනත් කිසියම් නීති පැනවීමක් යටතේ සාදන ලද කිසියම් රෙගුලාසි උල්ලංඝනය වන ආකාරයෙන් ;

(*c*) මෙම නිදහස් කිරීමේ නියෝගය උල්ලංඝනය වන ආකාරයෙන් ; හෝ

(*d*) කිසියම් අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සාර සංග්‍රහ උල්ලංඝනය වන ආකාරයෙන්.

4. මෙම කොන්දේසිය යටතේ ගිවිසුමකට එළඹීම සඳහා නිදහස් කළ තැනැත්තෙකු සතු බැඳීම 25 වන කොන්දේසිය අනුව එළඹෙන සම්බන්ධතා ගිවිසුමට සුදුසු පරිදි වගන්ති ඇතුල් කිරීමෙන් ඉටු කර ගත හැකි වේ.

21 වන කොන්දේසිය - පරිශ්‍රයන් තුළට ඇතුළු වීම

1. මෙම නිදහස් කිරීමේ නියෝගය යටතේ කිසියම් පරිශ්‍රයකට ඇතුළු වීමේදී ඒ බව නිදහස් කළ තැනැත්තා හෝ නිදහස් කළ තැනැත්තා විසින් බලය දී ඇති තැනැත්තෙකු විසින් දැනුම් දිය යුතු අතර පහත අවස්ථාවන් සපුරා නැති නම් එසේ කිරීමට ඉල්ලා සිටීමට හෝ අයිතියක් ලෙස සලකා ඇතුළු වීමට නොහැක -

(*a*) නිදහස් කළ තැනැත්තාගේ බලයලත් නිලධාරියා විසින් හෝ නිදහස් කළ තැනැත්තා විසින් සිදු කිරීමට අදහස් කරන කටයුතුවල ස්වභාවය සහ ප්‍රමාණය දක්වමින් කිසියම් පරිශ්‍රයකට ඇතුළු වීමට දින තුනකට පෙර දැනුම් දී තිබීම ;

(*b*) අවශ්‍ය වුවහොත්, ඔහු හෝ ඇය ඔහුගේ හෝ ඇයගේ බලය පිළිබඳ සාක්ෂි සපයා තිබීම ;

(*c*) මෙම ඇතුළු වීම හේතුවෙන් ඉඩමට හෝ පරිශ්‍රයට කිසියම් බාධා කිරීමක්, අක්‍රිය කිරීමක, හානියක් සිදු වේ නම් එහි හිමිකරුට ඒ සඳහා සාධාරණ වන්දි මුදලක් ගෙවා තිබීම.

2. නිදහස් කළ තැනැත්තා හෝ තමා වෙනුවෙන් නිදහස් කළ තැනැත්තා විසින් ලිඛිතව බලය පවරා ඇති තැනැත්තෙකු, (1) (අ) ඡේදයෙහි විස්තර කර ඇති පරිදි දැනුම් දීමක් ලබා දීමේ අරමුණ සඳහා ඉඩමට ඇතුළු වීම සඳහා හිමිකම් ලබයි.

3. මෙම අයිතමය යටතේ පැවරී ඇති කිසියම් බලතලයක් ක්‍රියාවේ යෙදවීමේදී, නිදහස් කළ තැනැත්තා විසින් ලිඛිතව බලය ලබා දී ඇති තැනැත්තා ලවා එසේ ඇතුළු වීමේදී පරිශ්‍රයට සිදු වන හානිය සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කළ යුතුය.

4. මෙම නිදහස් කිරීමේ නියෝගය අනුව හෝ යටතේ පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීමේදී, පරිශ්‍රයට හෝ කිසියම් චංචල දේපලකට හානියක් සිදු වුවහොත්, අදාළ පරිශ්‍රයේ හෝ චංචල දේපලවල භාරකරුට ක්‍රියාවේ යොදවන ලබන බලය සහිත නිදහස් කළ තැනැත්තාගෙන් එම හානි සම්බන්ධයෙන් වන්දි මුදලක් ලබා ගත හැකිය ; එසේම එම බලය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කිසියම් තැනැත්තෙකුට සිය පරිශ්‍රය හෝ චංචල දේපළ භුක්ති විඳීමට බාධා පැමිණේ නම් ඔහුට හෝ ඇයට එම බාධා කිරීම වෙනුවෙන් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි නිදහස් කළ තැනැත්තාගෙන් සාධාරණ වන්දියක් ලබා ගත හැකිය.

**උපලේඛනය 1**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ පිහිටි, 2009.09.03 දිනැති අංක ME/PBP/BA41/8 අනුව සාදන ලද අංක 01, බගතලේ පාර, කොළඹ 02 ලිපිනයේ පිහිටා ඇති පරිශ්‍රය.

05-626/2

---

## ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 10 වන වගන්තිය යටතේ ප්‍රදානය කෙරෙන
නිදහස් කිරීමේ නියෝගය

**1. නිදහස් කිරීම් ප්‍රදානය කිරීම**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 10 (01) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව (මෙහි මින් මතුවට "කොමිෂන් සභාව" ලෙස හැඳින්වෙන) අංක 200, යූනියන් පෙදෙස, කොළඹ 02 ලිපිනයේ පිහිටා ඇති යූනියන් රෙසිඩන්සිස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (මෙහි මින් මතුවට නිදහස් කළ තැනැත්තා ලෙස හැඳින්වෙන) වෙත බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යයතාවයෙන් නිදහස් කිරීමක් මෙයින් ලබා දේ:

මීට යා කොට 1 වන ඇමුණුමේ වැඩිදුරටත් විස්තර කර ඇති කොළඹ 02, යූනියන් පෙදෙස, අංක 200 දරන පරිශ්‍රයන් තුළ මෙම නියෝගයෙහි දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, විදුලිය බෙදාහැරීම සහ සැපයීම හෝ බෙදාහැරීම හෝ සැපයීමේ සීමිත කාර්යය සඳහා.

**2. අනුමැතිය**

නිදහස් කළ තැනැත්තා 2009 අංක 20 දරන ලංකා විදුලිබල පනතේ විධිවිධානයන් ඇතුළත් ඊට පමණක් සීමා නොවූ විධිවිධානයන්ට යටත්ව විදුලිබලය සැපයීම සහ බෙදාහැරීම සිදු කිරීම පිණිස අවශ්‍යය අදාළ නීති, රෙගුලාසි සහ රීති යටතේ අවශ්‍යය සියලු අනුමැතීන් ලබා ගත යුතු ය.

**3. නිදහස් කිරීමේ කාල සීමාව**

මෙයින් ලබා දෙන නිදහස් කිරීම 2012.01.26 දින බලාත්මක වන අතර අවලංගු හෝ ඉවත් කර ගැනීම නොකළහොත්, පහතින් දක්වා ඇති නිදහස් කිරීමේ නියෝගයේ අවලංගු කිරීමේ සහ ඉවත් කර ගැනීමේ විධිවිධානයන්ට යටත්ව, 2012.01.26 දින සිට වසර පහක (05) කාලයක් බලාත්මකව පවතිනු ඇත.

**4. නිදහස් කිරීම අවලංගු කිරීම හෝ ඉවත් කර ගැනීම**

මෙම නිදහස් කිරීම පනතේ 22 වන වගන්තිය යටතේ අවලංගු කිරීම හෝ ඉවත් කර ගැනීම සිදු කළ හැකිය.

ආචාර්ය ජයතිස්ස ද කොස්තා,
සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව.

***නිදහස් කිරීමේ කොන්දේසි***

1 වන කොන්දේසිය ඃ අර්ථකථනය සහ ගොඩනැගීම

1. ප්‍රතිවිරුද්ධ අභිමථාර්ථයක් දිස් නොවේ නම්ඃ

(අ) කොන්දේසිවල හෝ උපලේඛනවල භාවිතා කෙරෙන පාඨ සහ ප්‍රකාශන ඒවා නීති පැනවීමක සහ ඒවා හා අදාළ වන අර්ථකථන පනත්වල තිබෙන ආකාරයට අර්ථ දැක්වේ.

(ආ) නීති පැනවීමක් සඳහා වන පරිශීලනයන් සඳහා ප්‍රාථමික සහ ආනුෂාංගික නීති සම්පාදන ඇතුළත් වන අතර, මෙම අවස්ථා දෙකෙහිදීම, මෙම නීති සම්පාදනය බලාත්මක කෙරෙන දිනට පසුව සිදු කෙරෙන කිසියම් නවීකරණයක් හෝ ඒ සම්බන්ධයෙන් වන නැවත නීති පැනවීමක් ඇතුළත් වනු ඇත.

2. පනතේ කිසියම් විධිවිධානයක කාර්යයක් සඳහා පනතේ අර්ථ දක්වා ඇති කිසියම් පාඨයක් හෝ අර්ථ දැක්වීමක්, ප්‍රතිවිරුද්ධ අභිමථාර්ථයක් උද්ගත වුවහොත් හැර, කොන්දේසිවල හෝ උපලේඛනවල භාවිතා වන අර්ථයට සමාන අර්ථ දැක්වේ.

3. කොන්දේසි සහ උපලේඛනවල, විශේෂ කර දක්වා නොමැති නම් හෝ සංදර්භය මඟින් නියම කරනු ලබන්නේ නැතිනම්ඃ

"**අනුබද්ධ**" නිදහස් කළ පුද්ගලයෙකු සම්බන්ධයෙන්, මෙහි අදහස වනුයේ නිදහස් කළ පුද්ගලයා අයත් සමාගම හෝ නිදහස් කළ පුද්ගලයාගේ කිසියම් අනුබද්ධ ආයතනයක් හෝ කිසියම් අයිති සමාගමක අනුබද්ධ ආයතනයක් මෙයින් අදහස් වන අතර, එම එක් එක් අවස්ථාවල එය 2007 අංක 7 දරන පනතේ අර්ථය තුළට ගැනේ;

"**අනුමත**" 4, 9, 13, 16, 19, සහ 20 වන කොන්දේසිවල කාර්යභාරය සඳහා මෙහි අර්ථය වනුයේ කොමිෂන් සභාව මඟින් අනුමත ඒවා වන අතර "අනුමත" යන්නෙහි අනුරූප අර්ථයක් පවතිනු ඇත.

"**බලපත්‍රලාභියා**" 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13 වන වගන්තිය යටතේ වලංගු බලපත්‍රයක් සහිත තැනැත්තෙකු.

"**බෙදාහැරීමේ ව්‍යාපාරය**" යනු ප්‍රධාන වශයෙන් උඩිස් රැහැන්, භූගත රැහැන්, සේවා රැහැන්, ට්‍රාන්ස්ෆෝමර්, මනු සහ අනෙකුත් උපකාරක බලගාර පිරියත සහ උපකරණ භාවිතා කරමින්, කැප කළ 33 kv ක් හෝ ඊට වඩා අඩු වෝල්ටීයතාවයක් (කලා සන්නායක අතර) සහිත බලපත්‍රකරුට අයත් සහ ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලබන සම්ප්‍රේෂණ පද්ධතියකින් හෝ නිෂ්පාදන බලාගාර හෝ වෙනත් මිලදී ගැනීමේ ස්ථානවල සිට, අවසාන පාරිභෝගිකයාගේ හෝ ලබා දීමේ ස්ථානය වෙත 33 kVක් හෝ ඊට වඩා අඩු වෝල්ටීයතාවයක් සහිත විදුලියක් මිලදී ගැනීම සඳහා කැමැත්ත දක්වන තැනැත්තන් වෙත විදුලි බලශක්තිය ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍රලාභියාගේ බලපත්‍ර සහිත ව්‍යාපාරයකි. ;

"**නිදහස් කළ තැනැත්තා**" යනු පනතේ 10 වන වගන්තිය යටතේ විදුලිබලය බෙදාහැරීම සහ සැපයීම, හෝ බෙදාහැරීම හෝ සැපයීම සඳහා බලපත්‍ර ලබා ගැනීමෙන් නිදහස් කළ තැනැත්තෙකි;

"**විදුලිබල ව්‍යාපාරය**" යනු විදුලිබලය බෙදාහැරීමෙහි හෝ සැපයීමෙහි නිරතව සිටින කිසියම් තැනැත්තෙකි;

"**පරිපාලන සමාගම**" යනු 2007 අංක 7 දරන සමාගම් පනත තුළට අයත් පරිපාලන සමාගමකි;

"**නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතිය**" යනු මෙහි 01 වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිශ්‍රය තුළ පිහිටා ඇති සම්ප්‍රේෂණ පද්ධතියේ කොටසක් සාදන විදුලි රැහැන් සහ කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව නිදහස් කළ පුද්ගලයා විසින් නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ කොටසක් ලෙස නිදහස් කළ තැනැත්තා විසින් නිශ්චිත කර දක්වන අනෙකුත් විදුලි රැහැන් හැර නිදහස් කළ තැනැත්තාගේ සියලු විදුලි රැහැන් මාර්ග වන අතර පරිශ්‍ර වෙත විදුලිය රැගෙන යාම සඳහා භාවිතා වන නිදහස් කළ පුද්ගලයාගේ කිසියම් විදුලි බලාගාරයක්, මනු, සම්ප්‍රේෂණ සහ ස්විච්චපන්න ඊට අයත් වේ;

"**නවීකරණය**" යන්නට එකතු කිරීම්, මඟහැරීම්, සංශෝධන සහ ආදේශ කිරීම් ඇතුළත් වන අතර ඊට සමාන ප්‍රකාශන ඒ අනුව අර්ථ දැක්වෙනු ඇත;

"**PUCSL පනත**" යනු 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත වේ;
"**ආශ්‍රිත සමාගම**" යනු 2007 අංක 7 දරන සමාගම් පනත තුළට ගැනෙන ආශ්‍රිත සමාගමකි;

"**කරුණු දැක්වීම**" යන්නට ලිඛිතව සිදු කරන කිසියම් විරෝධතාවයක් හෝ වෙනත් කිසියම් යෝජනාවක් ඇතුළත් වේ;

"**අනුබද්ධ ආයතනය**" යන්නෙහි 2007 අංක 7 දරන සමාගම් පනත තුළ දක්වා ඇති අර්ථය ඇත, "**අනුබද්ධ ආයතන**" ඒ අනුව අර්ථ දැක්වෙනු ඇත;

"**සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා**" යනු පනතේ 13(1)(ඇ)(i)(ආ) වගන්තිය යටතේ විදුලිබලය සම්ප්‍රේෂණය කිරීම සඳහා බලපත්‍රලාභියෙකි, එසේම

"**සම්ප්‍රේෂණ පද්ධතිය**" යනු සම්ප්‍රේෂණ බලපත්‍රලාභියෙකුට අයත් සහ ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලබන සහ (සම්පූර්ණ වශයෙන් හෝ ප්‍රධාන වශයෙන්) ඉහළ අධිසැර විදුලි රැහැන් සහ විදුලි බලාගාරවලින් සමන්විත සහ උත්පාදන බලාගාරයක සිට උපපොලක් වෙත, එක් උත්පාදන බලාගාරයක සිට තවත් උත්පාදක බලාගාරයක් වෙත හෝ එක් උපපොලක සිට තවත් උපපොලක් දක්වා තොග සැපයුම් පාරිභෝගිකයින්ගේ (කිසියම් බෙදාහැරීමේ පද්ධතියක කොටසක් සකස් නොකරන එවැනි මාර්ග ඇතුළත් නොවේ) පරිශ්‍ර වෙත විදුලිය රැගෙන යාම සඳහා භාවිතා කෙරෙන සියලු ඉහළ අධි සැර විදුලි රැහැන් සහිත පද්ධතියක් වේ.

4. විශේෂ වශයෙන් විස්තර කර නොමැති නම්:

(අ) අනුපිළිවෙලින් අංකිත කොන්දේසියකට හෝ අංකිත උපලේඛනයකට වන කිසියම් මෙම නිදහස් කිරීමේ නියෝගයේ එම අංකය දරන කොන්දේසියට හෝ උපලේඛනයට අදාළ පරිශීලනයක් වේ;

(ආ) අංකිත උප වගන්තියකට වන කිසියම් පරිශීලනයක් එම පරිශීලනය පැන නගින උපලේඛනයේ එම අංකය සහිත උප වගන්තියට අදාළ පරිශීලනයක් වේ;

(ඇ) අංකිත ඡේදයක් සඳහා වන කිසියම් පරිශීලනයක් එම පරිශීලනය උද්ගත වන කොන්දේසියේ හෝ උප වගන්තියේ එම අංකය දරන ඡේදය සඳහා වන පරිශීලනයක් වේ; සහ

එවැනි විචලතාවයක්, අතිරේකයක් හෝ ප්‍රතිස්ථාපනයක් සහ කිසියම් ගිවිසුමක් සඳහා වන කිසියම් පරිශීලනයක් සීමා කරන කිසියම් විධිවිධානයකට අගතියක් නොමැතිව, නිදහස් කිරීමේ නියෝගය (මෙම නිදහස් කිරීමේ නියෝගය හැර), සාර සංග්‍රහය හෝ වෙනත් උපකරණයක් යන්නට එවැනි ගිවිසුමක්, නිදහස් කිරීමේ නියෝගයක්, සාර සංග්‍රහයක් හෝ වරින් වෙනස් කරන ලද, අතිරේකව සපයන ලද හෝ ප්‍රතිස්ථාපනය කරන ලද උපකරණයක් ඇතුළත් වේ.

5. කිසියම් කොටසක, කොන්දේසියක, උපලේඛනයක හෝ ඡේදයක ශීර්ෂ පාඨය හෝ මාතෘකාව එහි සම්ප්‍රයුක්තියට බලපෑමක් කරනු නොලබයි.

6. කිසියම් කාල සීමාවක් තුළ සිදු කළ යුතු බවට නිදහස් කිරීමේ නියෝගයක කිසියම් බැඳීමක් ප්‍රකාශ කෙරෙන අවස්ථාවකදී, එම නිදහස් කළ තැනැත්තා නියම කළ කාල සීමාව තුළ එම පොරොන්දුව ඉටු කිරීමට අපොහොසත් වුවහොත් එම කාල සීමාවෙන් පසුව එම පොරොන්දුව අඛණ්ඩව බන්ධනීය සහ බලාත්මක වේ (නියමිත කාල සීමාව තුළ නිදහස් කළ පුද්ගලයාට එම කටයුතු ඉටු කිරීමට නොහැකි වීමේ හේතුව මත නිදහස් කළ පුද්ගලයා සම්බන්ධයෙන් ඇති සියලු හිමිකම් සහ ප්‍රතිකර්මවලට අගතියක් නොවී.)

7. මෙම නිදහස් කිරීමේ නියෝගය සහ පනත අතර කිසියම් අනනුකූලතාවයක් ඇත්නම්, එම අනනුකූලතාවයේ ප්‍රමාණයට පනත බලාත්මක වේ. පනතේ දක්වා ඇති කොන්දේසි මගින් එහි දක්වා ඇති කොන්දේසිවලට අමතරව නිදහස් කිරීමේ නියෝගයේ සංඝටනීය කොටස් සකස් වේ.

2 වන කොන්දේසිය : කොමිෂන් සභාව වෙත තොරතුරු ලබා දීම

1. නිදහස් කළ පුද්ගලයා විසින්, එම තොරතුරු කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කාල සීමාව තුළ නියම කරනු ලබන ආකාරයෙන් ලබා දිය යුතු අතර, කොන්දේසි අනුව හෝ පනත හෝ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත යටතේ කොමිෂන් සභාව වෙත නියම කර හෝ පවරා ඇති කාර්යයන් සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවන්හිදී එම වාර්තා ප්‍රසම්පාදනය කර ඉදිරිපත් කළ යුතුය.

2. 1 වන ඡේදයේ සාකල්‍යතාවයට අගතියක් නොවන ආකාරයෙන්, කොමිෂන් සභාව වෙත පිළියෙල කර සැපයිය යුතු ප්‍රමාණයට වඩා වැඩි, සහ වෙනස් ගිණුම් තොරතුරු ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව නියම කරනු ලැබිය හැක.

3. 1 වන ඡේදය යටතේ තොරතුරු ලබා දෙන ඉල්ලා සිටීම සඳහා වන කොමිෂන් සභාවේ බලය, මෙම නිදහස් කිරීමේ නියෝගයේ වෙනත් කිසියම් කොන්දේසියක් යටතේ හෝ අනුව හෝ, පනත, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත හෝ වෙනත් කිසියම් නීති සම්පාදනයක් යටතේ හෝ අනුව තොරතුරු ඉල්ලා සිටීමට ඇති බලයට අගතියක් සිදු නොවේ.

4. නිදහස් කිරීම ලබා ගෙන මාස එකක කාලයක් තුළ නිදහස් කළ තැනැත්තා බෙදාහැරීමේ ව්‍යාපාරය සඳහා වගකිව යුතු පුද්ගලයෙකු එම සංවිධානය තුළ පත් කළ යුතුය.

5. මෙම කොන්දේසිය තුළ:
"තොරතුරු" යන්නට කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන කිසියම් විස්තරාත්මක සහ ආකෘතියක පොත්, ලිපි ලේඛන, සටහන් ගිණුම්, ඇස්තමේන්තු, ප්‍රතිලබ්ධි හෝ වාර්තා (කොමිෂන් සභාවේ ඉල්ලීම අනුව විශේෂයෙන්ම පිළියෙල කරන ලද හෝ එසේ නොවන) ඇතුළත් වේ.

3 වන කොන්දේසිය : කොමිෂන් සභාවේ තීරණ, නියෝග සහ පරිසමාප්තීන්

1. නිදහස් කිරීමේ නියෝගය අනුව කොමිෂන් සභාව විසින් සාදන ලද ඕනෑම තීන්දු, නියෝග, විධාන සහ පරිසමාප්තීන්වලට නිදහස් කළ පුද්ගලයා අවනත විය යුතුය.

2. එම තීන්දු, නියෝග, විධාන සහ පරිසමාප්තීන් හා අදාළ ගාස්තු සඳහා නිදහස් කළ තැනැත්තා වගකිව යුතුය.

3. කොමිෂන් සභාව විසින් සාදන ලද කිසියම් නියෝගයක් හෝ විධානයක් හා අනුකූල වීම සඳහා නිදහස් කළ තැනැත්තා විසින් කොමිෂන් සභාවට, වෙනත් කිසියම් බලධාරියෙකුට හෝ කොමිෂන් සභාවේ නියෝගය තුළ නිශ්චිතව දක්වනු ලබන තැනැත්තෙකු විසින් කොමිෂන් සභාවට අවශ්‍ය අවස්ථාන්හිදී එහි දේපල වෙත පිවිසීමට සහ පාලනය කිරීමට ඉඩ ලබා දිය යුතුය.

4 වන කොන්දේසිය : තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවලට අනුකූල වීම

1. කොමිෂන් සභාවේ ඉල්ලීම අනුව, නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව විසින් සුදුසු බවට සලකනු ලබන කිසියම් විදුලිබල සමාගමක් විමසා කොමිෂන් සභාව විසින් වරින් වර නියම කරනු ලබන එවැනි තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ සංවර්ධනය කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය.

2. 1 වන ඡේදය අනුව සංවර්ධනය කරන ලද කිසියම් තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ ඒවා ක්‍රියාත්මක කිරීමට පෙර අනුමත කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

3. අදාළ සාර සංග්‍රහයේ දක්වා ඇති නවීකරණ ක්‍රියාවලිය අනුව කොමිෂන් සභාව වෙත සිය යෝජනා අදාළ අවස්ථාවේදී දැනුම් දීම මඟින් බලාත්මකව ඇති සාර සංග්‍රහයකට නවීකරණ යෝජනා ඉදිරිපත් කිරීමට නිදහස් කළ තැනැත්තාට පුළුවන.
4. මෙම කොන්දේසිය අනුව නිදහස් කළ තැනැත්තා විසින් සංවර්ධනය කර ක්‍රියාත්මක කරන ලද සියලු අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවල පිටපතක් නිදහස් කළ තැනැත්තා පහත අයවළුන් වෙත ලබා දීම හෝ යැවීම සිදු කළ යුතුය:

(අ) කොමිෂන් සභාව; සහ

(ආ) එය ඉල්ලා සිටින කිසියම් තැනැත්තෙකු වෙත.

5. නිදහස් කළ තැනැත්තා 4 (ආ) ඡේදය අනුව ලබා දුන් හෝ යවන ලද පිටපතක් සඳහා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝගවල මෙම කොන්දේසිය සඳහා එම අවස්ථාව අනුව නිශ්චිතව කර දක්වා ඇති මුදල නොඉක්මවන ගාස්තුවක් අය කළ හැකිය. නිදහස් කළ තැනැත්තා විසින් ඊට සුදුසු ලෙසට එහි නිශ්චිතව දක්වා ඇති ඕනෑම අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවල විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය.

6. අදාළ අවස්ථාවන්හි කොමිෂන් සභාව විසින් සුදුසු බවට සලකනු ලබන විදුලිබල සමාගම් වෙතින් විමසා, නිදහස් කළ තැනැත්තා 6 වන ඡේදය යටතේ එම නියෝගවල නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවලින් කොටසක් හෝ කොටස් සම්බන්ධයෙන් දක්වා ඇති එහි බැඳීම්වලින් නිදහස් කරමින් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන එම නියමයන් හා කොන්දේසිවලට යටත්ව කොමිෂන් සභාව විසින් නියෝග නිකුත් කරනු ඇත.

7. කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ ලැබෙන තෙක්, නිදහස් කළ තැනැත්තා සියලු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දැනට තිබෙන තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවලට අනුකූල විය යුතුය.

5 වන කොන්දේසිය : අනෙකුත් ගිවිසුම්

1. නිදහස් කළ තැනැත්තා, අදාළ බලපත්‍රලාභීන් සමඟ අයකුම සහ සම්බන්ධතා ගිවිසුම් ඇතුළුව කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන අනෙක් තැනැත්තන් සමඟ ගිවිසුම්වලට එළඹිය යුතුය.

2. කොමිෂන් සභාව විසින් නිදහස් කළ තැනැත්තා එළඹිය යුතු බවට නියෝග කර ඇති කිසියම් ගිවිසුමක් පිළියෙළ කිරීමට සහභාගී විය යුතුය.

3. මෙම කාර්යය සඳහා කොමිෂන් සභාවට සාධාරණ යයි පෙනී යන කාල පරිච්ඡේදයකට පසුව, නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව මඟින් නියම කර ඇති ගිවිසුම්වලට එළඹීමට අපොහොසත් වුවහොත්, එම තැනැත්තාගේ හෝ නිදහස් කළ තැනැත්තාගේ ඉල්ලීම අනුව, නිදහස් කළ තැනැත්තා සහ ප්‍රශ්නගත පුද්ගලයා අතර වන කිසියම් අර්බුදයක ගිවිසුමේ නියමයන් කොමිෂන් සභාවට සුදුසු යැයි පෙනී යන ආකාරයට නියම කරනු ලැබේ.

6 වන කොන්දේසිය : නිදහස් කිරීමේ නියෝගය නියම කිරීම සහ බෙදාහැරීමේ ව්‍යාපාරයේ පැවරීම

1. කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත එකඟතාව නොමැතිව, නිදහස් කළ තැනැත්තා මෙම නිදහස් කිරීමේ නියෝගය සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් පැවරීම නොකළ යුතුය.

2. කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත එකගතාවයක් නොමැතිව මෙම නිදහස් කිරීමේ නියෝගය යටතේ සිදු කර ගෙන යන බෙදාහැරීමේ ව්‍යාපාරය සම්පූර්ණ වශයෙන්ම හෝ එහි කොටසක් වෙනත් පුද්ගලයෙකුට ("පැවරුම්ලාභියා") පැවරීමට, නිදහස් කළ පුද්ගලයා කටයුතු නොකළ යුතුය.

3. මෙම නිදහස් කිරීමේ නියෝගයේ කිසියම් නියම කිරීමක් සඳහා හෝ බෙදාහැරීමේ ව්‍යාපාරයේ පැවරීම සඳහා වන කොමිෂන් සභාවේ කිසියම් එකඟතාව අදාළ වන පරිදි, පැවරුම්කරු හෝ පැවරුම්ලාභියා සතුව මෙම නිදහස් කිරීමේ නියෝගයේ කොන්දේසිවලට අනුකූල වීම සඳහා වන තාක්ෂණික හා මූල්‍ය ශක්‍යතාවය තිබෙන බවට කොමිෂන් සභාවේ සෑහීමට පත් වීමට යටත් වන අතර, පැවරීමක් සම්බන්ධයෙන් පමණක් වන විට, පැවරුම්ලාභියා වෙත නිදහස් කිරීමේ නියෝගයක් ලබා දීමේදී, අදාළ ආකාරය අනුව පැවරුම්කරු හෝ පැවරුම්ලාභියා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන විට පනත අනුව මෙම නිදහස් කිරීමේ නියෝගය වෙනස් කිරීමද ඇතුළුව, කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලබන වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අනුකූල වීමට යටත් වේ.

4. මෙම කොන්දේසියේ කිසිවක් මඟින් නිදහස් කළ තැනැත්තා බෙදාහැරීමේ ව්‍යාපාරය පැවරීම සඳහා කොමිෂන් සභාව එකඟතාවය ලබා දී ඇති පැවරුම්ලාභියෙකුට පැවරීමෙන් වළක්වාලන විධිවිධානයක් නොමැත. එසේ වුවද කිසියම් පැවරීමක් සඳහා එකඟතාව ලබා දුන් පසුව ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මන් අවස්ථාවක එම පැවරීම ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

7 වන කොන්දේසිය : නිදහස් කිරීමේ නියෝගය අවලංගු කිරීම හෝ ඉවත් කර ගැනීම

1. පහත දැක්වෙන අවස්ථාවන්හිදී 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 22 වන වගන්තිය යටතේ කොමිෂන් සභාවට නිදහස් කිරීමේ නියෝගය අවලංගු කළ හැකිය :
   (*a*) නිදහස් කළ තැනැත්තා මෙම නිදහස් කිරීමේ නියෝගය අවලංගු කළ යුතු බවට ලිඛිතව එකඟ වේ නම් ;

   (*b*) මෙම නියෝගයේ හෝ විධානයේ 2 වන කොන්දේසිය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන නියෝගයක් හෝ විධානයක් හා අනුකූල වීමට එය නිකුත් කළ දින සිට දින 60ක් තුළ හෝ එම නියෝගයේ හෝ විධානයේ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන කාල සීමාවක් තුළ නිදහස් කළ තැනැත්තා අසමත් වේ නම් ;

   (*c*) පහත අවස්ථාවන්හිදී:

      (i) නිදහස් කළ තැනැත්තාගේ පාලනය සම්බන්ධයෙන් වෙනස්වීමක් සිදු වුවහොත් ; සහ

      (ii) නිදහස් කළ තැනැත්තා තුළ බෙදාහැරීමේ ව්‍යාපාරය සිදු කර ගෙන යාම සඳහා ඇති එහි පාර්ශ්වකරණයේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන නව පාර්ශ්වකරුවා හෝ නව පාර්ශ්වකරුවා (සිටී නම්) විසින් පත් කරනු ලබන අස්ථිත්වය සතුව බෙදාහැරීමේ ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් තාක්ෂණික, මූල්‍ය හෝ කළමනාකරණ ශක්තියක් නොමැති බවට කොමිෂන් සභාව සෑහීමට පත් වුවහොත් ; සහ

      (iii) නිදහස් කළ තැනැත්තාගේ පාලනයේ වැඩිදුර වෙනස්වීමක් නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට නිවේදනය ලබා දුන් දින සිට ආරම්භ වී මාස තුනක කාලයක් තුළ සිදු වුවහොත් කොමිෂන් සභාව මෙම ඡේදය අනුව මෙම නියෝගය අවලංගු කිරීමට අදහස් කරන බව ප්‍රකාශ කරමින් කොමිෂන් සභාව නිදහස් කළ තැනැත්තා වෙත දැනුම් දීමක් කරන්නේ නම් ; සහ

      (iv) එම කාලය තුළ වැඩිදුර වෙනස් වීම් සිදු නොවුවහොත් ;

   (*d*) නිදහස් කළ තැනැත්තාගේ පාලනයේ වෙනස්වීමක් ඇති වී සෑහෙන සාධාරණ කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම් දීමට නිදහස් කළ තැනැත්තා අසමත් වුවහොත් ;

(*e*) කොමිෂන් සභාව විසින් සිය අභිමථය පරිදි සියලුම අවස්ථාවන්හිදී සාධාරණ යයි සලකනු ලබන ඊට වඩා කිසියම් දිගුකාලයක් ලබා දිය හැකි නිදහස් කළ තැනැත්තාගේ සාධාරණ පාලනයෙන් බැහැර බවට කොමිෂන් සභාවට සෑහීමට පත් විය හැකි, හේතුවක ප්‍රතිඵලයක් ලෙස බෙදාහැරීමේ ව්‍යාපාරය මාස තුනක අඛණ්ඩ කාලයක් තුළ ක්‍රියාත්මක කිරීම නිදහස් කළ තැනැත්තා විසින් නැවතුවහොත් ;

(*f*) මෙම නිදහස් කිරීමේ නියෝගය නිකුත් කිරීම සඳහා පදනම් වී ඇත්තේ නිදහස් කළ තැනැත්තා විසින් සැලකිය යුතු තරම් සාවද්‍ය හෝ වැරදි තොරතුරු බවට සොයා ගැනුනහොත්.

(*g*) නිදහස් කළ තැනැත්තා විසින් මෙම නිදහස් කිරීමේ නියෝගයේ කිසියම් උල්ලංඝනය/කඩ කිරීමක් සිදු කළහොත්.

8 වන කොන්දේසිය : පරිසරය

1. අනුකූල විය යුතු පාරිසරික නීති යටතේ නිදහස් කළ තැනැත්තා වෙත ලබා දිය හැකි කිසියම් නිදහස් කිරීම් හෝ සහන කාලයන්ට යටත්ව, ශ්‍රී ලංකාවේ සියලු අදාළ පාරිසරික නීති රීතිවලට අනුකූල විය යුතුය.

2. නිදහස් කළ තැනැත්තා විසින්, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන දිනයට පසු නොවන දිනයක කොමිෂන් සභාව විමසා, අදාළ සියලු පාරිසරික නීති යටතේ වන එහි කාර්යයන් සහ බැඳීම් සමඟ අනුකූල වීමට නිදහස් කළ තැනැත්තා අදහස් කරන ආකාරය නිශ්චිතව දක්වමින් ලිඛිත ප්‍රතිපත්තියක් සකස් කිරීමට, සහ වරින් වර වෙනස් කිරීමට කටයුතු කළ යුතුය.

3. කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන ආකාරයට සහ කාල සීමාවන්හි සිය පාරිසරික කාර්යසාධනය පිළිබඳව නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.

4. මෙම නිදහස් කළ නියෝගයේ අරමුණු සඳහා, "පාරිසරික නීති" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරිසරය මත යැපෙන මිනිසුන්ගේ සෞඛ්‍යය, ශාක, සතුන් සහ පරිසර පද්ධතිද ඇතුළුව පරිසරයේ ආරක්ෂාව සඳහා, වරින් වර බලාත්මකව පවතින නීති වේ, සැකය මඟහරවා ගැනීම සඳහා ඊට 1980 අංක 47 දරන ජාතික පරිසර පනත ඇතුළුව නමුත් එහෙත් ඊට සීමා නොවී පාරිසරික බලපෑම් ඇගයීම හා වායුගෝලය, ඉඩම් හා ජලය ආරක්ෂා කිරීම හා සම්බන්ධ සියලු අදාළ නීති සම්පාදන ඇතුළත් වේ.

9 වන කොන්දේසිය : සෞඛ්‍යය හා ආරක්ෂාව

1. පහත 2 ඡේදයෙහි දක්වා ඇති ආරක්ෂණ සහ තාක්ෂණික සැලැස්මක් පිළියෙළ කිරීම ඇතුළුව, බෙදාහැරීමේ ව්‍යාපාරය සිදු කර ගෙන යාමේදී නිදහස් කළ තැනැත්තා අතින් පුද්ගලයින්ට, යන්ත්‍රවලට, දේපලවලට සහ දේපළවලට සිදු වීමට ඉඩ ඇති තුවාල සහ හානිවලින් ආරක්ෂා කිරීමට නිදහස් කළ තැනැත්තා සියලු සාධාරණ පියවර ගත යුතුය.

2. නිදහස් කළ තැනැත්තා විසින් :

    (*a*) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන දිනයකට පසු නොවන දිනයක කොමිෂන් සභාව විමසා බලා, ආරක්ෂක තාක්ෂණික කළමනාකරණ සැලැස්මක් පිළියෙල කොට අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය ;

    (*b*) සැලැස්මේ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සහතික කිරීමට වාර්ෂිකව සමාලෝචනය කර, අවශ්‍ය වුවහොත් යාවත්කාල කර, එසේ යාවත්කාල කළ සැලැස්ම අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය ;

    (*c*) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිදි සැලැස්ම (කලින් කලට යාවත්කාල කර) හා අනුකූල විය යුතුය;

    (*d*) කොමිෂන් සභාවේ අනුමැතියක් නොමැතිව සැලැස්ම සංශෝධනය නොකළ යුතුය ; සහ

    (*e*) සැලැස්ම යටතේ එහි බැඳීම් හා එහි අනුකූලත්වය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සහ සැලැස්මට අනුකූලව ස්වාධීන විශේෂඥයකු ලවා වාර්ෂික විගණනයක් සිදු කෙරෙන බවට වග බලා ගැනීම ;

    (*f*) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇති සෞඛ්‍ය හා ආරක්ෂණ සංඛ්‍යාලේඛන සහ දර්ශක සංගෘහිත කිරීම ; සහ

    (*g*) එම විගණන, සංඛ්‍යාලේඛන සහ දර්ශකවල ප්‍රතිඵල ඉක්මණින් කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම.

10 වන කොන්දේසිය : රක්ෂණය

1. නිදහස් කළ තැනැත්තා බෙදාහැරීමේ ව්‍යාපාරය හා සම්බන්ධ අවදානම් කළමනාකරණය හා රක්ෂණය හා අදාළ සාධාරණ සහ දූරදර්ශී ප්‍රතිපත්ති අනුගමනය කර ක්‍රියාත්මක කරනු ඇත.

11 වන කොන්දේසිය : රහස්‍ය තොරතුරු

1. බෙදාහැරීමේ ව්‍යාපාරය පිළිබඳව තමා වෙත ලැබෙන සියලු තොරතුරු සම්බන්ධයෙන් පහත දැ කිරීම සඳහා නිදහස් කළ තැනැත්තා වග බලා ගත යුතුය :

(*a*) කොමිෂන් සභාව විසින් එසේ නොකිරීමට අවසර දී ඇති අවස්ථාවලදී හැර, නිදහස් කළ තැනැත්තා විසින් රහස්‍ය ලෙස තබා ගන්නා බවටත්, මෙම නිදහස් කිරීමේ නියෝගය හෝ වෙනත් පරිචය සංග්‍රහයක් සහ එම රහස්‍ය තොරතුරු වෙත ලබා දෙනුයේ ඒවායේ නිසි නිත්‍යානුකූල කාර්යයන් සිදු කිරීම සඳහා, නිදහස් කළ තැනැත්තාගේ අධ්‍යක්ෂවරුන්ට, නිලධාරීන්ට සහ සේවකයින්ට පමණක් බවටත්, එසේ නැතහොත් මෙම රහස්‍යතා අවශ්‍යතාව පිළිපැදීමට ලිඛිතව එකඟ වී සිටින නිදහස් කළ තැනැත්තන්ගේ නියෝජිතයින්ට පමණක් බවටත් ;

(*b*) එම තොරතුරු ලබා දුන් අරමුණ හෝ මෙම නිදහස් කිරීමේ නියෝගයේ හෝ පරිචය සංග්‍රහයේ අවසර දී ඇති අරමුණක් සඳහා හැර වෙනත් අරමුණක් සඳහා නිදහස් කළ තැනැත්තා විසින් භාවිතා නොකරන බවට ; සහ

(*c*) බෙදාහැරීමේ ව්‍යාපාරයේ සමන්විත වන සේවාවක් නොවන සේවාවක් සැපයීමේදී කිසියම් වාණිජ වාසියක් සඳහා නිදහස් කළ තැනැත්තා විසින් භාවිතා නොකරන බවට.

12 වන කොන්දේසිය : ආරවුල් විසඳීම

1. නිදහස් කළ තැනැත්තා විසින් :

(*a*) i තමා සහ අයකුම පාරිභෝගිකයා අතර වන විසඳීමට නොහැකි අර්බුදයක් - ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද නීති අනුව සමථකරණය සහ විසඳීම සඳහා අර්බුදය කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය ;

(*b*) අර්බුදයක් (1) *අ)* ඡේදයෙන් විමර්ශනයට ලක් කරන ලද අර්බුදය නොවන වෙනත් අර්බුදයක්) - ශ්‍රී ලංකා මහජන උපයෝගීතා පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද නීති අනුව, එම නීතිය අනුව අර්බුදය විසඳීමට හෝ, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන අවස්ථාවක අර්බුදය උසාවියක් හෝ බේරුම්කරණ මණ්ඩලයක් වෙතයොමු කිරීමට එම අර්බුදය කොමිෂන් සභාව වෙත යොමු කෙරේ.

***III* කොටස බෙදාහැරීම සඳහා වන නිශ්චිත කොන්දේසි**

13 වන කොන්දේසිය : නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවය - නියමයන් ලබා දීම සඳහා වන අවශ්‍යතාව

1. නිදහස් කළ තැනැත්තා විසින්, 4, 3 සහ 5 වන ඡේදයන්ට යටත්ව,

(*a*) නිදහස් කිරීමේ නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ස්ථානය තුළ පිහිටා ඇති, නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර ඇති, පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු සමඟ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් සැපයීමට ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම ; සහ

(*b*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් නවීකරණය කිරීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර ඇති කිසියම් තැනැත්තෙකු සමඟ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියෙන් සම්බන්ධතාවයක් වෙනස් කිරීම සඳහා ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම.

2. නිදහස් කළ තැනැත්තාට එම ඉදිරිපත් වීමේ නියමයන් සකස් කිරීම සඳහා සාධාරණ කාලයක් අවශ්‍ය වන බැවින්, නිදහස් කළ තැනැත්තා, 4, 3 සහ 5 වන ඡේදයන්ට යටත්ව, ප්‍රායෝගික වශයෙන් හැකි විගස, කිසිදු විටක, එම සියලු තොරතුරු ඇතුළත්ව අයදුම්පතක් ලැබීමෙන් සති දෙකකට නොඅඩු කාලයක් තුළ, 1 වන ඡේදය අනුව පැවරීමක් සඳහා නියමයන් ඉදරිපත් කරනු ලබයි.

3. නිදහස් කළ තැනැත්තාට නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතියේ ධාරිතාව පුළුල් කිරීමට හෝ ශක්තිමත් කිරීමට අවශ්‍ය වන විට සහ එසේ නොවන විටක, සියලු තත්ත්වයන් සැලකිල්ලට ගෙන, නිදහස් කළ තැනැත්තා විසින් එම පුළුල් කිරීම හෝ ශක්තිමත් කිරීම සිදු කිරීම මහජන හිත සුව පිණිස වන විට මෙම කොන්දේසිය අනුව, නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ

ධාරිතාවය සහ සිදු කරන ලද භාවිතය හෝ භාවිතා කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කිරීම යන හේතුව මත, නිදහස් කළ තැනැත්තා නිශ්චිතව දක්වන ලද පරිශ්‍රයක කිසියම් හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු සමග ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීමට බැඳී නොසිටී.

4. පුද්ගලයෙකු වෙත වන සම්බන්ධතාවය මගින් නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ ආරක්ෂාවට සහ ස්ථාවරත්වයට තර්ජනයක් ඇති කෙරෙන අවස්ථාවල, නිදහස් කළ තැනැත්තා මෙම කොන්දේසිය අනුව වෙනත් පුද්ගලයෙකු සමග ගිවිසුමකට එළඹීමට බැඳී නොසිටී.

5. නිදහස් කළ තැනැත්තෙකු සම්බන්ධ වීමට ඉඩ ඇති විටක, නිදහස් කළ තැනැත්තා වෙනත් තැනැත්තෙකු සමඟ පහත ආකාරයෙන් ගිවිසුමකට නොඑළඹිය යුතුය ෘ

(*a*) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාක්ෂණික හෝ මෙහෙයුම් සංග්‍රහ උල්ලංඝනය කරමින් හෝ

(*b*) පනත හෝ පනත යටතේ සිදු කරනු ලබන නියාමයන් උල්ලංඝනය කරමින්; හෝ

(*c*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතිය හා අදාළ වන ආරක්ෂාව හෝ ප්‍රමිතිය හා සම්බන්ධ කිසියම් නීති සම්පාදනයක් උල්ලංඝනය කරමින්; හෝ

(*d*) කොමිෂන් සභාව විසින් පනවන ලද වෙනත් කිසියම් කොන්දේසි උල්ලංඝනය කරමින්

6. 4, 3 සහ 5 වන ඡෙද අනුව, නිදහස් කළ තැනැත්තා වෙනත් පුද්ගලයෙකු සමග ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, නිදහස් කළ පුද්ගලයා විසින් ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මන් අවස්ථාවක, කුමන තත්ත්වයකදී වුවත් නිදහස් කළ තැනැත්තා වෙත එම පුද්ගලයා වෙතින් අයදුම්පතක් ලැබී සති 2ක් නොඉක්මවන කාලයක් තුළ, ප්‍රතික්ෂේප කිරීම සඳහා වන හේතුව නිශ්චිතව දක්වමින්, එසේ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව දැනුම් දිය යුතුය.

14 වන කොන්දේසිය ෘ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත වන සම්බන්ධතාවය - කොමිෂන් සභාවේ කාර්යයන්

1. මෙම කාර්යය සඳහා කොමිෂන් සභාවට සාධාරණ යැයි හැඟෙන කාලයකට පසුව, 13 වන කොන්දේසිය අනුව අයදුම්පතක් ඉදිරිපත් කර හිමිකම් ලබා ඇති හෝ හිමිකම් ලබන බව කියා සිටින පුද්ගලයෙකු සමග ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීමට නිදහස් කළ තැනැත්තා අපොහොසත් වුවහොත්, කොමිෂන් සභාව, එම තැනැත්තාගේ හෝ නිදහස් කළ තැනැත්තාගේ ඉල්ලීමක් කළ පසුව, නිදහස් කළ තැනැත්තා සහ ප්‍රශ්නගත පුද්ගලයා අතර වන අර්බුදයේ ගිවිසුමෙහි කොන්දේසි කොමිෂන් සභාවට සාධාරණ යැයි පෙනී යන ආකාරයෙන් නියම කළ යුතුය.

2. කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ගිවිසුම මත පදනම්ව කටයුතු කිරිමට පුද්ගලයා අදහස් කරන්නේ නම්, නිදහස් කළ තැනැත්තා වහාම එහි නියමයන් අනුව ගිවිසුමක් වෙත එළඹී එය ක්‍රියාත්මක කරනු ලැබේ.

3. සම්බන්ධතාවය සඳහා, සම්බන්ධතාවයක් නවීකරණය සඳහා වන ගිවිසුමක කුමන පාර්ශ්වයක්, හෝ 13 වන කොන්දේසිය අනුව හෝ මෙම කොන්දේසිය අනුව නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියට ඇතුළත් වී ඇති පාර්ශ්වයක් එම ගිවිසුම යටතේ ප්‍රතිපාදන සලසා ඇති ආකාරයට එම ගිවිසුමේ කොන්ත්‍රාත්තුමය නියමයන්ගෙන් බැහැර වීමට අදහස් කරන්නේ නම්, කොමිෂන් සභාව විසින් නිදහස් කළ තැනැත්තාගේ හෝ එම ගිවිසුමේ අනෙක් පාර්ශ්වයේ ඉල්ලීම පරිදි එම බැහැර වීම හා සම්බන්ධ ආරවුල කොමිෂන් සභාවට සාධාරණ ලෙස හැඟී යන ආකාරයට විසඳනු ලැබේ.

15 වන කොන්දේසිය ෘ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවය ලබා දීමේදී වෙනස් කොට නොසැලකීම

1. නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධ වීමේ කාර්යය සඳහා වන වැඩ කටයුතු සිදු කර ගෙන යාමේදී නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් රඳවා ගැනීමක් ලබා දීමේදී, නිදහස් කළ තැනැත්තා පහත පුද්ගලයන් සම්බන්ධයෙන් අනිසි ලෙස වෙනස් ආකාරයෙන් නොසැලකිය යුතුය ෘ

(*a*) කිසියම් පුද්ගලයන් අතර හෝ පුද්ගල පංතියක් හෝ පංති අතර ;

(*b*) නිදහස් කළ තැනැත්තන් අතර හෝ නිදහස් කළ පුද්ගලයාගේ කිසියම් අනුබද්ධ හෝ ආශ්‍රිත ව්‍යාපාරයක් සහ කිසියම් පුද්ගලයෙකු, පුද්ගල පංතියක් හෝ පංති අතර.

16 වන කොන්දේසිය ෘ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතිය වෙත ගාස්තු අය කිරීමේ පදනම

1. නිදහස් කළ තැනැත්තා, ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මණින්, කුමන තත්ත්වයක වුවත් නිදහස් කිරීමේ නියෝගය බලාත්මක වී දින 28ක කාලයක් ඉක්මවීමට පෙර, නිදහස් කළ තැනැත්තාගේ පද්ධතිය වෙත වන සම්බන්ධතාව සඳහා පදනම් වූ ගාස්තු දක්වමින් ප්‍රකාශයක් සකස් කර, කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර, සම්බන්ධතාව සම්බන්ධයෙන් වන ආරක්ෂක තැන්පතු සඳහා වන ඉල්ලීම් සිදු කළ යුතුය.

2. නිදහස් කළ තැනැත්තා විසින්, කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන වරින් වර සකස් කර ඇති තොරතුර වරින් වර සංශෝධනය කර, 1 වන ඡේදය අනුව පිළියෙල කර ඇති ප්‍රකාශයේ ආකෘතිය වෙනස් කිරීම කළ යුතු අතර, අඩු වශයෙන් මෙම නිදහස් කිරීමේ ගිවිසුම බලාත්මකව ඇති සෑම වසරකම වරක්වත්, එම ප්‍රකාශයේ දක්වා ඇති තොරතුරු සියලුම වැදගත් කරුණු සම්බන්ධයෙන් අඛණ්ඩව නිවැරදිව දැක්වෙන ආකාරයට සංශෝධනය කළ යුතුය.

3. කිසියම් නිදහස් කළ තැනැත්තෙකු විසින් 1 වන උපලේඛනයේ විස්තර කර ඇති පරිශ්‍රය තුළ සිටින විදුලිබල සම්බන්ධතාවයක් ඉල්ලා ඇති තැනැත්තෙකුට සම්බන්ධතාවයක් ලබා දීමේදී, එම විදුලිබල සැපයුම ලබා දීමේදී වැය වූ වියදම්, එම වියදම් සාධාරණ ලෙස දරා ඇති ප්‍රමාණයක් දක්වා, එම තැනැත්තා විසින් දැරිය යුතු බවට නියම කිරීමට නිදහස් කළ තැනැත්තාට පුළුවන.

4. නිදහස් කළ තැනැත්තාට ලිඛිත දැනුම් දීමක් මගින් විදුලි සම්බන්ධතාවයක් අවශ්‍ය කිසියම් තැනැත්තෙකුගෙන්, විදුලිබලය සැපයීම හේතුවෙන් උපරිම වශයෙන් නිදහස් කළ තැනැත්තා වෙත ගෙවීමට සිදු වන මාස දෙකක විදුලි පාරිභෝජන බිල්පත්වලට සමාන ගෙවීම් සාධාරණ ඇප තැන්පතුවක් ලෙස ලබා දෙන ලෙස නියම කළ හැකිය.

මෙම කොන්දේසිය නියම කර ඇති පරිදි කිසියම් පුද්ගලයෙකු එවැනි තැන්පතුවක් සපයා නොමැති විටක හෝ එම පුද්ගලයා විසින් සපයා දී ඇති ඇප තැන්පතුව ප්‍රමාණවත් නොවන විට -

(*a*) නිදහස් කළ තැනැත්තාට දැනුම් දීම සිදු කර දින 7ක් තුළ, විදුලිබලය සැපයීම හේතුවෙන් උපරිම වශයෙන් නිදහස් කළ තැනැත්තා වෙත ගෙවීමට සිදු වන මාස දෙකක විදුලි පාරිභෝජන බිල්පත් සමාන ගෙවීමක් සාධාරණ ඇප තැන්පතුවක් ලෙස ලබා දෙන ලෙස නියම කළ හැකිය ; සහ

(*b*) එම තැනැත්තා එවැනි තැන්පතුවක් ලබා දීමට අපොහොසත් වන්නේ නම්, නිදහස් කළ තැනැත්තාට, අදාළ වන පරිදි සම්බන්ධතාවය ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හෝ සැපයුම විසන්ධි කිරීම සිදු කළ හැකිය.

(*c*) මෙම කොන්දේසිය අනුව ඇප තැන්පතුවක් ලෙස නිදහස් කළ තැනැත්තා වෙත කිසියම් මුදලක් ලබා දී ඇති විටක, එම මුදල වෙනුවෙන් කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ, එම මුදල නිදහස් කළ තැනැත්තා වෙත පවතින තාක්, නිදහස් කළ තැනැත්තා විසින් වරින් වර නියම කරනු ලබන අනුපාතයක් යටතේ පොළී ගෙවිය යුතුය.

5. නිදහස් කළ තැනැත්තා විසින් 1 වන ඡේදය අනුව පිළියෙල කරන ලද ප්‍රකාශයේ පිටපතක් සහ 2 වන ඡේදය අනුව එම ප්‍රකාශය සම්බන්ධයෙන් වන එක් එක් සංශෝධනයක් කොමිෂන් සභාව වෙත එවිය යුතුය. එම එක් එක් සංශෝධනයක් සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය අවශ්‍ය වන අතර කොමිෂන් සභාව අනුමත කරන තෙක් බලාත්මක නොවේ.

6. නිදහස් කළ තැනැත්තා විසින්, 1 වන ඡේදය අනුව පිළියෙල කළ ප්‍රකාශයේ පිටපතක් හෝ (අදාළ පරිදි) 2 වන ඡේදය අනුව පිළියෙල කළ එම ප්‍රකාශයේ අලුත්ම සංශෝධනයක් එම ඡේද යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කර, එම ප්‍රකාශයේ පිටපතක් ඉල්ලා සිටි තැනැත්තා වෙත ලබා දීම හෝ යැවීම කළ යුතුය.

7. නිදහස් කළ තැනැත්තා විසින් 4 වන ඡේදය අනුව ලබා දෙන හෝ යවන කිසියම් ප්‍රකාශනයක් සඳහා, එසේ ප්‍රකාශයක් ලබා දීම සඳහා නිදහස් කළ තැනැත්තාට වැය වන සාධාරණ වියදම් පිළිබිඹු වන සහ මෙම කොන්දේසියේ අරමුණ වෙනුවෙන් කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන නියෝගයන්හි නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණය නොඉක්මවන කිසියම් ගාස්තුවක් අය කිරීමට කටයුතු කරනු ලැබේ.

17 වන කොන්දේසිය : සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට සහ අනෙකුත් බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ට තොරතුරු සැපයීම

1. නිදහස් කළ තැනැත්තා විසින්, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගෙන් සිය අනාගත බලශක්ති අවශ්‍යතා පිළිබඳ පුරෝකථනය කිරීමට ප්‍රමාණවත් වාර්තා සහ පහත දැක්වෙන දෑ සම්බන්ධ විස්තරද ඇතුළුව, එම අවශ්‍යතාවයේ ඉල්ලුම් පැතිකඩක් පවත්වා ගත යුතුය :

(*a*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ තාක්ෂණික සහ තාක්ෂණික නොවන හානි ;

(*b*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියට සම්බන්ධ කර ඇති ජෙනරේටර් (ඇත්නම්) මගින් සපයනු ලබන බලශක්තිය ;

(*c*) නව සම්බන්ධතාවල බලපෑම ; සහ

(*d*) ඉල්ලුම් කළමනාකරණයේ බලපෑම.

(*e*) විවිධ පාරිභෝගික කාණ්ඩවල ධාරා චරිතාංග

2. සමස්ත පද්ධතියේ ආරක්ෂිත සහ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වයක්, සම්බන්ධීකෘත සංවර්ධනයක් සහ අන්තර් ක්‍රියාකාරීත්වයක් සහතික කිරීමට නිදහස් කළ තැනැත්තා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට සහ අනෙක් බෙදාහැරීම් බලපත්‍රලාභීන්ට, සාධාරණ වශයෙන්

අවශ්‍ය වන ආකාරයෙන් සහ අවශ්‍ය අවස්ථාවන්හිදී, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා සහ අනෙක් බෙදාහැරීම් බලපත්‍රලාභීන් විසින් සාධාරණ වශයෙන් ඉල්ලා සිටින එම තොරතුරු සහ පුරෝකථන ඉදිරිපත් කළ යුතුය.

3. මෙම කොන්දේසිය තුළ :

"සමස්ත පද්ධතිය" යනු සියලු අනෙකුත් බෙදාහැරීම් බලපත්‍රලාභීන්ගේ සම්ප්‍රේෂණ පද්ධතිය, බලපත්‍රලාභියාගේ බෙදාහැරීමේ පද්ධති සහ බෙදාහැරීම් පද්ධතිවල සමස්තය වේ.

***IV* වන කොටස : සැපයීම සඳහා වන නිශ්චිත කොන්දේසි**

18 වන කොන්දේසිය : සැපයීමේදී වෙනස් කර සැලකීම තහනම් කිරීම

1. නිදහස් කළ තැනැත්තා, පාරිභෝගිකයින් වෙත විදුලිය සැපයීම සඳහා නියමයන් ඉදිරිපත් කිරීමේදී :

(*a*) කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට අනිසි විශේෂත්වයක් දැක්වීම;

(*b*) කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට අනිසි විශේෂත්වයක් ක්‍රියාවෙන් සිදු කිරීම; හෝ

(*c*) අනවශ්‍ය ලෙස දුෂ්කර නියමයන් පැනවීම.

2. මෙම කොන්දේසියේ අරමුණු සඳහා, පාරිභෝගිකයින් වෙත විදුලිය සැපයීමෙන් ලැබෙන ආදායම, එම විදුලිය සැපයීම සඳහා වන වියදමට වඩා සැලකිය යුතු ලෙස ඉහළ නම්, එම නියමයන් අනවශ්‍ය ලෙස දුෂ්කර වේ.

3. මෙම කොන්දේසියේ අරමුණ සඳහා, ප්‍රශ්නගත පාරිභෝගිකයින් වෙත විදුලිය සැපයීමේදී වැය වන වියදම් සාධාරණ ලෙස ආවරණය නොවන ගාස්තු හා එම කොන්දේසි සම්බන්ධ වේද යන්න පිළිබඳව නිසි ලෙස සලකා බලා, එම නියමයක් අනවශ්‍ය ලෙස දුෂ්කරදැයි යන ප්‍රශ්නය පිළිබඳව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

4. මෙම කොන්දේසියේ :

"නියමයන්" යනු විදුලිය සැපයීමේ ඇගයීමට සැලකිය යුතු ලෙස බලපාන මිල සම්බන්ධයෙන් වන නියමයන්ද ඇතුළුව, විදුලිය සැපයුම ඉදිරිපත් කරන හෝ ලබා දෙන නියමයන් වේ.

19 වන කොන්දේසිය : අයක්‍රම ලේඛනය සැපයීම

1. නිදහස් කළ තැනැත්තා, මෙම නියෝගය බලාත්මක වී ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මණින්, කිසිදු හේතුවක් මත, මෙම වගන්තියේ අරමුණ වෙනුවෙන් නිදහස් කළ තැනැත්තා වෙත නිකුත් කරන ලද නියෝගයන්හි කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන දිනකට පසු නොවන දිනයක හෝ ඉන් පසුව වරින් වර, විදුලි පාරිභෝගිකයින් සඳහා විදුලිය අලෙවි කරනු ලබන අයක්‍රම ලේඛනයක් පිළියෙල කළ යුතුය.

2. අයක්‍රම ලේඛනයක් :

(*a*) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආකෘතියෙන් තිබිය යුතුය ;

(*b*) කිසියම් පාරිභෝගිකයෙකුට විදුලිය මිලදී ගැනීම සඳහා ගෙවිය යුතු ගාස්තුවල සාධාරණ ඇස්තමේන්තුවක් සාදා ගැනීමට හැකි වන අවශ්‍ය වන විස්තර සහිත විය යුතුය ;

(*c*) වසරේ, දවසේ හෝ සතියේ නියමිත කාල සීමාවල සහ දහවල් හා රාත්‍රී කාලයන්හි විදුලිය සැපයීමේදී නිදහස් කළ තැනැත්තා දරන වියදම් පිළිබිඹු වන බවට කොමිෂන් සභාව විසින් අනුමත කරන ක්‍රමවේදයක් අනුව සහ කාර්යක්ෂම ආකාරයෙන් මෙම නිදහස් කිරීමේ නියෝගයෙන් බලය ලබා දී ඇති ක්‍රියාකාරකම් ඉටු කිරීමේදී සාධාරණ ලෙස වැය වන සියලු වියදම් අය කර ගැනීමට නිදහස් කළ පුද්ගලයාට අවසර ලබා දෙන පරිදි සකස් වී තිබිය යුතුය ; සහ

(*d*) පහත දැ වෙන වෙනම හඳුනාගත යුතුය :

(*a*) නිදහස් කළ තැනැත්තාගේ විදුලිය මිලට ගැනීමේ පිරිවැය

(*b*) පොරොත්තු හෝ හදිසි ජෙනරේටර්වල මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය

(*c*) බෙදාහැරීමේ පද්ධති මෙහෙයුම් හා කළමනාකරණ නඩත්තු ගාස්තුව

3. නිදහස් කළ තැනැත්තා විසින් නියම කරනු ලබන එවැනි අයක්‍රම සංකීර්ණ වීම හේතුවෙන්, සරල පැහැදිලි කිරීමේ ප්‍රකාශ අවශ්‍ය බවට කොමිෂන් සභාවට හැඟුනහොත්, පාරිභෝගිකයින්හට පහසුවෙන් අවබෝධ කර ගැනීමට සුදුසු පරිදි, නිදහස් කළ තැනැත්තාට එකී පැහැදිලි කිරීමේ ප්‍රකශ පිළියෙල කරන ලෙසත් ඉන් පසුව ඒවා අයක්‍රම ලේඛනයේ පළ කරන ලෙසත් නියම කිරීමට කොමිෂන් සභාවට පුළුවන.

4. නිදහස් කළ තැනැත්තා කොමිෂන්සභාව වෙතින් සැපයුම් අයක්‍රම ලේඛනය සඳහා අනුමැතිය ලබා ගත යුතුය.

5. වෙනත් කිසියම් තැනැත්තෙකු වෙත ලබා දීමට දින 14කට වඩා නොවැඩි කාලයක් තුළ, නිදහස් කළ තැනැත්තා අයක්‍රම ලේඛනවල පිටපතක් (වරින් වර සංශෝධනයට ලක් කරනු ලබන පරිදි) කොමිෂන් සභාව වෙත ලබා දීම හෝ යැවීම සිදු කළ යුතුය.

6. කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන පරිදි නිදහස් කළ තැනැත්තා අයක්‍රම ලේඛනය ප්‍රකාශයට පත් කළ යුතුය.

7. නිදහස් කළ තැනැත්තා (8 වන ඡේදයට යටත්ව) අයක්‍රම ලේඛනයේ සහ කිසියම් පැහැදිලි කිරීමේ ප්‍රකාශනයේ) වරින් වර සංශෝධනයට ලක් කරනු ලබන පරිදි) පිටපතක් එවැන්නක් ඉල්ලා සිටින ඕනෑම තැනැත්තෙකු වෙත ලබා දීම හෝ යැවීම සිදු කළ යුතුය.

8. නිදහස් කළ තැනැත්තා, 7 වන ඡේදය අනුව ලබා දුන් හෝ යවන ලද අයක්‍රම ලේඛනයේ ඕනෑම පිටපතක් සඳහා සහ කිසියම් පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් (වරින්වර සංශෝධනය කරන ලද) සඳහා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝගයන්හි මෙම වගන්තියේ අරමුණ වෙනුවෙන් අදාළ කාලය තුළ නිශ්චිතව දක්වා ඇති මුදල නොඉක්මවන ගාස්තුවක් අය කරනු ලැබේ.

9. නියෝගවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට, හෝ නියෝගවල දක්වා ඇති අරමුණු ඉටු කර ගත හැකි ආකාරයට, නිදහස් කළ තැනැත්තා වරින් වර අයක්‍රම ලේඛනය වෙනස් කළ යුතු බවට, නියම කරමින් කොමිෂන් සභාව විසින් නිදහස් කළ තැනැත්තා වෙත නියෝග ලබා දෙන අතර නිදහස් කළ තැනැත්තා එවැනි නියෝගයන් හා වහාම අනුකූල විය යුතුය.

10. අයක්‍රමලේඛනය සමාලෝචනය කිරීම සඳහා වන ක්‍රියාමාර්ගයක් කොමිෂන් සභාව නිර්දේශ කළ යුතුය.

20 වන කොන්දේසිය : අයක්‍රම ගිවිසුම බෙදාහැරීම සහ සැපයීම

1. නිදහස් කළ තැනැත්තා විදුලි පාරිභෝගිකයෙකු සමඟ හෝ විදුලිබල පාරිභෝගිකයෙකු වීමට අපේක්ෂා කරන තැනැත්තෙකු සමඟ ගිවිසුමකට එළඹීමට (පහත 3 වන ඡේදයට සහ 14 වන කොන්දේසියට යටත්ව) ඉදිරිපත් වනු ඇති අතර, එම විදුලිය අලෙවි කිරීම හා සම්බන්ධයෙන් අය කළ යුතු ගාස්තු සඳහා වන විධිවිධාන සැලසීම සහ ඉහත 19 වන කොන්දේසියෙහි තීරණය කරනු ලබන අයක්‍රම ලේඛනයෙන් පරිශීලනය ලබා දී ඇති ආකාරයට ඉදිරිපත් කළ යුතුය.

2. ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මණින්, කුමන තත්ත්වයේ වුවත් අර්පනයේ නියමයන් සැකසීම සඳහා නිදහස් කළ තැනැත්තා විසින් සාධාරණ ලෙස ඉල්ලා සිටින එම සියලු තොරතුරු සහිත අයදුම්පතක් නිදහස් කළ තැනැත්තා වෙත ලැබී සති 02කට නොවැඩි කාලයක් තුළ, නිදහස් කළ තැනැත්තා ගිවිසුම සඳහා වන නියමයන් ඉදිරිපත් කළ යුතුය.

3. නිදහස් කළ තැනැත්තා කිසියම් ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම තුළ නිදහස් කළ තැනැත්තෙකු සම්බන්ධ වේ නම් මෙම කොන්දේසියෙන් බැඳී නොසිටී :

(*a*) පනත යටතේ වන කාර්යයන් උල්ලංඝනය වන ආකාරයෙන් ;

(*b*) පනත යටතේ හෝ බෙදාහැරීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් වන ආරක්ෂාව හා ප්‍රමිතිය සම්බන්ධ වෙනත් කිසියම් නීති පැනවීමක් යටතේ සාදන ලද කිසියම් රෙගුලාසි උල්ලංඝනය වන ආකාරයෙන් ;

(*c*) මෙම නිදහස් කිරීමේ නියෝගය උල්ලංඝනය වන ආකාරයෙන් ; හෝ

(*d*) කිසියම් අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සාර සංග්‍රහ උල්ලංඝනය වන ආකාරයෙන්.

4. මෙම කොන්දේසිය යටතේ ගිවිසුමකට එළඹීම සඳහා නිදහස් කළ තැනැත්තෙකු සතු බැඳීම 25 වන කොන්දේසිය අනුව එළඹෙන සම්බන්ධතා ගිවිසුමට සුදුසු පරිදි වගන්ති ඇතුල් කිරීමෙන් ඉටු කර ගත හැකි වේ.

21 වන කොන්දේසිය - පරිශ්‍රයන් තුළට ඇතුළු වීම

1. මෙම නිදහස් කිරීමේ නියෝගය යටතේ කිසියම් පරිශ්‍රයකට ඇතුළු වීමේදී ඒ බව නිදහස් කළ තැනැත්තා හෝ නිදහස් කළ තැනැත්තා විසින් බලය දී ඇති තැනැත්තෙකු විසින් දැනුම් දිය යුතු අතර පහත අවස්ථාවන් සපුරා නැති නම් එසේ කිරීමට ඉල්ලා සිටීමට හෝ අයිතියක් ලෙස සලකා ඇතුළු වීමට නොහැක -

(i) නිදහස් කළ තැනැත්තාගේ බලයලත් නිලධාරියා විසින් හෝ නිදහස් කළ තැනැත්තා විසින් සිදු කිරීමට අදහස් කරන කටයුතුවල ස්වභාවය සහ ප්‍රමාණය දක්වමින් කිසියම් පරිශ්‍රයකට ඇතුළු වීමට දින තුනකට පෙර දැනුම් දී තිබීම ;

(ii) අවශ්‍ය වුවහොත්, ඔහු හෝ ඇය ඔහුගේ හෝ ඇයගේ බලය පිළිබඳ සාක්ෂි සපයා තිබීම ;

(iii) මෙම ඇතුළු වීම හේතුවෙන් ඉඩමට හෝ පරිශ්‍රයට කිසියම් බාධා කිරීමක්, අක්‍රිය කිරීමක, හානියක් සිදු වේ නම් එහි හිමිකරුට ඒ සඳහා සාධාරණ වන්දි මුදලක් ගෙවා තිබීම.

2. නිදහස් කළ තැනැත්තා හෝ තමා වෙනුවෙන් නිදහස් කළ තැනැත්තා විසින් ලිඛිතව බලය පවරා ඇති තැනැත්තෙකු, (1) (අ) ඡේදයෙහි විස්තර කර ඇති පරිදි දැනුම් දීමක් ලබා දීමේ අරමුණ සඳහා ඉඩමට ඇතුළු වීම සඳහා හිමිකම් ලබයි.

3. මෙම අයිතමය යටතේ පැවරී ඇති කිසියම් බලතලයක් ක්‍රියාවේ යෙදවීමේදී, නිදහස් කළ තැනැත්තා විසින් ලිඛිතව බලය ලබා දී ඇති තැනැත්තා ලවා එසේ ඇතුළු වීමේදී පරිශ්‍රයට සිදු වන හානිය සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කළ යුතුය.

4. මෙම නිදහස් කිරීමේ නියෝගය අනුව හෝ යටතේ පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීමේදී, පරිශ්‍රයට හෝ කිසියම් චංචල දේපලකට හානියක් සිදු වුවහොත්, අදාළ පරිශ්‍රයේ හෝ චංචල දේපලවල භාරකරුට ක්‍රියාවේ යොදවන ලබන බලය සහිත නිදහස් කළ තැනැත්තාගෙන් එම හානි සම්බන්ධයෙන් වන්දි මුදලක් ලබා ගත හැකිය ; එසේම එම බලය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කිසියම් තැනැත්තෙකුට සිය පරිශ්‍රය හෝ චංචල දේපළ භුක්ති විඳීමට බාධා පැමිණේ නම් ඔහුට හො ඇයට එම බාධා කිරීම වෙනුවෙන් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි නිදහස් කළ තැනැත්තාගෙන් සාධාරණ වන්දියක් ලබා ගත හැකිය.

උපලේඛනය 1

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ අංක 200, යුනියන් පෙදෙස, කොළඹ 02 ලිපිනයේ පිහිටා ඇති යුනියන් රෙසිඩන්සිස් වශයෙන් විස්තර කරන ලද බිම් සැලැස්ම.

05-626/3

---

## ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 10 වන වගන්තිය යටතේ ප්‍රදානය කෙරෙන
නිදහස් කිරීමේ නියෝගය

**1. නිදහස් කිරීම් ප්‍රදානය කිරීම**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 10 (01) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව (මෙහි මින් මතුවට "කොමිෂන් සභාව" ලෙස හැඳින්වෙන) අංක 27, මෙල්බෝන් ඇවනිව්, කොළඹ 04 ලිපිනයේ පිහිටි පැල්වත්ත සුගර් ඉන්ඩස්ට්‍රීස් පීඑල්සී (මෙහි මින් මතුවට නිදහස් කළ තැනැත්තා ලෙස හැඳින්වෙන) වෙත බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමක් මෙයින් ලබා දේ:

මීට යා කොට 1 වන ඇමුණුමේ වැඩිදුරටත් විස්තර කර ඇති බුත්තල, පැල්වත්ත පරිශ්‍රයන් තුළ පිහිටා ඇති පැල්වත්ත සුගර් ඉන්ඩස්ට්‍රීස් පීඑල්සී කර්මාන්තායතනය මෙම නියෝගයෙහි දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, විදුලිය බෙදාහැරීම සහ සැපයීම හෝ බෙදාහැරීම හෝ සැපයීමේ සීමිත කාර්යය සඳහා.

**2. අනුමැතිය**

නිදහස් කළ තැනැත්තා 2009 අංක 20 දරන ලංකා විදුලිබල පනතේ විධිවිධානයන් ඇතුළත් ඊට පමණක් සීමා නොවූ විධිවිධානයන්ට යටත්ව විදුලිබලය සැපයීම සහ බෙදාහැරීම සිදු කිරීම පිණිස අවශ්‍යය අදාළ නීති, රෙගුලාසි සහ රීති යටතේ අවශ්‍යය සියලු අනුමැතීන් ලබා ගත යුතු ය.

**3. නිදහස් කිරීමේ කාල සීමාව**

මෙයින් ලබා දෙන නිදහස් කිරීම 2012.01.26 දින බලාත්මක වන අතර අවලංගු හෝ ඉවත් කර ගැනීම නොකළහොත්, පහතින් දක්වා ඇති නිදහස් කිරීමේ නියෝගයේ අවලංගු කිරීමේ සහ ඉවත් කර ගැනීමේ විධිවිධානයන්ට යටත්ව, 2012.01.26 දින සිට වසර පහක (05) කාලයක් බලාත්මකව පවතිනු ඇත.

**4. නිදහස් කිරීම අවලංගු කිරීම හෝ ඉවත් කර ගැනීම**

මෙම නිදහස් කිරීම පනතේ 22 වන වගන්තිය යටතේ අවලංගු කිරීම හෝ ඉවත් කර ගැනීම සිදු කළ හැකිය.

ආචාර්ය ජයතිස්ස ද කොස්තා,
සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව.

***නිදහස් කිරීමේ කොන්දේසි***

1 වන කොන්දේසිය : අර්ථකථනය සහ ගොඩනැඟීම

1. ප්‍රතිවිරුද්ධ අභිමථාර්ථයක් දිස් නොවේ නම්:

(අ) කොන්දේසිවල හෝ උපලේඛනවල භාවිතා කෙරෙන පාඨ සහ ප්‍රකාශන ඒවා නීති පැනවීමක සහ ඒවා හා අදාළ වන අර්ථකථන පනත්වල තිබෙන ආකාරයට අර්ථ දැක්වේ.

(ආ) නීති පැනවීමක් සඳහා වන පරිශීලනයන් සඳහා ප්‍රාථමික සහ ආනුෂාංගික නීති සම්පාදන ඇතුළත් වන අතර, මෙම අවස්ථා දෙකෙහිදීම, මෙම නීති සම්පාදනය බලාත්මක කෙරෙන දිනට පසුව සිදු කෙරෙන කිසියම් නවීකරණයක් හෝ ඒ සම්බන්ධයෙන් වන නැවත නීති පැනවීමක් ඇතුළත් වනු ඇත.

2. පනතේ කිසියම් විධිවිධානයක කාර්යයක් සඳහා පනතේ අර්ථ දක්වා ඇති කිසියම් පාඨයක් හෝ අර්ථ දැක්වීමක්, ප්‍රතිවිරුද්ධ අභිමථාර්ථයක් උද්ගත වුවහොත් හැර, කොන්දේසිවල හෝ උපලේඛනවල භාවිතා වන අර්ථයට සමාන අර්ථ දැක්වේ.

3. කොන්දේසි සහ උපලේඛනවල, විශේෂ කර දක්වා නොමැති නම් හෝ සංදර්භය මඟින් නියම කරනු ලබන්නේ නැතිනම්:

**"අනුබද්ධ"** නිදහස් කළ පුද්ගලයෙකු සම්බන්ධයෙන්, මෙහි අදහස වනුයේ නිදහස් කළ පුද්ගලයා අයත් සමාගම හෝ නිදහස් කළ පුද්ගලයාගේ කිසියම් අනුබද්ධ ආයතනයක් හෝ කිසියම් අයිති සමාගමක අනුබද්ධ ආයතනයක් මෙයින් අදහස් වන අතර, එම එක් එක් අවස්ථාවල එය 2007 අංක 7 දරන පනතේ අර්ථය තුළට ගැනේ;

**"අනුමත"** 4, 9, 13, 16, 19, සහ 20 වන කොන්දේසිවල කාර්යභාරය සඳහා මෙහි අර්ථය වනුයේ කොමිෂන් සභාව මඟින් අනුමත ඒවා වන අතර "අනුමත" යන්නෙහි අනුරූප අර්ථයක් පවතිනු ඇත.

**"බලපත්‍රලාභියා"** 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13 වන වගන්තිය යටතේ වලංගු බලපත්‍රයක් සහිත තැනැත්තෙකු.

**"බෙදාහැරීමේ ව්‍යාපාරය"** යනු ප්‍රධාන වශයෙන් උඩිස් රැහැන්, භූගත රැහැන්, සේවා රැහැන්, ට්‍රාන්ස්ෆෝමර්, මනු සහ අනෙකුත් උපකාරක බලගාර පිරියත සහ උපකරණ භාවිතා කරමින්, කැප කළ 33 kv ක් හෝ ඊට වඩා අඩු වෝල්ටීයතාවයක් (කලා සන්නායක අතර) සහිත බලපත්‍රකරුට අයත් සහ ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලබන සම්ප්‍රේෂණ පද්ධතියකින් හෝ නිෂ්පාදන බලාගාර හෝ වෙනත් මිලදී ගැනීමේ ස්ථානවල සිට, අවසාන පාරිභෝගිකයාගේ හෝ ලබා දීමේ ස්ථානය වෙත 33 kv ක් හෝ ඊට වඩා අඩු වෝල්ටීයතාවයක් සහිත විදුලියක් මිලදී ගැනීම සඳහා කැමැත්ත දක්වන තැනැත්තන් වෙත විදුලි බලශක්තිය ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍රලාභියාගේ බලපත්‍ර සහිත ව්‍යාපාරයකි. ;

**"නිදහස් කළ තැනැත්තා"** යනු පනතේ 10 වන වගන්තිය යටතේ විදුලිබලය බෙදාහැරීම සහ සැපයීම, හෝ බෙදාහැරීම හෝ සැපයීම සඳහා බලපත්‍ර ලබා ගැනීමෙන් නිදහස් කළ තැනැත්තෙකි;

**"විදුලිබල ව්‍යාපාරය"** යනු විදුලිබලය බෙදාහැරීමෙහි හෝ සැපයීමෙහි නිරතව සිටින කිසියම් තැනැත්තෙකි;

**"පරිපාලනසමාගම"** යනු 2007 අංක 7 දරන සමාගම් පනත තුළට අයත් පරිපාලන සමාගමකි;

**"නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතිය"** යනු මෙහි 01 වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිශ්‍රය තුළ පිහිටා ඇති සම්ප්‍රේෂණ පද්ධතියේ කොටසක් සාදන විදුලි රැහැන් සහ කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව නිදහස් කළ පුද්ගලයා විසින් නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ කොටසක් ලෙස නිදහස් කළ තැනැත්තා විසින් නිශ්චිත කර දක්වන අනෙකුත් විදුලි රැහැන් හැර නිදහස් කළ තැනැත්තාගේ සියලු විදුලි රැහැන් මාර්ග වන අතර පරිශ්‍ර වෙත විදුලිය රැගෙන යාම සඳහා භාවිතා වන නිදහස් කළ පුද්ගලයාගේ කිසියම් විදුලි බලාගාරයක්, මනු, සම්ප්‍රේෂණ සහ ස්විච්චපන්න ඊට අයත් වේ;

**"නවීකරණය"** යන්නට එකතු කිරීම්, මඟහැරීම්, සංශෝධන සහ ආදේශ කිරීම් ඇතුළත් වන අතර ඊට සමාන ප්‍රකාශන ඒ අනුව අර්ථ දැක්වෙනු ඇත;

**"PUCSL පනත"** යනු 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත වේ;

**"ආශ්‍රිත සමාගම"** යනු 2007 අංක 7 දරන සමාගම් පනත තුළට ගැනෙන ආශ්‍රිත සමාගමකි;

**"කරුණු දැක්වීම"** යන්නට ලිඛිතව සිදු කරන කිසියම් විරෝධතාවයක් හෝ වෙනත් කිසියම් යෝජනාවක් ඇතුළත් වේ;

**"අනුබද්ධ ආයතනය"** යන්නෙහි 2007 අංක 7 දරන සමාගම් පනත තුළ දක්වා ඇති අර්ථය ඇත, **"අනුබද්ධ ආයතන"** ඒ අනුව අර්ථ දැක්වෙනු ඇත;

**"සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා"** යනු පනතේ 13(1)(ඇ)(i)(ආ) වගන්තිය යටතේ විදුලිබලය සම්ප්‍රේෂණය කිරීම සඳහා බලපත්‍රලාභියෙකි, එසේම

**"සම්ප්‍රේෂණ පද්ධතිය"** යනු සම්ප්‍රේෂණ බලපත්‍රලාභියෙකුට අයත් සහ ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලබන සහ (සම්පූර්ණ වශයෙන් හෝ ප්‍රධාන වශයෙන්) ඉහළ අධිසැර විදුලි රැහැන් සහ විදුලි බලාගාරවලින් සමන්විත සහ උත්පාදන බලාගාරයක සිට උපපොලක් වෙත, එක් උත්පාදන බලාගාරයක සිට තවත් උත්පාදක බලාගාරයක් වෙත හෝ එක් උපපොලක සිට තවත් උපපොලක් දක්වා තොග සැපයුම් පාරිභෝගිකයින්ගේ (කිසියම් බෙදාහැරීමේ පද්ධතියක කොටසක් සකස් නොකරන එවැනි මාර්ග ඇතුළත් නොවේ) පරිශ්‍ර වෙත විදුලිය රැගෙන යාම සඳහා භාවිතා කෙරෙන සියලු ඉහළ අධි සැර විදුලි රැහැන් සහිත පද්ධතියක් වේ.

4. විශේෂ වශයෙන් විස්තර කර නොමැති නම්:

(අ) අනුපිළිවෙලින් අංකිත කොන්දේසියකට හෝ අංකිත උපලේඛනයකට වන කිසියම් මෙම නිදහස් කිරීමේ නියෝගයේ එම අංකය දරන කොන්දේසියට හෝ උපලේඛනයට අදාළ පරිශීලනයක් වේ;

(ආ) අංකිත උප වගන්තියකට වන කිසියම් පරිශීලනයක් එම පරිශීලනය පැන නගින උපලේඛනයේ එම අංකය සහිත උප වගන්තියට අදාළ පරිශීලනයක් වේ;

(ඇ) අංකිත ඡේදයක් සඳහා වන කිසියම් පරිශීලනයක් එම පරිශීලනය උද්ගත වන කොන්දේසියේ හෝ උප වගන්තියේ එම අංකය දරන ඡේදය සඳහා වන පරිශීලනයක් වේ; සහ

එවැනි විචලතාවයක්, අතිරේකයක් හෝ ප්‍රතිස්ථාපනයක් සහ කිසියම් ගිවිසුමක් සඳහා වන කිසියම් පරිශීලනයක් සීමා කරන කිසියම් විධිවිධානයකට අගතියක් නොමැතිව, නිදහස් කිරීමේ නියෝගය (මෙම නිදහස් කිරීමේ නියෝගය හැර), සාර සංග්‍රහය හෝ වෙනත් උපකරණයක් යන්නට එවැනි ගිවිසුමක්, නිදහස් කිරීමේ නියෝගයක්, සාර සංග්‍රහයක් හෝ වරින්වර වෙනස් කරන ලද, අතිරේකව සපයන ලද හෝ ප්‍රතිස්ථාපනය කරන ලද උපකරණයක් ඇතුළත් වේ.

5. කිසියම් කොටසක, කොන්දේසියක, උපලේඛනයක හෝ ඡේදයක ශීර්ෂ පාඨය හෝ මාතෘකාව එහි සම්ප්‍රයුක්තියට බලපෑමක් කරනු නොලබයි.

6. කිසියම් කාල සීමාවක් තුළ සිදු කළ යුතු බවට නිදහස් කිරීමේ නියෝගයක කිසියම් බැඳීමක් ප්‍රකාශ කෙරෙන අවස්ථාවකදී, එම නිදහස් කළ තැනැත්තා නියම කළ කාල සීමාව තුළ එම පොරොන්දුව ඉටු කිරීමට අපොහොසත් වුවහොත් එම කාල සීමාවෙන් පසුව එම පොරොන්දුව අඛණ්ඩව බන්ධනීය සහ බලාත්මක වේ (නියමිත කාල සීමාව තුළ නිදහස් කළ පුද්ගලයාට එම කටයුතු ඉටු කිරීමට නොහැකි වීමේ හේතුව මත නිදහස් කළ පුද්ගලයා සම්බන්ධයෙන් ඇති සියලු හිමිකම් සහ ප්‍රතිකර්මවලට අගතියක් නොවී.)

7. මෙම නිදහස් කිරීමේ නියෝගය සහ පනත අතර කිසියම් අනනුකූලතාවයක් ඇත්නම්, එම අනනුකූලතාවයේ ප්‍රමාණයට පනත බලාත්මක වේ. පනතේ දක්වා ඇති කොන්දේසි මඟින් එහි දක්වා ඇති කොන්දේසිවලට අමතරව නිදහස් කිරීමේ නියෝගයේ සංඝටනීය කොටස් සකස් වේ.

2 වන කොන්දේසිය : කොමිෂන් සභාව වෙත තොරතුරු ලබා දීම

1. නිදහස් කළ පුද්ගලයා විසින්, එම තොරතුරු කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කාල සීමාව තුළ නියම කරනු ලබන ආකාරයෙන් ලබා දිය යුතු අතර, කොන්දේසි අනුව හෝ පනත හෝ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත යටතේ කොමිෂන් සභාව වෙත නියම කර හෝ පවරා ඇති කාර්යයන් සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවන්හිදී එම වාර්තා ප්‍රසම්පාදනය කර ඉදිරිපත් කළ යුතුය.

2. 1 වන ඡේදයේ සාකල්‍යතාවයට අගතියක් නොවන ආකාරයෙන්, කොමිෂන් සභාව වෙත පිළියෙල කර සැපයිය යුතු ප්‍රමාණයට වඩා වැඩි, සහ වෙනස් ගිණුම් තොරතුරු ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව නියම කරනු ලැබිය හැක.

3. 1 වන ඡේදය යටතේ තොරතුරු ලබා දෙන ඉල්ලා සිටීම සඳහා වන කොමිෂන් සභාවේ බලය, මෙම නිදහස් කිරීමේ නියෝගයේ වෙනත් කිසියම් කොන්දේසියක් යටතේ හෝ අනුව හෝ, පනත, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත හෝ වෙනත් කිසියම් නීති සම්පාදනයක් යටතේ හෝ අනුව තොරතුරු ඉල්ලා සිටීමට ඇති බලයට අගතියක් සිදු නොවේ.

4. නිදහස් කිරීම ලබා ගෙන මාස එකක කාලයක් තුළ නිදහස් කළ තැනැත්තා බෙදාහැරීමේ ව්‍යාපාරය සඳහා වගකිව යුතු පුද්ගලයෙකු එම සංවිධානය තුළ පත් කළ යුතුය.

5. මෙම කොන්දේසිය තුළ:
"තොරතුරු" යන්නට කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන කිසියම් විස්තරාත්මක සහ ආකෘතියක පොත්, ලිපි ලේඛන, සටහන් ගිණුම්, ඇස්තමේන්තු, ප්‍රතිලබ්ධි හෝ වාර්තා (කොමිෂන් සභාවේ ඉල්ලීම අනුව විශේෂයෙන්ම පිළියෙල කරන ලද හෝ එසේ නොවන) ඇතුළත් වේ.

3 වන කොන්දේසිය : කොමිෂන් සභාවේ තීරණ, නියෝග සහ පරිසමාප්තීන්,

1. නිදහස් කිරීමේ නියෝගය අනුව කොමිෂන් සභාව විසින් සාදන ලද ඕනෑම තීන්දු, නියෝග, විධාන සහ පරිසමාප්තීන්වලට නිදහස් කළ පුද්ගලයා අවනත විය යුතුය.

2. එම තීන්දු, නියෝග, විධාන සහ පරිසමාප්තීන් හා අදාළ ගාස්තු සඳහා නිදහස් කළ තැනැත්තා වගකිව යුතුය.

3. කොමිෂන් සභාව විසින් සාදන ලද කිසියම් නියෝගයක් හෝ විධානයක් හා අනුකූල වීම සඳහා නිදහස් කළ තැනැත්තා විසින් කොමිෂන් සභාවට, වෙනත් කිසියම් බලධාරියෙකුට හෝ කොමිෂන් සභාවේ නියෝගය තුළ නිශ්චිතව දක්වනු ලබන තැනැත්තෙකු විසින් කොමිෂන් සභාවට අවශ්‍ය අවස්ථාවන්හිදී එහි දේපල වෙත පිවිසීමට සහ පාලනය කිරීමට ඉඩ ලබා දිය යුතුය.

4 වන කොන්දේසිය : තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවලට අනුකූල වීම

1. කොමිෂන් සභාවේ ඉල්ලීම අනුව, නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව විසින් සුදුසු බවට සලකනු ලබන කිසියම් විදුලිබල සමාගමක් විමසා කොමිෂන් සභාව විසින් වරින් වර නියම කරනු ලබන එවැනි තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ සංවර්ධනය කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය.

2. 1 වන ඡේදය අනුව සංවර්ධනය කරන ලද කිසියම් තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ ඒවා ක්‍රියාත්මක කිරීමට පෙර අනුමත කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

3. අදාළ සාර සංග්‍රහයේ දක්වා ඇති නවීකරණ ක්‍රියාවලිය අනුව කොමිෂන් සභාව වෙත සිය යෝජනා අදාළ අවස්ථාවේදී දැනුම් දීම මඟින් බලාත්මකව ඇති සාර සංග්‍රහයකට නවීකරණ යෝජනා ඉදිරිපත් කිරීමට නිදහස් කළ තැනැත්තාට පුළුවන.

4. මෙම කොන්දේසිය අනුව නිදහස් කළ තැනැත්තා විසින් සංවර්ධනය කර ක්‍රියාත්මක කරන ලද සියලු අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවල පිටපතක් නිදහස් කළ තැනැත්තා පහත අයවළුන් වෙත ලබා දීම හෝ යැවීම සිදු කළ යුතුය:

(අ) කොමිෂන් සභාව; සහ

(ආ) එය ඉල්ලා සිටින කිසියම් තැනැත්තෙකු වෙත.

5. නිදහස් කළ තැනැත්තා 4 (ආ) ඡේදය අනුව ලබා දුන් හෝ යවන ලද පිටපතක් සඳහා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝගවල මෙම කොන්දේසිය සඳහා එම අවස්ථාව අනුව නිශ්චිතව කර දක්වා ඇති මුදල නොඉක්මවන ගාස්තුවක් අය කළ හැකිය. නිදහස් කළ තැනැත්තා විසින් ඊට සුදුසු ලෙසට එහි නිශ්චිතව දක්වා ඇති ඕනෑම අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවල විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය.

6. අදාළ අවස්ථාවන්හි කොමිෂන් සභාව විසින් සුදුසු බවට සලකනු ලබන විදුලිබල සමාගම් වෙතින් විමසා, නිදහස් කළ තැනැත්තා 6 වන ඡේදය යටතේ එම නියෝගවල නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවලින් කොටසක් හෝ කොටස් සම්බන්ධයෙන් දක්වා ඇති එහි බැඳීම්වලින් නිදහස් කරමින් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන එම නියමයන් හා කොන්දේසිවලට යටත්ව කොමිෂන් සභාව විසින් නියෝග නිකුත් කරනු ඇත.

7. කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ ලැබෙන තෙක්, නිදහස් කළ තැනැත්තා සියලු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දැනට තිබෙන තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවලට අනුකූල විය යුතුය.

5 වන කොන්දේසිය : අනෙකුත් ගිවිසුම්

1. නිදහස් කළ තැනැත්තා, අදාළ බලපත්‍රලාභීන් සමඟ අයකුම සහ සම්බන්ධතා ගිවිසුම් ඇතුළුව කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන අනෙක් තැනැත්තන් සමඟ ගිවිසුම්වලට එළඹිය යුතුය.

2. කොමිෂන් සභාව විසින් නිදහස් කළ තැනැත්තා එළඹිය යුතු බවට නියෝග කර ඇති කිසියම් ගිවිසුමක් පිළියෙළ කිරීමට සහභාගී විය යුතුය.

3. මෙම කාර්යය සඳහා කොමිෂන් සභාවට සාධාරණ යයි පෙනී යන කාල පරිච්ඡේදයකට පසුව, නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව මඟින් නියම කර ඇති ගිවිසුම්වලට එළඹීමට අපොහොසත් වුවහොත්, එම තැනැත්තාගේ හෝ නිදහස් කළ තැනැත්තාගේ ඉල්ලීම අනුව, නිදහස් කළ තැනැන්තා සහ ප්‍රශ්නගත පුද්ගලයා අතර වන කිසියම් අර්බුදයක ගිවිසුමේ නියමයන් කොමිෂන් සභාවට සුදුසු යැයි පෙනී යන ආකාරයට නියම කරනු ලැබේ.

6 වන කොන්දේසිය : නිදහස් කිරීමේ නියෝගය නියම කිරීම සහ බෙදාහැරීමේ ව්‍යාපාරයේ පැවරීම

1. කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත එකඟතාව නොමැතිව, නිදහස් කළ තැනැත්තා මෙම නිදහස් කිරීමේ නියෝගය සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් පැවරීම නොකළ යුතුය.

2. කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත එකඟතාවයක් නොමැතිව මෙම නිදහස් කිරීමේ නියෝගය යටතේ සිදු කර ගෙන යන බෙදාහැරීමේ ව්‍යාපාරය සම්පූර්ණ වශයෙන්ම හෝ එහි කොටසක් වෙනත් පුද්ගලයෙකුට ("පැවරුම්ලාභියා") පැවරීමට, නිදහස් කළ පුද්ගලයා කටයුතු නොකළ යුතුය.

3. මෙම නිදහස් කිරීමේ නියෝගයේ කිසියම් නියම කිරීමක් සඳහා හෝ බෙදාහැරීමේ ව්‍යාපාරයේ පැවරීම සඳහා වන කොමිෂන් සභාවේ කිසියම් එකඟතාව අදාළ වන පරිදි, පැවරුම්කරු හෝ පැවරුම්ලාභියා සතුව මෙම නිදහස් කිරීමේ නියෝගයේ කොන්දේසිවලට අනුකූල වීම සඳහා වන තාක්ෂණික හා මූල්‍ය ශක්‍යතාවය තිබෙන බවට කොමිෂන් සභාවේ සෑහීමට පත් වීමට යටත් වන අතර, පැවරීමක් සම්බන්ධයෙන් පමණක් වන විට, පැවරුම්ලාභියා වෙත නිදහස් කිරීමේ නියෝගයක් ලබා දීමේදී, අදාළ ආකාරය අනුව පැවරුම්කරු හෝ පැවරුම්ලාභියා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන විට පනත අනුව මෙම නිදහස් කිරීමේ නියෝගය වෙනස් කිරීමද ඇතුළුව, කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලබන වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අනුකූල වීමට යටත් වේ.

4. මෙම කොන්දේසියේ කිසිවක් මඟින් නිදහස් කළ තැනැත්තා බෙදාහැරීමේ ව්‍යාපාරය පැවරීම සඳහා කොමිෂන් සභාව එකඟතාවය ලබා දී ඇති පැවරුම්ලාභියෙකුට පැවරීමෙන් වළක්වාලන විධිවිධානයක් නොමැත, එසේ වුවද කිසියම් පැවරීමක් සඳහා එකඟතාව ලබා දුන් පසුව ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මන් අවස්ථාවක එම පැවරීම ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

7 වන කොන්දේසිය : නිදහස් කිරීමේ නියෝගය අවලංගු කිරීම හෝ ඉවත් කර ගැනීම

1. පහත දැක්වෙන අවස්ථාවන්හිදී 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 22 වන වගන්තිය යටතේ කොමිෂන් සභාවට නිදහස් කිරීමේ නියෝගය අවලංගු කළ හැකිය :

(*a*) නිදහස් කළ තැනැත්තා මෙම නිදහස් කිරීමේ නියෝගය අවලංගු කළ යුතු බවට ලිඛිතව එකඟ වේ නම් ;

(*b*) මෙම නියෝගයේ හෝ විධානයේ 2 වන කොන්දේසිය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන නියෝගයක් හෝ විධානයක් හා අනුකූල වීමට එය නිකුත් කළ දින සිට දින 60ක් තුළ හෝ එම නියෝගයේ හෝ විධානයේ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන කාල සීමාවක් තුළ නිදහස් කළ තැනැත්තා අසමත් වේ නම් ;

(*c*) පහත අවස්ථාවන්හිදී:

(i) නිදහස් කළ තැනැත්තාගේ පාලනය සම්බන්ධයෙන් වෙනස්වීමක් සිදු වුවහොත් ; සහ

(ii) නිදහස් කළ තැනැත්තා තුළ බෙදාහැරීමේ ව්‍යාපාරය සිදු කර ගෙන යාම සඳහා ඇති එහි පාර්ශ්වකරණයේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන නව පාර්ශ්වකරුවා හෝ නව පාර්ශ්වකරුවා (සිටී නම්) විසින් පත් කරනු ලබන අස්ථිත්වය සතුව බෙදාහැරීමේ ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් තාක්ෂණික, මූල්‍ය හෝ කළමනාකරණ ශක්තියක් නොමැති බවට කොමිෂන් සභාව සෑහීමට පත් වුවහොත් ; සහ

(iii) නිදහස් කළ තැනැත්තාගේ පාලනයේ වැඩිදුර වෙනස්වීමක් නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට නිවේදනය ලබා දුන් දින සිට ආරම්භ වී මාස තුනක කාලයක් තුළ සිදු වුවහොත් කොමිෂන් සභාව මෙම ඡේදය අනුව මෙම නියෝගය අවලංගු කිරීමට අදහස් කරන බව ප්‍රකාශ කරමින් කොමිෂන් සභාව නිදහස් කළ තැනැත්තා වෙත දැනුම් දීමක් කරන්නේ නම් ; සහ

(iv) එම කාලය තුළ වැඩිදුර වෙනස් වීම් සිදු නොවුවහොත් ;

(*d*) නිදහස් කළ තැනැත්තාගේ පාලනයේ වෙනස්වීමක් ඇති වී සෑහෙන සාධාරණ කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම් දීමට නිදහස් කළ තැනැත්තා අසමත් වුවහොත් ;

(*e*) කොමිෂන් සභාව විසින් සිය අභිමථය පරිදි සියලුම අවස්ථාවන්හිදී සාධාරණ යයි සලකනු ලබන ඊට වඩා කිසියම් දිගුකාලයක් ලබා දිය හැකි නිදහස් කළ තැනැත්තාගේ සාධාරණ පාලනයෙන් බැහැර බවට කොමිෂන් සභාවට සෑහීමට පත් විය හැකි, හේතුවක ප්‍රතිඵලයක් ලෙස බෙදාහැරීමේ ව්‍යාපාරය මාස තුනක අඛණ්ඩ කාලයක් තුළ ක්‍රියාත්මක කිරීම නිදහස් කළ තැනැත්තා විසින් නැවතුවහොත් ;

(*f*) මෙම නිදහස් කිරීමේ නියෝගය නිකුත් කිරීම සඳහා පදනම් වී ඇත්තේ නිදහස් කළ තැනැත්තා විසින් සැලකිය යුතු තරම් සාවද්‍ය හෝ වැරදි තොරතුරු බවට සොයා ගැනුනහොත්.

(*g*) නිදහස් කළ තැනැත්තා විසින් මෙම නිදහස් කිරීමේ නියෝගයේ කිසියම් උල්ලංඝනය/කඩ කිරීමක් සිදු කළහොත්.

8 වන කොන්දේසිය : පරිසරය

1. අනුකූල විය යුතු පාරිසරික නීති යටතේ නිදහස් කළ තැනැත්තා වෙත ලබා දිය හැකි කිසියම් නිදහස් කිරීම් හෝ සහන කාලයන්ට යටත්ව, ශ්‍රී ලංකාවේ සියලු අදාළ පාරිසරික නීති රීතිවලට අනුකූල විය යුතුය.

2. නිදහස් කළ තැනැත්තා විසින්, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන දිනයට පසු නොවන දිනයක කොමිෂන් සභාව විමසා, අදාළ සියලු පාරිසරික නීති යටතේ වන එහි කාර්යයන් සහ බැඳීම් සමඟ අනුකූල වීමට නිදහස් කළ තැනැත්තා අදහස් කරන ආකාරය නිශ්චිතව දක්වමින් ලිඛිත ප්‍රතිපත්තියක් සකස් කිරීමට, සහ වරින් වර වෙනස් කිරීමට කටයුතු කළ යුතුය.

3. කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන ආකාරයට සහ කාල සීමාවන්හි සිය පාරිසරික කාර්යසාධනය පිළිබඳව නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.

4. මෙම නිදහස් කළ නියෝගයේ අරමුණු සඳහා, "පාරිසරික නීති" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරිසරය මත යැපෙන මිනිසුන්ගේ සෞඛ්‍යය, ශාක, සතුන් සහ පරිසර පද්ධතිද ඇතුළුව පරිසරයේ ආරක්ෂාව සඳහා, වරින් වර බලාත්මකව පවතින නීති වේ, සැකය මගහරවා ගැනීම සඳහා ඊට 1980 අංක 47 දරන ජාතික පරිසර පනත ඇතුළුව නමුත් එහෙත් ඊට සීමා නොවී පාරිසරික බලපෑම් ඇගයීම හා වායුගෝලය, ඉඩම් හා ජලය ආරක්ෂා කිරීම හා සම්බන්ධ සියලු අදාළ නීති සම්පාදන ඇතුළත් වේ.

9 වන කොන්දේසිය : සෞඛ්‍යය හා ආරක්ෂාව

1. පහත 2 ඡේදයෙහි දක්වා ඇති ආරක්ෂණ සහ තාක්ෂණික සැලැස්මක් පිළියෙළ කිරීම ඇතුළුව, බෙදාහැරීමේ ව්‍යාපාරය සිදු කර ගෙන යාමේදී නිදහස් කළ තැනැත්තා අතින් පුද්ගලයින්ට, යන්ත්‍රවලට, දේවලවලට සහ දේපළවලට සිදු වීමට ඉඩ ඇති තුවාල සහ හානිවලින් ආරක්ෂා කිරීමට නිදහස් කළ තැනැත්තා සියලු සාධාරණ පියවර ගත යුතුය.

2. නිදහස් කළ තැනැත්තා විසින් :

   (*a*) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන දිනයකට පසු නොවන දිනයක කොමිෂන් සභාව විමසා බලා, ආරක්ෂක තාක්ෂණික කළමනාකරණ සැලැස්මක් පිළියෙල කොට අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය ;

   (*b*) සැලැස්මේ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සහතික කිරීමට වාර්ෂිකව සමාලෝචනය කර, අවශ්‍ය වුවහොත් යාවත්කාල කර, එසේ යාවත්කාල කළ සැලැස්ම අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය ;

   (*c*) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිදි සැලැස්ම (කලින් කලට යාවත්කාල කර) හා අනුකූල විය යුතුය;

   (*d*) කොමිෂන් සභාවේ අනුමැතියක් නොමැතිව සැලැස්ම සංශෝධනය නොකළ යුතුය ; සහ

   (*e*) සැලැස්ම යටතේ එහි බැඳීම් හා එහි අනුකූලත්වය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සහ සැලැස්මට අනුකූලව ස්වාධීන විශේෂඥයකු ලවා වාර්ෂික විගණනයක් සිදු කෙරෙන බවට වග බලා ගැනීම ;

   (*f*) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇති සෞඛ්‍ය හා ආරක්ෂණ සංඛ්‍යාලේඛන සහ දර්ශක සංගෘහිත කිරීම ; සහ

   (*g*) එම විගණන, සංඛ්‍යාලේඛන සහ දර්ශකවල ප්‍රතිඵල ඉක්මණින් කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම.

10 වන කොන්දේසිය : රක්ෂණය

1. නිදහස් කළ තැනැත්තා බෙදාහැරීමේ ව්‍යාපාරය හා සම්බන්ධ අවදානම් කළමනාකරණය හා රක්ෂණය හා අදාළ සාධාරණ සහ දූරදර්ශී ප්‍රතිපත්ති අනුගමනය කර ක්‍රියාත්මක කරනු ඇත.

11 වන කොන්දේසිය : රහස්‍ය තොරතුරු

1. බෙදාහැරීමේ ව්‍යාපාරය පිළිබඳව තමා වෙත ලැබෙන සියලු තොරතුරු සම්බන්ධයෙන් පහත දෑ කිරීම සඳහා නිදහස් කළ තැනැත්තා වග බලා ගත යුතුය :

   (*a*) කොමිෂන් සභාව විසින් එසේ නොකිරීමට අවසර දී ඇති අවස්ථාවලදී හැර, නිදහස් කළ තැනැත්තා විසින් රහස්‍ය ලෙස තබා ගන්නා බවටත්, මෙම නිදහස් කිරීමේ නියෝගය හෝ වෙනත් පරිචය සංග්‍රහයක් සහ එම රහස්‍ය තොරතුරු වෙත ලබා දෙනුයේ ඒවායේ නිසි නිත්‍යානුකූල කාර්යයන් සිදු කිරීම සඳහා, නිදහස් කළ තැනැත්තාගේ අධ්‍යක්ෂවරුන්ට, නිලධාරීන්ට සහ සේවකයින්ට පමණක් බවටත්, එසේ නැතහොත් මෙම රහස්‍යතා අවශ්‍යතාව පිළිපැදීමට ලිඛිතව එකඟ වී සිටින නිදහස් කළ තැනැත්තන්ගේ නියෝජිතයින්ට පමණක් බවටත් ;

   (*b*) එම තොරතුරු ලබා දුන් අරමුණ හෝ මෙම නිදහස් කිරීමේ නියෝගයේ හෝ පරිචය සංග්‍රහයේ අවසර දී ඇති අරමුණක් සඳහා හැර වෙනත් අරමුණක් සඳහා නිදහස් කළ තැනැත්තා විසින් භාවිතා නොකරන බවට ; සහ

   (*c*) බෙදාහැරීමේ ව්‍යාපාරයේ සමන්විත වන සේවාවක් නොවන සේවාවක් සැපයීමේදී කිසියම් වාණිජ වාසියක් සඳහා නිදහස් කළ තැනැත්තා විසින් භාවිතා නොකරන බවට.

12 වන කොන්දේසිය : ආරවුල් විසඳීම

1. නිදහස් කළ තැනැත්තා විසින් :

(*a*) තමා සහ අයකුම පාරිභෝගිකයා අතර වන විසඳීමට නොහැකි අර්බුදයක් - ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද නීති අනුව සමථකරණය සහ විසඳීම සඳහා අර්බුදය කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය ;

(*b*) අර්බුදයක් (1) (*අ* ඡේදයෙන් විමර්ශනයට ලක් කරන ලද අර්බුදය නොවන වෙනත් අර්බුදයක්) - ශ්‍රී ලංකා මහජන උපයෝගීතා පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද නීති අනුව, එම නීතිය අනුව අර්බුදය විසඳීමට හෝ, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන අවස්ථාවක අර්බුදය උසාවියක් හෝ බේරුම්කරණ මණ්ඩලයක් වෙතයොමු කිරීමට එම අර්බුදය කොමිෂන් සභාව වෙත යොමු කෙරේ.

***III* කොටස බෙදාහැරීම සඳහා වන නිශ්චිත කොන්දේසි**

13 වන කොන්දේසිය : නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවය - නියමයන් ලබා දීම සඳහා වන අවශ්‍යතාව

1. නිදහස් කළ තැනැත්තා විසින් 3, 4 සහ 5 වන ඡේදයන්ට යටත්ව,

(*a*) නිදහස් කිරීමේ නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ස්ථානය තුළ පිහිටා ඇති, නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර ඇති, පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු සමඟ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් සැපයීමට ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම ; සහ

(*b*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් නවීකරණය කිරීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර ඇති කිසියම් තැනැත්තෙකු සමඟ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියෙන් සම්බන්ධතාවයක් වෙනස් කිරීම සඳහා ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම.

2. නිදහස් කළ තැනැත්තාට එම ඉදිරිපත් වීමේ නියමයන් සකස් කිරීම සඳහා සාධාරණ කාලයක් අවශ්‍ය වන බැවින්, නිදහස් කළ තැනැත්තා, 3, 4 සහ 5 වන ඡේදයන්ට යටත්ව, ප්‍රායෝගික වශයෙන් හැකි විගස, කිසිදු විටක, එම සියලු තොරතුරු ඇතුළත්ව අයදුම්පතක් ලැබීමෙන් සති දෙකකට නොඅඩු කාලයක් තුළ, 1 වන ඡේදය අනුව පැවරීමක් සඳහා නියමයන් ඉදරිපත් කරනු ලබයි

3. නිදහස් කළ තැනැත්තාට නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතියේ ධාරිතාව පුළුල් කිරීමට හෝ ශක්තිමත් කිරීමට අවශ්‍ය වන විට සහ එසේ නොවන විටක, සියලු තත්ත්වයන් සැලකිල්ලට ගෙන, නිදහස් කළ තැනැත්තා විසින් එම පුළුල් කිරීම හෝ ශක්තිමත් කිරීම සිදු කිරීම මහජන හිත සුව පිණිස වන විට මෙම කොන්දේසිය අනුව, නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ ධාරිතාවය සහ සිදු කරන ලද භාවිතය හෝ භාවිතා කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කිරීම යන හේතුව මත, නිදහස් කළ තැනැත්තා නිශ්චිතව දක්වන ලද පරිශ්‍රයක කිසියම් හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු සමඟ ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීමට බැඳී නොසිටී.

4. පුද්ගලයෙකු වෙත වන සම්බන්ධතාවය මගින් නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ ආරක්ෂාවට සහ ස්ථාවරත්වයට තර්ජනයක් ඇති කෙරෙන අවස්ථාවල, නිදහස් කළ තැනැත්තා මෙම කොන්දේසිය අනුව වෙනත් පුද්ගලයෙකු සමඟ ගිවිසුමකට එළඹීමට බැඳී නොසිටී

5. නිදහස් කළ තැනැත්තෙකු සම්බන්ධ වීමට ඉඩ ඇති විටක, නිදහස් කළ තැනැත්තා වෙනත් තැනැත්තෙකු සමඟ පහත ආකාරයෙන් ගිවිසුමකට නොඑළඹිය යුතුය :

(*a*) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාක්ෂණික හෝ මෙහෙයුම් සංග්‍රහ උල්ලංඝනය කරමින් හෝ

(*b*) පනත හෝ පනත යටතේ සිදු කරනු ලබන නියාමයන් උල්ලංඝනය කරමින්; හෝ

(*c*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතිය හා අදාළ වන ආරක්ෂාව හෝ ප්‍රමිතිය හා සම්බන්ධ කිසියම් නීති සම්පාදනයක් උල්ලංඝනය කරමින්; හෝ

(*d*) කොමිෂන් සභාව විසින් පනවන ලද වෙනත් කිසියම් කොන්දේසි උල්ලංඝනය කරමින්

6. 3, 4 සහ 5 වන ඡේද අනුව, නිදහස් කළ තැනැත්තා වෙනත් පුද්ගලයෙකු සමඟ ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, නිදහස් කළ පුද්ගලයා විසින් ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මන් අවස්ථාවක, කුමන තත්ත්වයකදී වුවත් නිදහස් කළ තැනැත්තා වෙත එම පුද්ගලයා වෙතින් අයදුම්පතක් ලැබී සති 2ක් නොඉක්මවන කාලයක් තුළ, ප්‍රතික්ෂේප කිරීම සඳහා වන හේතුව නිශ්චිතව දක්වමින්, එසේ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව දැනුම් දිය යුතුය.

14 වන කොන්දේසිය ඃ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත වන සම්බන්ධතාවය - කොමිෂන් සභාවේ කාර්යයන්

1. මෙම කාර්යය සඳහා කොමිෂන් සභාවට සාධාරණ යැයි හැඟෙන කාලයකට පසුව, 13 වන කොන්දේසිය අනුව අයදුම්පතක් ඉදිරිපත් කර හිමිකම් ලබා ඇති හෝ හිමිකම් ලබන බව කියා සිටින පුද්ගලයෙකු සමඟ ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීමට නිදහස් කළ තැනැත්තා අපොහොසත් වුවහොත්, කොමිෂන් සභාව, එම තැනැත්තාගේ හෝ නිදහස් කළ තැනැත්තාගේ ඉල්ලීමක් කළ පසුව, නිදහස් කළ තැනැත්තා සහ ප්‍රශ්නගත පුද්ගලයා අතර වන අර්බුදයේ ගිවිසුමෙහි කොන්දේසි කොමිෂන් සභාවට සාධාරණ යැයි පෙනී යන ආකාරයෙන් නියම කළ යුතුය.

2. කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ගිවිසුම මත පදනම්ව කටයුතු කිරීමට පුද්ගලයා අදහස් කරන්නේ නම්, නිදහස් කළ තැනැත්තා වහාම එහි නියමයන් අනුව ගිවිසුමක් වෙත එළඹී එය ක්‍රියාත්මක කරනු ලැබේ.

3. සම්බන්ධතාවය සඳහා, සම්බන්ධතාවයක් නවීකරණය සඳහා වන ගිවිසුමක කුමන පාර්ශ්වයක්, හෝ 13 වන කොන්දේසිය අනුව හෝ මෙම කොන්දේසිය අනුව නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියට ඇතුළත් වී ඇති පාර්ශ්වයක් එම ගිවිසුම යටතේ ප්‍රතිපාදන සලසා ඇති ආකාරයට එම ගිවිසුමේ කොන්ත්‍රාත්තුමය නියමයන්ගෙන් බැහැර වීමට අදහස් කරන්නේ නම්, කොමිෂන් සභාව විසින් නිදහස් කළ තැනැත්තාගේ හෝ එම ගිවිසුමේ අනෙක් පාර්ශ්වයේ ඉල්ලීම පරිදි එම බැහැර වීම හා සම්බන්ධ ආරවුල කොමිෂන් සභාවට සාධාරණ ලෙස හැඟී යන ආකාරයට විසඳනු ලැබේ.

15 වන කොන්දේසිය ඃ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවය ලබා දීමේදී වෙනස් කොට නොසැලකීම

1. නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධ වීමේ කාර්යය සඳහා වන වැඩ කටයුතු සිදු කර ගෙන යාමේදී නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධතාවයක් රඳවා ගැනීමක් ලබා දීමේදී, නිදහස් කළ තැනැත්තා පහත පුද්ගලයන් සම්බන්ධයෙන් අනිසි ලෙස වෙනස් ආකාරයෙන් නොසැලකිය යුතුය ඃ

(*a*) කිසියම් පුද්ගලයන් අතර හෝ පුද්ගල පංතියක් හෝ පංති අතර ;

(*b*) නිදහස් කළ තැනැත්තන් අතර හෝ නිදහස් කළ පුද්ගලයාගේ කිසියම් අනුබද්ධ හෝ ආශ්‍රිත ව්‍යාපාරයක් සහ කිසියම් පුද්ගලයෙකු, පුද්ගල පංතියක් හෝ පංති අතර.

16 වන කොන්දේසිය ඃ නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීම් පද්ධතිය වෙත ගාස්තු අය කිරීමේ පදනම

1. නිදහස් කළ තැනැත්තා, ප්‍රායෝගික වශයෙන් හැක් ඉක්මණින්, කුමන තත්ත්වයක වුවත් නිදහස් කිරීමේ නියෝගය බලාත්මක වී දින 28ක කාලයක් ඉක්මවීමට පෙර, නිදහස් කළ තැනැත්තාගේ පද්ධතිය වෙත වන සම්බන්ධතාව සඳහා පදනම් වූ ගාස්තු දක්වමින් ප්‍රකාශයක් සකස් කර, කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර, සම්බන්ධතාව සම්බන්ධයෙන් වන ආරක්ෂක තැන්පතු සඳහා වන ඉල්ලීම් සිදු කළ යුතුය.

2. නිදහස් කළ තැනැත්තා විසින්, කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන වරින් වර සකස් කර ඇති තොරතුර වරින් වර සංශෝධනය කර, 1 වන ඡේදය අනුව පිළියෙල කර ඇති ප්‍රකාශයේ ආකෘතිය වෙනස් කිරීම කළ යුතු අතර, අඩු වශයෙන් මෙම නිදහස් කිරීමේ ගිවිසුම බලාත්මකව ඇති සෑම වසරකම වරක්වත්, එම ප්‍රකාශයේ දක්වා ඇති තොරතුරු සියලුම වැදගත් කරුණු සම්බන්ධයෙන් අඛණ්ඩව නිවැරදිව දැක්වෙන ආකාරයට සංශෝධනය කළ යුතුය.

3. කිසියම් නිදහස් කළ තැනැත්තෙකු විසින් 1 වන උපලේඛනයේ විස්තර කර ඇති පරිශ්‍රය තුළ සිටින විදුලිබල සම්බන්ධතාවයක් ඉල්ලා ඇති තැනැත්තෙකුට සම්බන්ධතාවයක් ලබා දීමේදී, එම විදුලිබල සැපයුම ලබා දීමේදී වැය වූ වියදම්, එම වියදම් සාධාරණ ලෙස දරා ඇති ප්‍රමාණයක් දක්වා, එම තැනැත්තා විසින් දැරිය යුතු බවට නියම කිරීමට නිදහස් කළ තැනැත්තාට පුළුවන.

4. නිදහස් කළ තැනැත්තාට ලිඛිත දැනුම් දීමක් මගින් විදුලි සම්බන්ධතාවයක් අවශ්‍ය කිසියම් තැනැත්තෙකුගෙන්, විදුලිබලය සැපයීම හේතුවෙන් උපරිම වශයෙන් නිදහස් කළ තැනැත්තා වෙත ගෙවීමට සිදු වන මාස දෙකක විදුලි පාරිභෝජන බිල්පත්වලට සමාන ගෙවීම් සාධාරණ ඇප තැන්පතුවක් ලෙස ලබා දෙන ලෙස නියම කළ හැකිය.

මෙම කොන්දේසිය නියම කර ඇති පරිදි කිසියම් පුද්ගලයෙකු එවැනි තැන්පතුවක් සපයා නොමැති විටක හෝ එම පුද්ගලයා විසින් සපයා දී ඇති ඇප තැන්පතුව ප්‍රමාණවත් නොවන විට -

(*a*) නිදහස් කළ තැනැත්තාට දැනුම් දීම සිදු කර දින 7ක් තුළ, විදුලිබලය සැපයීම හේතුවෙන් උපරිම වශයෙන් නිදහස් කළ තැනැත්තා වෙත ගෙවීමට සිදු වන මාස දෙකක විදුලි පාරිභෝජන බිල්පත් සමාන ගෙවීමක් සාධාරණ ඇප තැන්පතුවක් ලෙස ලබා දෙන ලෙස නියම කළ හැකිය ; සහ

(*b*) එම තැනැත්තා එවැනි තැන්පතුවක් ලබා දීමට අපොහොසත් වන්නේ නම්, නිදහස් කළ තැනැත්තාට, අදාළ වන පරිදි සම්බන්ධතාවය ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හෝ සැපයුම විසන්ධි කිරීම සිදු කළ හැකිය.

(*c*) මෙම කොන්දේසිය අනුව ඇප තැන්පතුවක් ලෙස නිදහස් කළ තැනැත්තා වෙත කිසියම් මුදලක් ලබා දී ඇති විටක, එම මුදල වෙනුවෙන් කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ, එම මුදල නිදහස් කළ තැනැත්තා වෙත පවතින තාක්, නිදහස් කළ තැනැත්තා විසින් වරින් වර නියම කරනු ලබන අනුපාතයක් යටතේ පොළී ගෙවිය යුතුය.

5. නිදහස් කළ තැනැත්තා විසින් 1 වන ඡේදය අනුව පිළියෙල කරන ලද ප්‍රකාශයේ පිටපතක් සහ 2 වන ඡේදය අනුව එම ප්‍රකාශය සම්බන්ධයෙන් වන එක් එක් සංශෝධනයක් කොමිෂන් සභාව වෙත එවිය යුතුය. එම එක් එක් සංශෝධනයක් සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය අවශ්‍ය වන අතර කොමිෂන් සභාව අනුමත කරන තෙක් බලාත්මක නොවේ.

6. නිදහස් කළ තැනැත්තා විසින්, 1 වන ඡේදය අනුව පිළියෙල කළ ප්‍රකාශයේ පිටපතක් හෝ (අදාළ පරිදි) 2 වන ඡේදය අනුව පිළියෙල කළ එම ප්‍රකාශයේ අලුත්ම සංශෝධනයක් එම ඡේද යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කර, එම ප්‍රකාශයේ පිටපතක් ඉල්ලා සිටි තැනැත්තා වෙත ලබා දීම හෝ යැවීම කළ යුතුය.

7. නිදහස් කළ තැනැත්තා විසින් 4 වන ඡේදය අනුව ලබා දෙන හෝ යවන කිසියම් ප්‍රකාශනයක් සඳහා, එසේ ප්‍රකාශයක් ලබා දීම සඳහා නිදහස් කළ තැනැත්තාට වැය වන සාධාරණ වියදම් පිළිබිඹු වන සහ මෙම කොන්දේසියේ අරමුණ වෙනුවෙන් කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන නියෝගයන්හි නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණය නොඉක්මවන කිසියම් ගාස්තුවක් අය කිරීමට කටයුතු කරනු ලැබේ.

17 වන කොන්දේසිය : සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට සහ අනෙකුත් බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ට තොරතුරු සැපයීම

1. නිදහස් කළ තැනැත්තා විසින්, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගෙන් සිය අනාගත බලශක්ති අවශ්‍යතා පිළිබඳ පුරෝකථනය කිරීමට ප්‍රමාණවත් වාර්තා සහ පහත දැක්වෙන දෑ සම්බන්ධ විස්තරද ඇතුළුව, එම අවශ්‍යතාවයේ ඉල්ලුම් පැතිකඩක් පවත්වා ගත යුතුය :

(*a*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියේ තාක්ෂණික සහ තාක්ෂණික නොවන හානි ;

(*b*) නිදහස් කළ තැනැත්තාගේ බෙදාහැරීමේ පද්ධතියට සම්බන්ධ කර ඇති ජෙනරේටර් (ඇත්නම්) මගින් සපයනු ලබන බලශක්තිය ;

(*c*) නව සම්බන්ධතාවල බලපෑම ; සහ

(*d*) ඉල්ලුම් කළමනාකරණයේ බලපෑම.

(*e*) විවිධ පාරිභෝගික කාණ්ඩවල ධාරා චරිතාංග

2. සමස්ත පද්ධතියේ ආරක්ෂිත සහ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වයක්, සම්බන්ධීකෘත සංවර්ධනයක් සහ අන්තර් ක්‍රියාකාරීත්වයක් සහතික කිරීමට නිදහස් කළ තැනැත්තා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට සහ අනෙක් බෙදාහැරීම් බලපත්‍රලාභීන්ට, සාධාරණ වශයෙන් අවශ්‍ය වන ආකාරයෙන් සහ අවශ්‍ය අවස්ථාවන්හිදී, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා සහ අනෙක් බෙදාහැරීම් බලපත්‍රලාභීන් විසින් සාධාරණ වශයෙන් ඉල්ලා සිටින එම තොරතුරු සහ පුරෝකථන ඉදිරිපත් කළ යුතුය.

3. මෙම කොන්දේසිය තුළ :

"සමස්ත පද්ධතිය" යනු සියලු අනෙකුත් බෙදාහැරීම් බලපත්‍රලාභීන්ගේ සම්ප්‍රේෂණ පද්ධතිය, බලපත්‍රලාභියාගේ බෙදාහැරීමේ පද්ධති සහ බෙදාහැරීම් පද්ධතිවල සමස්තය වේ.

***IV* වන කොටස : සැපයීම සඳහා වන නිශ්චිත කොන්දේසි**

18 වන කොන්දේසිය : සැපයීමේදී වෙනස් කර සැලකීම තහනම් කිරීම

1. නිදහස් කළ තැනැත්තා, පාරිභෝගිකයින් වෙත විදුලිය සැපයීම සඳහා නියමයන් ඉදිරිපත් කිරීමේදී :

(*a*) කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට අනිසි විශේෂත්වයක් දැක්වීම;

(*b*) කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට අනිසි විශේෂත්වයක් ක්‍රියාවෙන් සිදු කිරීම; හෝ

(*c*) අනවශ්‍ය ලෙස දුෂ්කර නියමයන් පැනවීම.

2. මෙම කොන්දේසියේ අරමුණු සඳහා, පාරිභෝගිකයින් වෙත විදුලිය සැපයීමෙන් ලැබෙන ආදායම, එම විදුලිය සැපයීම සඳහා වන වියදමට වඩා සැලකිය යුතු ලෙස ඉහළ නම්, එම නියමයන් අනවශ්‍ය ලෙස දුෂ්කර වේ.

3. මෙම කොන්දේසියේ අරමුණ සඳහා, ප්‍රශ්නගත පාරිභෝගිකයින් වෙත විදුලිය සැපයීමේදී වැය වන වියදම් සාධාරණ ලෙස ආවරණය නොවන ගාස්තු හා එම කොන්දේසි සම්බන්ධ වේද යන්න පිළිබඳව නිසි ලෙස සලකා බලා, එම නියමයක් අනවශ්‍ය ලෙස දුෂ්කරදැයි යන ප්‍රශ්නය පිළිබඳව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

4. මෙම කොන්දේසියේ ඃ

"නියමයන්" යනු විදුලිය සැපයීමේ ඇගයීමට සැලකිය යුතු ලෙස බලපාන මිල සම්බන්ධයෙන් වන නියමයන්ද ඇතුළුව, විදුලිය සැපයුම ඉදිරිපත් කරන හෝ ලබා දෙන නියමයන් වේ.

19 වන කොන්දේසිය ඃ අයකුම ලේඛනය සැපයීම

1. නිදහස් කළ තැනැත්තා, මෙම නියෝගය බලාත්මක වී ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මණින්, කිසිදු හේතුවක් මත, මෙම වගන්තියේ අරමුණ වෙනුවෙන් නිදහස් කළ තැනැත්තා වෙත නිකුත් කරන ලද නියෝගයන්හි කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන දිනකට පසු නොවන දිනයක හෝ ඉන් පසුව වරින් වර, විදුලි පාරිභෝගිකයින් සඳහා විදුලිය අලෙවි කරනු ලබන අයකුම ලේඛනයක් පිළියෙල කළ යුතුය.

2. අයකුම ලේඛනයක් ඃ

(*a*) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආකෘතියෙන් තිබිය යුතුය ;

(*b*) කිසියම් පාරිභෝගිකයෙකුට විදුලිය මිලදී ගැනීම සඳහා ගෙවිය යුතු ගාස්තුවල සාධාරණ ඇස්තමේන්තුවක් සාදා ගැනීමට හැකි වන අවශ්‍ය වන විස්තර සහිත විය යුතුය ;

(*c*) වසරේ, දවසේ හෝ සතියේ නියමිත කාල සීමාවල සහ දහවල් හා රාත්‍රී කාලයන්හි විදුලිය සැපයීමේදී නිදහස් කළ තැනැත්තා දරන වියදම් පිළිබිඹු වන බවට කොමිෂන් සභාව විසින් අනුමත කරන ක්‍රමවේදයක් අනුව සහ කාර්යක්ෂම ආකාරයෙන් මෙම නිදහස් කිරීමේ නියෝගයෙන් බලය ලබා දී ඇති ක්‍රියාකාරකම් ඉටු කිරීමේදී සාධාරණ ලෙස වැය වන සියලු වියදම් අය කර ගැනීමට නිදහස් කළ පුද්ගලයාට අවසර ලබා දෙන පරිදි සකස් වී තිබිය යුතුය ; සහ

(*d*) පහත දැ වෙන වෙනම හඳුනාගත යුතුය ඃ

(*a*) නිදහස් කළ තැනැත්තාගේ විදුලිය මිලට ගැනීමේ පිරිවැය

(*b*) පොරොත්තු හෝ හදිසි ජෙනරේටර්වල මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය

(*c*) බෙදාහැරීමේ පද්ධති මෙහෙයුම් හා කළමනාකරණ නඩත්තු ගාස්තුව

3. නිදහස් කළ තැනැත්තා විසින් නියම කරනු ලබන එවැනි අයකුම සංකීර්ණ වීම හේතුවෙන්, සරල පැහැදිලි කිරීමේ ප්‍රකාශ අවශ්‍ය බවට කොමිෂන් සභාවට හැඟුනහොත්, පාරිභෝගිකයින්හට පහසුවෙන් අවබෝධ කර ගැනීමට සුදුසු පරිදි, නිදහස් කළ තැනැත්තාට එකී පැහැදිලි කිරීමේ ප්‍රකශ පිළියෙල කරන ලෙසත් ඉන් පසුව ඒවා අයකුම ලේඛනයේ පළ කරන ලෙසත් නියම කිරීමට කොමිෂන් සභාවට පුළුවන.

4. නිදහස් කළ තැනැත්තා කොමිෂන්සභාව වෙතින් සැපයුම් අයකුම ලේඛනය සඳහා අනුමැතිය ලබා ගත යුතුය.

5. වෙනත් කිසියම් තැනැත්තෙකු වෙත ලබා දීමට දින 14කට වඩා නොවැඩි කාලයක් තුළ, නිදහස් කළ තැනැත්තා අයකුම ලේඛනවල පිටපතක් (වරින් වර සංශෝධනයට ලක් කරනු ලබන පරිදි) කොමිෂන් සභාව වෙත ලබා දීම හෝ යැවීම සිදු කළ යුතුය.

6. කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන පරිදි නිදහස් කළ තැනැත්තා අයකුම ලේඛනය ප්‍රකාශයට පත් කළ යුතුය.

7. නිදහස් කළ තැනැත්තා (8 වන ඡේදයට යටත්ව) අයකුම ලේඛනයේ සහ කිසියම් පැහැදිලි කිරීමේ ප්‍රකාශනයේ) වරින් වර සංශෝධනයට ලක් කරනු ලබන පරිදි) පිටපතක් එවැන්නක් ඉල්ලා සිටින ඕනෑම තැනැත්තෙකු වෙත ලබා දීම හෝ යැවීම සිදු කළ යුතුය.

8. නිදහස් කළ තැනැත්තා, 7 වන ඡේදය අනුව ලබා දුන් හෝ යවන ලද අයකුම ලේඛනයේ ඕනෑම පිටපතක් සඳහා සහ කිසියම් පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් (වරින්වර සංශෝධනය කරන ලද) සඳහා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝගයන්හි මෙම වගන්තියේ අරමුණ වෙනුවෙන් අදාළ කාලය තුළ නිශ්චිතව දක්වා ඇති මුදල නොඉක්මවන ගාස්තුවක් අය කරනු ලැබේ.

9. නියෝගවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට, හෝ නියෝගවල දක්වා ඇති අරමුණු ඉටු කර ගත හැකි ආකාරයට, නිදහස් කළ තැනැත්තා වරින් වර අයකුම ලේඛනය වෙනස් කළ යුතු බවට, නියම කරමින් කොමිෂන් සභාව විසින් නිදහස් කළ තැනැත්තා වෙත නියෝග ලබා දෙන අතර නිදහස් කළ තැනැත්තා එවැනි නියෝගයන් හා වහාම අනුකූල විය යුතුය.

10. අයකුමලේඛනය සමාලෝචනය කිරීම සඳහා වන ක්‍රියාමාර්ගයක් කොමිෂන් සභාව නිර්දේශ කළ යුතුය.

20 වන කොන්දේසිය ඃ අයකුම ගිවිසුම බෙදාහැරීම සහ සැපයීම

1. නිදහස් කළ තැනැත්තා විදුලි පාරිභෝගිකයෙකු සමග හෝ විදුලිබල පාරිභෝගිකයෙකු වීමට අපේක්ෂා කරන තැනැත්තෙකු සමග ගිවිසුමකට එළඹීමට (පහත 3 වන ඡේදයට සහ 14 වන කොන්දේසියට යටත්ව) ඉදිරිපත් වනු ඇති අතර, එම විදුලිය අලෙවි කිරීම හා සම්බන්ධයෙන් අය කළ යුතු ගාස්තු සඳහා වන විධිවිධාන සැලසීම සහ ඉහත 19 වන කොන්දේසියෙහි තීරණය කරනු ලබන අයකුම ලේඛනයෙන් පරිශීලනය ලබා දී ඇති ආකාරයට ඉදිරිපත් කළ යුතුය.

2. ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මණින්, කුමන තත්ත්වයේ වුවත් අර්පනයේ නියමයන් සැකසීම සඳහා නිදහස් කළ තැනැත්තා විසින් සාධාරණ ලෙස ඉල්ලා සිටින එම සියලු තොරතුරු සහිත අයදුම්පතක් නිදහස් කළ තැනැත්තා වෙත ලැබී සති 02කට නොවැඩි කාලයක් තුළ, නිදහස් කළ තැනැත්තා ගිවිසුම සඳහා වන නියමයන් ඉදිරිපත් කළ යුතුය.

3. නිදහස් කළ තැනැත්තා කිසියම් ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වීම තුළ නිදහස් කළ තැනැත්තෙකු සම්බන්ධ වේ නම් මෙම කොන්දේසියෙන් බැඳී නොසිටී :

(*a*) පනත යටතේ වන කාර්යයන් උල්ලංඝනය වන ආකාරයෙන් ;

(*b*) පනත යටතේ හෝ බෙදාහැරීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් වන ආරක්ෂාව හා ප්‍රමිතිය සම්බන්ධ වෙනත් කිසියම් නීති පැනවීමක් යටතේ සාදන ලද කිසියම් රෙගුලාසි උල්ලංඝනය වන ආකාරයෙන් ;

(*c*) මෙම නිදහස් කිරීමේ නියෝගය උල්ලංඝනය වන ආකාරයෙන් ; හෝ

(*d*) කිසියම් අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සාර සංග්‍රහ උල්ලංඝනය වන ආකාරයෙන්.

4. මෙම කොන්දේසිය යටතේ ගිවිසුමකට එළඹීම සඳහා නිදහස් කළ තැනැත්තෙකු සතු බැඳීම 25 වන කොන්දේසිය අනුව එළඹෙන සම්බන්ධතා ගිවිසුමට සුදුසු පරිදි වගන්ති ඇතුල් කිරීමෙන් ඉටු කර ගත හැකි වේ.

21 වන කොන්දේසිය - පරිශ්‍රයන් තුළට ඇතුළු වීම

1. මෙම නිදහස් කිරීමේ නියෝගය යටතේ කිසියම් පරිශ්‍රයකට ඇතුළු වීමේදී ඒ බව නිදහස් කළ තැනැත්තා හෝ නිදහස් කළ තැනැත්තා විසින් බලය දී ඇති තැනැත්තෙකු විසින් දැනුම් දිය යුතු අතර පහත අවස්ථාවන් සපුරා නැති නම් එසේ කිරීමට ඉල්ලා සිටීමට හෝ අයිතියක් ලෙස සලකා ඇතුළුවීමට නොහැක -

(i) නිදහස් කළ තැනැත්තාගේ බලයලත් නිලධාරියා විසින් හෝ නිදහස් කළ තැනැත්තා විසින් සිදු කිරීමට අදහස් කරන කටයුතුවල ස්වභාවය සහ ප්‍රමාණය දක්වමින් කිසියම් පරිශ්‍රයකට ඇතුළුවීමට දින තුනකට පෙර දැනුම් දී තිබීම ;

(ii) අවශ්‍ය වුවහොත්, ඔහු හෝ ඇය ඔහුගේ හෝ ඇයගේ බලය පිළිබඳ සාක්ෂි සපයා තිබීම ;

(iii) මෙම ඇතුළුවීම හේතුවෙන් ඉඩමට හෝ පරිශ්‍රයට කිසියම් බාධා කිරීමක්, අක්‍රිය කිරීමක, හානියක් සිදු වේ නම් එහි හිමිකරුට ඒ සඳහා සාධාරණ වන්දි මුදලක් ගෙවා තිබීම.

2. නිදහස් කළ තැනැත්තා හෝ තමා වෙනුවෙන් නිදහස් කළ තැනැත්තා විසින් ලිඛිතව බලය පවරා ඇති තැනැත්තෙකු, (1) (අ) ඡේදයෙහි විස්තර කර ඇති පරිදි දැනුම් දීමක් ලබා දීමේ අරමුණ සඳහා ඉඩමට ඇතුළු වීම සඳහා හිමිකම් ලබයි.

3. මෙම අයිතමය යටතේ පැවරී ඇති කිසියම් බලතලයක් ක්‍රියාවේ යෙදවීමේදී, නිදහස් කළ තැනැත්තා විසින් ලිඛිතව බලය ලබා දී ඇති තැනැත්තා ලවා එසේ ඇතුළුවීමේදී පරිශ්‍රයට සිදු වන හානිය සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කළ යුතුය.

4. මෙම නිදහස් කිරීමේ නියෝගය අනුව හෝ යටතේ පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීමේදී, පරිශ්‍රයට හෝ කිසියම් චංචල දේපළකට හානියක් සිදු වුවහොත්, අදාළ පරිශ්‍රයේ හෝ චංචල දේපලවල භාරකරුට ක්‍රියාවේ යොදවන ලබන බලය සහිත නිදහස් කළ තැනැත්තාගෙන් එම හානි සම්බන්ධයෙන් වන්දි මුදලක් ලබා ගත හැකිය ; එසේම එම බලය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කිසියම් තැනැත්තෙකුට සිය පරිශ්‍රය හෝ චංචල දේපළ භුක්ති විඳීමට බාධා පැමිණේ නම් ඔහුට හො ඇයට එම බාධා කිරීම වෙනුවෙන් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි නිදහස් කළ තැනැත්තාගෙන් සාධාරණ වන්දියක් ලබා ගත හැකිය.

*උපලේඛනය 1*

2002.09.06 දිනැති නගර සිතියම් අංක පී. එම්. එච්. ඩී. 28/08/98 අනුව සාදන ලද බුත්තල, පැල්වත්ත ලිපිනයේ පිහිටා ඇති පරිශ්‍රය.

05-626/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.